ISSN 1391 - 1031
2012 පෙබරවාරි
17 වෙළුම 11 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

''මුළු ලෝකය සෑම තැන්හිම ධනපති ක්‍රමය දැවැන්ත විප්ලවීය අර්බුදයක් අත් දකිමින් සිටිති. මෙම අර්බුදය සාර්ථක, ජයග්‍රාහී විප්ලවයක් සඳහා උපයෝගී කර ගැනීමට තරම් ප්‍රමාණවත් අවබෝධයක් හා සංවිධානයක්ද, සූරාකනු ලබන පොදු ජනතාව සමඟ සම්බන්ධකම්ද, අධිෂ්ඨානයද, දක්ෂකම්ද, තමන්ට ඇතැයි යන්න විප්ලවාදී පක්ෂ දැන් ව්‍යවහාරිකව ඔප්පු කළ යුතුවේ.''


ලෙනින්
තෝරාගත් කෘති-11වෙළුම, 42 පිටුව

## 3 ඩිවොලූෂන්



ජාතික ප්‍රශ්නයට සැබෑ විසදුම ඇත්තේ, බලය බෙදීම හෙවත් 'ඩිවොලූෂන්' තුළ නොව සමාජ විප්ලවය හෙවත් 'රිවොලූෂන්' තුළය. එබැවින් ධනපති පංතියේ 'ඩිවොලූෂන්'වලට එරෙහිව නිර්ධන පංතියේ සටන්....

## 4 තරුණ



''විද්‍යාව'' හැමවිටම සාපේක්ෂ වන්නේය. එබැවින් පවතින විද්‍යා දැනුමෙන් විස්තර කළ නොහැකි කොටසක් හැම විටම ඉතිරි වීම ස්වභාවිකය. එවිට විඥානවාදී මත ඒ තැන්වලට කඩා වැදී ...

## 5 සංවාදය



අර්බුද හමුවේ රාජපක්‍ෂ පාලනයට ඉතිරිව ඇත්තේ, තවදුරටත් සහන හා සේවා කප්පාදු කරන, අධිරාජ්‍යවාදයට ආර්ථිකයේ සාරය උරාබීමට ඉඩ සකසන, ස්වාභාවික සම්පත් බහුජාතික සමාගම් වෙත පවරන නව ලිබරල් ධනවාදයේ...

## 8 කලාවට නිර්වචනයක් සොයා



මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ, කලාව හෙවත් සෞන්දර්ය පවතින්නේ, භෞතික වස්තූන් තුළ නොව මිනිස් මනසේ...

## 9 කැටය කඩා සූදු කෙළීම



අද කප්පාදු වන්නේ, අර්ථසාධකය නම් හෙට කප්පාදු වන්නේ, තමන් දැනට ලබන සොච්චම් වැටුප විය හැකිය. යුරෝපය ග්‍රීසිය පුරා වැඩ කරන ජනතාව අද වීදි බැස ඇත්තේ, එවැනි...

මතවාද....................07
දැනුම .................... 10
කාලීන......................11
කාන්තා...................12
ජාත්‍යන්තර..............13
විශේෂාංග...............14




2012 ජනවාරි 01 වැනි දින තිස්සමහාරාමය දෙබරවැව පොදු ක්‍රීඩාංගණයේ මුළු දුන් ජ.වි.පෙ. විශේෂ සමුළුවට පෙර නියමුවා කැමරා ඇසට හසු වූ දසුනකි.

# සර්වපාක්ෂික සාකච්ඡා ප්‍රෝඩාව යළිත්!


**ජාතික ගැටලුවට විසඳුම් සෙවීම සඳහා සර්වපාක්ෂික සාකච්ඡා ඇරඹීමට තමන් සූදානම් බව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පසුගිය 30 දින මාධ්‍ය ප්‍රධානීන් හමුවේ ප්‍රකාශ කර තිබේ. මෙය මහින්ද රාජපක්ෂ ආණ්ඩුව නැවත වරක් සාකච්ඡා ප්‍රෝඩාවක නිරත වෙමින් ප්‍රශ්න මඟහැර යාමේ සුපුරුදු පිළිවෙතට මාරු වීමක් බව දේශපාලන අංශවල අදහසයි.**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ සැසිවාරය ඇ ස්වීමට නියමිතව තිබියදී ජාතික ගැටලුව විසඳීමේ ක්‍රියාවලියක තමන් නිරතව සිටින බව පෙන්වාලීමට රාජපක්ෂ ආණ්ඩුවට අවශ්‍යය. පසුගියදා උගත් පාඩම් හා සංහිඳියා කොමිසමේ වාර්තාව එළිදැක්වූ ආණ්ඩුව ඉන් අපේක්ෂිත අවධානය දිනාගැනීමට නොහැකි වූ බැවින් එය පසෙක තැබීය. උතුර හා නැගෙනහිර අර්බුදයට විසඳුම් සෙවීම සඳහා යැයි කියමින් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක්ද පසුගියදා ආණ්ඩුව විසින් පිහිටවූ අතර විපක්ෂය විසින් එය වර්ජනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවිණි. ඉන්දීය විදේශ අමාත්‍ය එස්.එම්. ක්‍රිෂ්ණා මහතා පසුගිය 16වැනිදා ලංකාවට පැමිණි අතර නැවතත් 13වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පදනම් කරගනිමින් ඉන් ඔබ්බට යෑමට තමන් සූදානම් බව ජනාධිපතිවරයා ඔහුට අවධාරණය කර තිබිණි. ජනාධිපතිවරයාගේ මෙම සූදානම, ඉන්දීය විදේශ අමාත්‍යවරයා 17වැනි දින පැවැති මාධ්‍ය හමුවේදී රටට හෙළි කළේය.

දේශප්‍රේමී මුහුණුවරක් රටට පෙන්වමින් සිටි රාජපක්ෂ ආණ්ඩුවේ දෙබිඩි පිළිවෙත ඉන්දීය විදේශ නියෝජිතයෙක් මගින් රටට හෙළිවීමෙන් ආණ්ඩුව දැඩි අපහසුතාවයට පත්වූ අතර කැබිනට් ප්‍රකාශක කෙහෙළිය රඹුක්වැල්ල අමාත්‍යවරයා, ආණ්ඩුව සෙනෙට් සභාවක් පිහිටුවීමට යන බව කියමින් ඉදිරිපත් වූ ප්‍රශ්නයකින් ඇඟ බේරාගත්තේය. නමුත් ඒ පිළිබඳව හෝ ජාතික ගැටලුව විසඳීම අරභයා ආණ්ඩුවේ යෝජනා පිළිබඳ නිශ්චිත අදහසක් පළ කිරීමට ඔහුද අසමත් විය.

පසුගියදා ජනමාධ්‍ය ප්‍රධානීන් හමුවූ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා තමන් 13න් ඔබ්බට යන බවට පොරොන්දු නොවූ බවත් සිදුකළේ, 13 ඔබ්බට යන යෝජනා සාකච්ඡා කිරීම පමණක් බවත් කියා තිබිණි. වැඩිදුරටත් අදහස් දක්වීමේදී, ජාතික ගැටලුව විසඳීමට පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂවලින් සමන්විත සර්වපාක්ෂික සමුළුවක් කැඳවීමට තමන් අදහස් කරන බවද ඔහු ප්‍රකාශ කළේය.

ඉතිරි - 2 පිටුවට



# වැඩ බිම

## පවුල් සෞඛ්‍ය සේවාවත් සටන් මගට



පවුල් සෞඛ්‍ය සේවාව තුළ මේ වන විට ගැටලු රැසක් උද්ගතවී ඇති අතර ඒ නිසා පවුල් සෞඛ්‍ය නිලධාරිනියන් තම වෘත්තීය කරගෙන යාමේදී දැඩි අසීරුතාවයකට මුහුණ දී සිටින බවත් මේ තත්වය තුළ තම වෘත්තියට අදාල ඉල්ලීම් 11 ක් මුල්කර ගනිමින් ජනවාරි මස 25 දින රට පුරා සිටින සියලු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ සහභාගිත්වයෙන් කොළඹදී දැවැන්ත උද්සෝෂණයක් පැවති බවත් වාර්තා වේ. සමස්ත ලංකා සුව සේවා සංගමය විසින් සංවිධානය කරන ලද මෙම උද්සෝෂණ පාගමනේදී සෞඛ්‍ය අමාත්‍යාංශයට ගොස් සිය ඉල්ලීම් ඇතුළත් ලිපියක් සෞඛ්‍ය ඇමතිවරයාට භාර දෙන ලද බව එම සංගමයේ ප්‍රධාන ලේකම් ගාමිණී කුමාරසිංහ සහෝදරයා ප්‍රකාශ කළේය.

## ප්‍රවාහන සේවක සංවත්සරය ඉහළින්



සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය 14 වන සංවත්සරය පසුගිය 19 දින පෙරවරුවේ නාරාහේන්පිට ශාලිකා රැස්වීම් ශාලාවේදී පැවැති බව වාර්තා වේ.

විශාල සාමාජික පිරිසකගේ සහභාගිත්වයෙන් පැවති මෙම සංවත්සර සභාවේ ආරාධිත දේශනය පවත්වන ලද්දේ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාය. නව නිලධාරී මණ්ඩලය තෝරා පත් කර ගැනීමේදී හිටපු ප්‍රධාන ලේකම් සේපාල ලියනගේ සහෝදරයා නැවත එම තනතුර සඳහා ඒකච්ඡන්දෙයන් පත්ව ඇති අතර එහි සභාපති ලෙස කාලිංග ධර්මසේන සහේදරයාද භාණ්ඩාගාරික ලෙස සේනාධීර සහෝදරයාද තේරී පත්ව තිබේ.

## විදුලි සේවක සංවත්සරයට විශාල සාමාජික පිරිසක්



ලංකා විදුලි සේවක සංගමයේ 10 වන සංවත්සරය පසුගිය 13දා කොළඹ මහජන පුස්තකාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර ඒ සඳහා උතුරු නැගෙනහිර ඇතුළු දිවයිනේ සියලුම පළාත්වලින් අති විශාල සාමාජික පිරිසක් සහභාගි වී සිටියහ.

මෙම සංවත්සර සමුළුවේ ප්‍රධාන ආරාධිත දේශනය ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලාල්කාන්ත සහෝදරයා විසින් පවත්වන ලද අතර ලංකා විදුලි සේවක සංගමයේ නව සභාපති ලෙස නැවත වරක් හිටපු සභාපති රංජන් ජයලාල් සහෝදරයා ඒකච්ඡන්දයෙන් තේරී පත්ව තිබේ.

විදුලි සේවක සටනක් ඇරඹී තිබෙන මෙවන් මොහොතක මෙවැනි සංවත්සරයක් පැවැත්වීම සුවිශේෂී බවත් එය ඉදිරියට ඇදෙමින් තිබෙන විදුලි ඇතුළු තෙල්, ජල සේවක සටන්වලටද දැවැන්ත උත්තේජනයක් හා ශක්තියක් සපයන්නක් බවත් ලාල්කාන්ත සහෝදරයා මෙහිදී කියා සිටියේය. ඛණිජ තෙල්, ජල, වරාය ඇතුළු තවත් ක්ෂේත්‍ර ගණනාවක වෘත්තීය සමිතිවල නියෝජිතයෝද සමුළුවට සුභපැතුම් එක්කළහ.

## විකෘති ප්‍රතිඵලයට එරෙහි උද්ඝෝෂණ ඉදිරියට




මෙවර අ.පො.ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී හඳුන්වාදුන් පැරණි හා නව නිර්දේශ අනුව හඳුන්වා දුන් නිවැරදි නොවන ක්‍රමවේදය හා ඒ නිසා විභාග ප්‍රතිඵලවල ඇති වී තිබෙන විකෘතිවීම් වහාම නිවැරදි කරන ලෙසට බලකරමින් ලංකා ගුරු සේවා සංගමය හා පාසල් සුරැකීමේ ජනතා ව්‍යාපාරය එක්ව ජනවාරි 24 දහවල් පැලවත්තේ පිහිටි විභාග දෙපාර්තමේන්තුව ඉදිරිපිට උද්සෝෂණයක් සංවිධානය කරන ලදී.

මෙවර උසස්පෙළ විභාග ප්‍රතිඵල අවුල විසඳීමට පත් කළ විද්වත් කමිටුවද සිසු මව්පිය විශ්වාසය බිඳ දමා ඇති බවත් ඔවුන් ප්‍රශ්නයට උත්තර සෙවීම පසෙක තබා එය තව තවත් අවුල් කර ඇති බවත් පෙන්වා දෙන ලංකා ගුරු සේවා සංගමය ප්‍රශ්නය යට ගැසීමට ආණ්ඩුව හා අධ්‍යාපන බලධාරීන් ගන්නා පහත් උත්සාහයට තමන් දැඩි ලෙස විරෝධය දක්වන බවත් ඊට එරෙහිව දිගින් දිගටම ක්‍රියාමාර්ග ගන්නා බවත් ප්‍රකාශ කර සිටී.

ලක්ෂ 3 කට ආසන්න සිසු දරුවන්ට සිදුවී ඇති මෙම බලවත් අසාධාරණයට විරුද්ධව මව්පියන් ඇතුළු රටේ ප්‍රගතිශීලී ජනයාද නැගී සිටිය යුතු බව පෙන්වා දෙන ලංකා ගුරු සේවා සංගමය ඒ සඳහා තමන් සමග පෙළගැසෙන ලෙස ඉල්ලා සිටී.

පුවත්

# සරසවි සිසු දිවිය මඩින - ආණ්ඩුවේ තැත පිළිකුල්

## ජනතා විමුක්ති පෙරමුණ

ආණ්ඩුවේ දේශපාලන අතපෙවීම් හා නොහැකියාව හේතුවෙන් පැන නැගි සිසු ගැටලු මර්දනය කිරීම සඳහා මර්දනය යොදාගැනීම හෙළා දකිමින් ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය විසින් පසුගිය 09වැනි දින මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය. එය සම්පූර්ණයෙන් මෙසේය.

මේ වනවිට රාජපක්ෂ ආණ්ඩුව අවුල් කරමින් සිටින ක්ෂේත්‍ර අතර අධ්‍යාපනයට හිමිවන්නේ, ප්‍රමුඛස්ථානයකි. ශ්‍රී ජයවර්ධනපුර, රජරට යන විශ්වවිද්‍යාල ප්‍රමුඛව සෙසු සරසවිවලද බරපතළ අර්බුද නිර්මාණය කරමින් තිබේ. මේ අර්බුද විසඳීම වෙනුවට ඒවාට මැදිවූ සිසුන්ගේ සාධාරණ විරෝධය මර්දනීය ක්‍රියා මගින් යටපත් කරලීම ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි දැඩිව හෙළා දකිමු. එම සරසවි අර්බුද හදිසියේ පැනනැගුණ ඒවා නොවේ. ඇතැම් අර්බුද ආණ්ඩුව විසින් හිතාමතා ඇතිකළ ඒවා වන අතර ඇතැම් ඒවා ආණ්ඩුවේ නොහැකියාව නිසා උද්ගත වූ ගැටලුය.

අද වනවිට රජරට සරසවියේ වෛද්‍ය පීඨය වසා දමා ඇති අතර ජයවර්ධනපුර සරසවියේ වෛද්‍ය පීඨය හරෙන්නට සෙසු පීඨ වසා දමා තිබේ. රජරට වෛද්‍ය සිසුන්ට තම අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය මහාචාර්ය ඒකකය ඇතුළු අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කරලීමට ආණ්ඩුව අසමත් වී තිබේ. ඒ හේතුවෙන් එම සිසුන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වී ඇති අතර ඊට විසඳුම් දීමට ආණ්ඩුවට වුවමනාවක් හෝ හැකියාවක් ඇති බවක් නොපෙනේ. ජයවර්ධනපුර සරසවියේ විරු සිසු ස්මාරකයට බෝම්බ ප්‍රහාරයක් එල්ල වූ බවට වාර්තා වූ අතර ඊට වගකිව යුත්තන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව අසමත් වී ඇත. සරසවි පාලනයට දේශපාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන පරිපාලකයින් පාවිච්චි කරමින් ආණ්ඩුව විශ්වවිද්‍යාල තවතවත් අර්බදයට ඇද දමමින් සිටී.

එවන් තත්වයක් තුළ තම ගැටලුවලට විසඳුම් ඉල්ලා හඬ නගන සරසවි සිසුන් අධ්‍යාපනයෙන් පිටමන් කිරීමටත් ඔවුන්ගේ සාමකාමී උද්සෝෂණ මර්දනයෙන් යටපත් කිරීමටත් ආණ්ඩුව උත්සාහ දරන බව පෙනේ. මෙය සරසවි තුළ අර්බුදකාරී තත්වයක් හිතාමතාම නඩත්තු කරලීමේ සැලැස්මක්දැයි සැක පහළ වන තත්වයකි. උසස් අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමේ පනත් නීතිගත කිරීමට ආණ්ඩුව කැස කවන්නේ මෙවැනි පරිසරයක් තුළය. රජයේ විශ්වවිද්‍යාල පද්ධතිය බිඳ දැමීම මගින් ආණ්ඩුව පෞද්ගලික උසස් අධ්‍යාපන අවස්ථා දිරි ගැන්වීමට ද කටයුතු කරමින් සිටී. ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානය කරන බව ප්‍රකාශ කරමින් අධ්‍යාපනයේ පෞද්ගලික ආයෝජන අවස්ථා පුළුල් කරන අතර පවතින සරසවි මර්දනයේ කේන්ද්‍රය බවට පත්කිරීමට ආණ්ඩුව කටයුතු කරමින් සිටී. සිසු ගැටලු විසඳීමට කටයුතු කරනු වෙනුවට ඒවා තව තවත් උග්‍රකරවීමටත් ශිෂ්‍ය මර්දනය තුළින් ගැටලු යටපත් කිරීමටත් ගන්නා ආණ්ඩුවේ උත්සාහය දැඩිව හෙළා දකින අපි ආණ්ඩුවේ කූට ප්‍රයත්නයන් පරාජය කරලීම සඳහා පෙරට එන ලෙස සමස්ත ශ්‍රී ලාංකීය ජනතාවගෙන් ඉල්ලා සිටිමු.

# විසඳුමක් අතැතිනම් රටට කිව යුතුයි! ජ.වි.පෙ. ආණ්ඩුවට බලකරයි

ජාතික ප්‍රශ්නය අරභයා ජනාධිපතිවරයාත් ආණ්ඩුවත් විවිධ අවස්ථාවන්වලදී විවිධ ක්‍රියාමාර්ග පිළිබඳව වගකීමෙන් තොරව ප්‍රකාශ කර ඇති බවට චෝදනා කරන ජනතා විමුක්ති පෙරමුණ මෙම ප්‍රශ්නයට ආණ්ඩුවට ස්ථිරසාර විසඳුමක් තිබේනම් එය වහාම ලාංකේය ජනතාව ඉදිරියේ තැබිය යුතු යැයි අවධාරණය කරයි. මේ බව සඳහන් වූයේ, ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය විසින් පසුගිය 18වැනි දින නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයකය. එය සම්පූර්ණයෙන් මෙසේය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ තමන් සමග බලය විමධ්‍යගත කරලීමේ ක්‍රියාවලියක් පිළිබඳව කළ සාකච්ඡාවලදී 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඔබ්බට යාමට එකඟතාවය පළ කළ බව දැනට ශ්‍රී ලංකාවට පැමිණ සිටින ඉන්දීය විදේශ අමාත්‍ය එස්.එම්. ක්‍රිෂ්ණා මහතා විදේශ කටයුතු අමාත්‍යාංශයේදී 2012 ජනවාරී 17 දින පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී ප්‍රකාශ කළ බව අද දින (18) මාධ්‍ය මගින් වාර්තා කරනු ලැබ ඇත. මෙම මාධ්‍ය සාකච්ඡාවට ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු පිළිබඳ ඇමති ජී.එල්. පීරිස් මහතාද සහභාගි වී තිබේ.

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නයට ජනාධිපතිවරයාත් ආණ්ඩුවත් ඉදිරිපත් කරන විසඳුම පිළිබඳ ශ්‍රී ලංකාවේ ජනතාව දැනුවත් විය යුත්තේ, ඉන්දියාවේ විදේශ අමාත්‍යවරයා මගින් නොවන බව අපි අවධාරණය කරමු.

ජනාධිපතිවරයා හා ආණ්ඩුව ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නයට මෙතෙක් රට ඉදිරියේ නිශ්චිත විසඳුමක් ඉදිරිපත් කර නැත. එසේ තිබියෙදී ඉන්දීය විදේශ අමාත්‍යවරයා ඉහත සඳහන් ප්‍රකාශය කරද්දී ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා නිෂ්ශබ්දව සිටීම ප්‍රශ්නයකි. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නයක් වූ ජාතික ප්‍රශ්නය අරභයා ජනාධිපතිවරයාට සහ ආණ්ඩුවට ඇති විසඳුම කුමක්ද යන්න ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා එකී මාධ්‍ය සාකච්ඡාවේදී පැහැදිලි කළ යුතුව තිබුණි. එසේ නොකිරීම මගින් එම අමාත්‍යවරයා තම වගකීම පැහැර හැර තිබේ.

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය අරභයා වූ විසඳුම ලෙස ජනාධිපතිවරයාත් ආණ්ඩුවත් විවිධ අවස්ථාවන්වලදී විවිධ ක්‍රියාමාර්ග පිළිබඳව වගකීමෙන් තොරව ප්‍රකාශ කර තිබේ. මෙම ප්‍රශ්නයට තමන් සතුව ස්ථිරසාර විසඳුමක් තිබේනම් එය වහාම ලාංකේය ජනතාව ඉදිරියේ තබන ලෙස අපි ජනාධිපතිවරයාට සහ ආණ්ඩුවට බලකර සිටිමු.

### සර්වපාක්ෂික කමිටු වාර්තා...

මේ පිළිබඳව කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා පැවසුවේ, ප්‍රශ්නය විසඳීම සඳහා යැයි පවසමින් සිදුකරන ලද සාකච්ඡා වට විශාල ප්‍රමාණයක ඉතිහාසයක් ඇති මොහොතක තවත් සර්වපාක්ෂික සාකච්ඡා පැවැත්වීමට සූදානම් වීමෙන් ආණ්ඩුවට ජාතික ගැටලුව අරභයා තමන්ට දැක්මක් හෝ වැඩපිළිවෙළක් නොමැති බව ප්‍රකට කර ඇති බවය. ආණ්ඩුව තමන් මේ ප්‍රශ්නය හඳුනාගන්නා ආකාරය හා ඊට ලබාදෙන විසඳුම රට හමුවේ තබා එය පදනම් කරගනිමින් සාකච්ඡා අරඹනු වෙනුවට හුදු කල් මැරීම සඳහා සාකච්ඡා කිරීමට යාම ලෝකය හමුවේත් රට හමුවේත් ආණ්ඩුවේ බංකොලොත්භාවය ප්‍රදර්ශනය කරන්නක් වනු ඇතැයිද ඔහු වැඩිදුරටත් කියා සිටියේය.

### සපිරි පාසල්...

මේ නව යෝජනා ක්‍රමය යටතේ ඇතිවන මූලිකම ප්‍රශ්නය සඟවා තිබෙනවා. දැනට පාසැල් 9800ක් තිබුණත් සපිරි පාසැල් ක්‍රමය යටතේ ආවරණය වන්නේ, පාසැල් උපරිම 5000ක්. ඉතිරි පාසැල් 4000ට වෙන්නේ කුමක්ද? මෙය පාසැල් සම්පූර්ණයෙන්ම අඩපණ වෙනවා. එයින් සිදුවෙන්නේ, පාසැල් ඉබේම වැසී යාමයි. අනෙක් පැත්තෙන් මේ වැඩසටහනට අවුරුදු 5ක් යනතුරු එක් සපිරි පාසැලකට ලැබෙන්නේ, රුපියල් ලක්ෂ 600යි. මෙය කොතෙක් දුරට ප්‍රමාණවත් වෙයිද? මුළු පාසල් ව්‍යාපෘතියටම වෙන්කර ඇත්තේ, ඩොලර් මිලියන 600යි. එයින් ඩොලර් මිලියන 350ක් අධාර වශයෙන් ලැබෙන බව ආණ්ඩුව කීවත් ඉතිරි ඩොලර් මිලියන 250 සොයාගන්නා විදිය ආණ්ඩුවවත් දන්නේ නැහැ. මුල් සැලැස්මක් නැති

### අවසන් පිටුවෙන් ඉතිරි

ඉලක්කයක් නැති මේ සපිරි පාසැල් ව්‍යාපෘතිය වහාම අත්හිටුවන්න අපි බලකරනවා. ජනාධිපතිවරයාගේ හෝ අධ්‍යාපන ඇමතිවරයාගේ, වෙනත් ඇමතිවරුන්ගේ දරුවන් මේ පාසැල්වලට යන්නේ නැහැ. ඔවුන්ගේ අධ්‍යාපනය සුරක්ෂිතයි. විදේශීය හෝ පෞද්ගලික අධ්‍යාපනය ඔවුන්ට ලබාදෙනවා. ඒ අතර රටේ ජනතාවගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම විනාශ කිරීමේ ව්‍යාපෘතියක් බවට සපිරි පාසැල් ක්‍රමය දැනටමත් පත්වී අවසන්. ඒ නිසා මෙය වහාම අත්හිටුවිය යුතුයි කියන බලපෑම ජනතා විමුක්ති පෙරමුණේ අපි කරනවා.'' අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

මෙම මාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික, පළාත් සභා මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයාද එක්ව සිටියේය.

### නිදහස් අධ්‍යාපනය...

පත්කරන්නේ ඇමතිවරයා. මේ වැනි පෞද්ගලික විශ්වවිද්‍යාල ලෝකයේ දියුණු රටවල පවා අසාර්ථකව තිබියදී අපේ රටේ ආරම්භ කිරීමට ආණ්ඩුව සූදානම් වනවා.

මෙයින් සිදුවන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියේ උපාධියේ ගුණත්වය පිරිහීමට සලස්වා සාම්ප්‍රදායික උපාධි ප්‍රධානය කරන ආයතන බවට පත්කිරීමයි. ආණ්ඩවේ අරමුණ පෞද්ගලික විශ්වවිද්‍යාල නව දැනුම කේන්ද්‍ර කරගත් උපාධි පිරිනමන ආයතන බවට වර්ධනය කිරීමට ඉඩ සැලසීමයි.'' අනුර සහෝදරයා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

# ඩිවොලූෂන් ද? රෙවොලූෂන් ද?

ලංකාවේ ජාතික ප්‍රශ්නය අරභයා වන ''බලය බෙදීමේ'' කතිකාව යළි මතුවී තිබේ. ඒ පසුගියදා සිදුවූ ඉන්දීය විදේශ අමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරයත් සමගය. වැස්සත් සමග ඩෙංගු උවදුර මතුවන්නා සේ ඉන්දීය නිලධාරීන්ගේ හෝ බලධාරීන්ගේ ලංකා සංචාර සමගත් ලංකාවේ පාලකයන්ගේ ඉන්දියානු සංචාර සමගත් ''බලය බෙදීමේ'' කතිකාවද විටින් විට මතුවෙමින් තිබේ. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය සඳහා ජාතික සමගිය දෙසට වූ සැබෑ විසඳුමක් ඉදිරිපත් කිරීමට අසමත් ලංකාවේ ධනේශ්වර පාලකයෝද රට බෙදීම දේශපාලනික උපායමාර්ගය බවට පත්කරගෙන සිටින සියලු ප්‍රතිගාමීහුද ''ඩිවොලූෂන්'' හෙවත් බලය බෙදීම වටා කැරකෙමින් සිටිති.

**මාධ්‍ය ප්‍රකාශක ක්‍රිෂ්ණා**

පසුගිය ජනවාරි 06 ලංකාවට පැමිණ ජනාධිපතිවරයා සමග සාකච්ඡා පැවැත්වූ ඉන්දීය විදේශ ඇමති ක්‍රිෂ්ණා මහතා ලංකාව තුළ ජනමාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් ලංකාවේ විදේශ ඇමති ජී.එල්. පීරිස් මහතාද ළඟ සිටියෙදී පවසා තිබුණේ ලංකාවේ ජාතික ගැටලුව සඳහා විසඳුම ලෙස 13වන සංශෝධනයට එහා යන බලය බෙදීමක් ලබාදීමට තමා සමග ලංකාවේ ජනාධිපතිවරයා එකඟ වූ බවය. එහිදී පැනනැගුණු මුල්ම ගැටලුව වූයේ, ලංකාවේ ජනාධිපතිවරයා හා ඉන්දීය විදේශ ඇමතිවරයා අතර ඇතිවූ රාජ්‍යතාන්ත්‍රික සාකච්ඡාවල එකඟතා හා ප්‍රතිඵල ලංකාවට ප්‍රකාශකළ යුත්තේ ක්‍රිෂ්ණා ඇමතිවරයාද යන්නය. ඒ අනුව ක්‍රිෂ්ණා ඇමතිවරයා ලංකාවේ ''මාධ්‍ය ප්‍රකාශක'' ගේ භූමිකාවටද පණවපොවා තිබේ. ඒ නිවටකම හා ලැජ්ජානැතිකම පෙන්වමින් ජී.එල් පීරිස් ඇමතිවරයාද ක්‍රිෂ්ණා ඇමතිවරයා අසල වාඩිවී සිටියෙදීය. ඉන්දීය ආධිපත්‍යවාදීන් තම ආධිපත්‍යාවාදී දේශපාලනය ක්‍රියාවට නගමින් ඇති තත්වය පිළිබඳවත් නිවට ලාංකේය බලධාරීන් ඊට යටවී ඇති තත්වය පිළිබඳවත් එය කදිම නිදසුනකි.

**කෙහෙළියත් නොදන්නා සෙනෙට් සභා**

ක්‍රිෂ්ණාගේ මාධ්‍ය සාකච්ඡාව මගින් ආණ්ඩුවේ 'බළලා මල්ලෙන් එළියට පැනීම' සමග කෙහෙළිය රඹුක්වැල්ල අමාත්‍යවරයාද මාධ්‍ය සාකච්ඡාවක් පවත්වනු ලැබිණි. මෙහිදී ඔහු පවසා තිබුණේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට එහා යන විසඳුමකට එකඟව ඇති බවත්, එහිදී පළාත් ආණ්ඩුව සහ මධ්‍යම ආණ්ඩුව සම්බන්ධය ගොඩනැගීම සඳහා සෙනෙට් සභාවත් ඇති කරන බවත්ය. එහෙත් ආණ්ඩුව ඉන්දියාවට එකඟ වූ 13ට 'එහා' යනු කුමක්ද පිළිබඳවත් සෙනෙට් සභාව යනු කුමක්ද? එය පත්වෙන්නේ කෙසේද ඊට පත්වන්නේ කවුද එහි කාර්යභාරය කුමක්ද ලංකාවේ ජාතික ප්‍රශ්නයට එය විසඳුමක් වන්නේ කෙසේද ආදී කිසිවක් ආණ්ඩුවෙන් පැහැදිලි වූයේ නැත. තවමත් පැහැදිලි නැත. මේ සෙනෙට් සභාව කුමක්දැයි තවම ආණ්ඩුවවත් එය පැවසූ කෙහෙළිය ඇමතිවරයාවත් දන්නේ දැයි සැක සහිතය. රාජපක්ෂ ආණ්ඩුවේ අරමුණ පැහැදිලිය. 13ට එහා බලය බෙදීමක් සඳහා ඉන්දියාවට පොරොන්දු වූ විට එම පොරොන්දුව ඉන්දීය විදේශ ඇමතිවරයා ලංකාවට හෙළි කළ විට ඉන් 'දේශප්‍රේමී' මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාත් ආණ්ඩුවත් පත්වන 'අපහසුතාවය' මගහරවා ජනතා අවධානය වෙනතකට යොමු කිරීම සෙනෙට් සභා කථාවේ අරමුණය. කවුරුත් හරිහැටි නොදන්නා සෙනෙට් සභා කතාවක් එන්නේ ඒ අනුවය.

**13 කා සඳහා ද?**

ලංකාවේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් ලෙස 13 වන සංශෝධනය (පළාත් සභා) ලංකාව මත 1987 දී බලහත්කාරයෙන් පටවනු ලැබුවේ ලංකාවට ගුවනින් පරිප්පු දැමූ ඉන්දියාවය. ඉන්දියාවට යටවී ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කොට 13 වන සංශෝධනය ගෙන ආවේ ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාය. එම 13 වන සංශෝධනයට එදා එ.ජා.ප.යත් ප්‍රතිවිප්ලවකාරී කල්ලි කීපයකුත් හැර මුළු රටම (ශ්‍රී.ල.නි.ප.ය පවා) විරුද්ධ විය. 13 වන සංශෝධනය දෙමළ ජනතාවගේ වුවමනාව හෝ දෙමළ ජනතාව සඳහා වූවක් නොව ඉන්දියාවේ වූ උවමනාව හා ඉන්දියාවත් දෙමළ ධනපති බෙදුම්වාදීනුත් සඳහා වූවක් විය. 13 වන සංශෝධනය එය ක්‍රියාත්මකව පැවැති මුළු කාලය පුරාම ලංකාවේ ජාතික ගැටලුව විසඳීමට, ජාතික සමගිය ඇති කිරීමට දායක වූයේ නැත. එය දායක වී තිබෙන්නේ ප්‍රශ්නය තව තවත් බරපතළ කිරීම සඳහාය. ව්‍යාකූල කිරීම සඳහාය. ජාතික අසමගිය හා ජාතිවාදය පෝෂණය කිරීම සඳහාය.

**ජේ.ආර්.ගේ 13 හා එම්.ආර්.ගේ 13+**

ලංකාවේ ආර්ථික, සමාජ දේශපාලන සෑම ක්ෂේත්‍රයකම ජේ.ආර්. ගිය මගේ ජේ.ආර්. ඉක්මවා ගමන් කරමින් සිටින මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ආර්ථිකයේදී ජේ.ආර්.ගේ විවෘත ආර්ථිකයේ දෙවැනි ඉණිම ක්‍රීඩා කරන්නා සේම ජාතික ප්‍රශ්නයේදී ජේ.ආර්.ගේ 13ට එහා යාමට එකඟ වී සිටී. ජේ.ආර්.ගේ 13 වෙනුවට එම්.ආර්. ගේ 13+ කරළියට පැමිණ තිබේ. මෙහි විශේෂ තත්වය වන්නේ, ජේ.ආර්. මත 13 බලෙන් පැටවූ ඉන්දියාවම පරිප්පු දැමීමකින් තොරවම 13+ සඳහා එම්.ආර්. එකඟ කර ගැනීමය. මේ සඳහා රාජ්‍යතාන්ත්‍රික ලෙස බලහත්කාරය හා තම ආධිපත්‍යවාදය පාවිච්චි කරන ඉන්දියාව 'මානව හිමිකම් ප්‍රශ්න' 'උතුරේ ජනතාවගේ ගැටලු' යන හේතු ඒ සඳහා යොදා ගනිමින්, රාජපක්ෂ පාලනය බිය වද්දමින් ලංකාවේ ආර්ථිකයද කොල්ලකමින් සිටී. ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය ලබාදීමට අසමත් සියලු ජනතාවන්ට සමානාත්මතා පදනම මත අයිතීන් ලබාදීමට අසමත්, ජනතාවගේ මූලික ගැටලු විසඳීමට පවා අසමත්, දුර්වල පසුගාමී ධනපති ක්‍රමයක් තුළ 'රජකම කරන' නිවට හා දුර්වල පාලකයන්ට මෙයට වෙනස් ලෙස කටයුතු කිරීමටද නොහැක.

**ඉන්දියාව කපටි ආරක්ෂකයා ලෙස**

ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීමට මහින්ද රාජපක්ෂ පාලනයේ නොහැකියාව හා අසමත්කම තේරුම් ගන්නා අයුරින්ම අපේ රටේ ජනතාව, විශේෂයෙන් දෙමළ ජනතාව ඉන්දියාවේ මැදිහත්වීමේ සැබෑ තත්වයද තේරුම්ගත යුතුය. ඉන්දියාව මතුපිටින්, පෙනුමෙන් හා වචනවලින් පෙනී සිටින්නේ, දෙමළ ජනතාවගේ අයිතීන් රැක දීම වෙනුවෙන්මය!. එහෙත් ඉන්දියාව සැබෑ ලෙසම කටයුතු කර තිබෙන්නේත්, කටයුතු කරමින් සිටින්නේත් දෙමළ ජනතාවගේ ප්‍රශ්න දඩමීමා කර ගනිමින් තම ආර්ථික හා දේශපාලන අරමුණු ශ්‍රී ලංකාව තුළ ඉටු කර ගැනීමටය. ලංකාවේ වෙළඳපොළ අත්පත් කර ගැනීම, ලංකාවේ ඉඩම් ඇතුළු සම්පත් කොල්ලකෑම ලංකාවේ ධීවර සම්පත කොල්ල කෑම, ලංකාවේ ඉදිකිරීම්වල කොන්ත්‍රාත්තු ටික ඉන්දියාවට ලබා ගැනීම ඉන්දියාවේ දේශපාලන අපේක්ෂාව වී තිබේ. ඒ අනුව ඉන්දියාව පසුගිය කාලය පුරාම දෙමළ ජනතාවගේ 'අයිතීන්' ගැන හඬ නැගුවද දෙමළ ජනතාවට දිනා දුන් එකම අයිතියක්වත් නැත. ඒ වෙනුවට ඉන්දියාව දෙමළ ජනයා පදිංචිව සිටි ඉඩම්ද ඇතුළුව (සාම්පූර්වල ඉඩම්) ලංකාවේ ජනතාවගේ ඉඩම් මහා ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබේ. දෙමළ ජනයාද ඇතුළු ලාංකේය ධීවරයාට අයිති ලාංකේය මුහුදත් ධීවර සම්පතත් කොල්ලකමින් තිබේ. ලංකාවේ ඉදිකිරීම්වලට ඉන්දීය සේවකයින් ගෙන එමින් ලංකාවේ ශ්‍රමිකයාගේ (දෙමළ ජනයාද ඇතුළුව) රැකියා අවස්ථා අහිමි කර තිබේ. ඒ අනුව ගත්විට ඉන්දියාව රඟපාමින් සිටින්නේ, කපටි ආරක්ෂකයාගේ භූමිකාවය.

**විසඳුම කාටද?**

ඕනෑම ප්‍රශ්නයකදී මෙන්ම ජාතික ගැටලුව පිළිබඳ ප්‍රශ්නයේදීද ප්‍රධාන විසඳුම් දෙකක් තිබේ. එම විසඳුම් දෙක ප්‍රධාන පංතිමය කඳවුරු දෙකක් නියෝජනය කරයි. ඉන් එක විසඳුමක් ධනපති පංතියේ හා අධිරාජ්‍යවාදීන්ගේ පංති වුවමනාවන්ට අනුව යෝජනා වී ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරමින් තිබෙන අතර අනෙක් විසඳුම වන්නේ නිර්ධන පන්තියේ විසඳුමය. ධනපති පංතියේත් අධිරාජ්‍යවාදීන්ගේත් ඊනියා විසඳුම පදනම්ව ඇත්තේ, ජාතික අසමගිය වැඩි කිරීමේ අසමානතාවය වැඩි කිරීමේ හා ජනතාව (පංතිය) බෙදා වෙන්කිරීමේ දෙසටය. එහෙත් නිර්ධන පංතියේ විසඳුම සකස් විය යුත්තේ ජාතික සමගියේ, සමානාත්මතාවයේ හා ජනතාව ඒකරාශී කිරීමේ පංතිය සමගි කිරීමේ අරමුණ දෙසටය. මෙම සරල වෙනස නොදකින, පංති අර්ථයෙන් ජාතික ප්‍රශ්නයට ප්‍රවේශ නොවෙන පොතේ ගුරුවාදී, සුළු ධනේෂ්වර ඊනියා වමේ කල්ලිවල රංචු ගැසෙන මහත්වරු ජාතික ප්‍රශ්නයේදී කිසිදු විළි ලැජ්ජාවකින් තොරව අධිරාජ්‍යවාදීන්ගේත් ධනපති පංතියේත් ඉන්දියානු ආධිපත්‍යවාදීන්ගේත් ඊනියා විසඳුම සමග එකට පෙළ ගැසී සිටිති. බලය බෙදීමට කතා කරති. ඔවුන් පෙනී සිටින්නේත් ඉල්ලා සිටින්නේත් ජාතික ගැටලුව නිසා පීඩාවට පත්ව සිටින ජනතාව සඳහා විසඳුමක් නොව ජාතික ගැටලුව නිර්මාණය කළ ධනපති පංතියේ හා අධිරාජ්‍යවාදයේ වුවමනා නියෝජනය වන විසඳුමක්ය. ධනවාදය තුළ බලය කෙසේ බෙදුවත් කෙතරම් ප්‍රමාණයක් බෙදුවත් එය ලැබෙන්නේ, ජනතාවට නොව ධනපති පංතියේ පාලකයන්ටය. සරල අරුතින් ගත් විට ධනවාදය තුළ බලය බෙදීම ජනතාවගේ ගැටලුවලට විසඳුමක් නොවන්නේ ඒනිසාය.

**රාජපක්ෂ පාලනයේ දෙබිඩ්ඩෝ**

ලංකාවේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් නැති රාජපක්ෂ පාලනයත් එහි කොටස්කරුවනුත් මේ සම්බන්ධයෙන් අනුගමනය කරන්නේ, දෙඩිබ් පිළිවෙතකි. එය මෙම ප්‍රශ්නය තව තවත් ව්‍යාකූල කිරීමටත් සංකීර්ණ කිරීමටත් හේතුවී තිබේ. එක් අතකින් තම බලය සඳහා ඡන්ද ගැනීම සඳහා සිංහල ජාතිවාදය සතුටු කරන, එයට අනුව අදහස් දක්වන රාජපක්ෂ පාලනය අනෙක් අතින් අධිරාජ්‍යවාදය හා ඉන්දියාවේ බලපෑමට යටත් වෙමින් ඔවුන්ගේ න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරමින් බෙදුම්වාදය පෝෂණය කිරීමද එක විට කරයි. ක්‍රිෂ්ණාට 13 එහා බලය බෙදීමක් පොරොන්දු වන ආණ්ඩුව එය ක්‍රිෂ්ණා හෙළි කරන තුරු හෙළි නොකර සිටින්නේත් එය හෙළි වූ පසු අත්වන 'පාඩුව' 'මකා ගැනීමට වෙනත් බොරු' කතා කියන්නේත් පාර්ලිමේන්තු තේරීම් කාරක සභා හා සර්වපාක්ෂික සාකච්ඡා යෝජනා කරමින් ප්‍රශ්නය මගහැර යන්නේත් ඒ නිසාය. ආණ්ඩුවේ ඉන්නා ඊනියා දේශප්‍රේමී ඇමතිවරුද ''අපි දන්නේ නැහැ'' ''අපට කිව්වේ නැහැ'' ''දැන්ම

15වැනි පිටුවට





විමධ්‍යගතකරණයේ එක් ආකාරයක් වශයෙන් නිර්ධන පංතිය ෆෙඩරල් ක්‍රමයක් ඇති කිරීමටද විරුද්ධ වෙයි. වඩා විශාල හා මධ්‍යගත රාජ්‍යයන් සිය ඓතිහාසික මෙහෙවර ඉටුකිරීම සඳහා වඩාත් යෝග්‍ය බව මනාව තේරුම් ගන්නා නිර්ධන පංතිය කිසි විටෙකත් රටවල් කැබලිවලට කැඩීමට එකඟ නොවන්නා සේම රටවල් විමධ්‍යගත කිරීමටද එකඟ නොවෙයි .''

**රෝහණ විජේවීර**
**'දෙමළ ඊළාම් අරගලයට විසඳුම කුමක්ද?'**
**5 වන මුද්‍රණය 261 පිටුව**




# මිත්‍යාවට එරෙහිව විද්‍යාව හා ලෙනින්

ආණ්ඩුවේ ඇමතිවරියකගේ ව්‍යාපාරික ස්වාමි පුරුෂයාට දකුණු ඉන්දීය දේවාලයකදී එල්ලවූ ප්‍රහාරයක් ගැන පසුගියදා වාර්තා විය. ඔහු එහි ගියේ ජනාධිපතිවරයා වෙනුවෙන් බාරයක් වීමට බවද මත පළවිය. කැළණිය ප්‍රදේශයේ මෑතකදී මහා පරිමාණ සත්ව බිලි පූජාවක් සූදානම් කර තිබූ විස්තරද මාධ්‍යවල වාර්තා විය. යාග හෝම, බලි තොවිල්, යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් ද අඩු නැතුව පවතී. අත බලා පරිසනක තාක්ෂණයෙන් ශාස්ත්‍ර කීම දැන් නගරවල ප්‍රකට සිද්ධියකි.

සැබැවින්ම දේව ඇදහිලි හා වෙනත් මෙවැනි මිත්‍යා විශ්වාසයන් මිනිස් සමාජය තුළ ඇති වූයේ, ලෝකයේත්, සොබාදහමේත් ඇතිවන ක්‍රියාවලීන් පැහැදිලි කර ගැනීමට මිනිසා අසමත් වීම නිසාය. එහෙත් පියවරෙන් පියවර සිදු වූ විද්‍යාවේ සොයාගැනීම් සමග මේවා යම් පමණකට පසුබා ගියේය.



එහෙත් "විද්‍යාව" හැමවිටම සාපේක්ෂ වන්නේය. එබැවින් පවතින විද්‍යා දැනුමෙන් විස්තර කළ නොහැකි කොටසක් හැම විටම ඉතිරි වීම ස්වභාවිකය. එවිට විඥානවාදී මත ඒ තැන්වලට කඩා වැදී පැලපදියම් වේ. මෙය දිගින් දිගටම සිදුවන්නකි. මෙයින් විද්‍යාව ''බොරු'' නොවන නමුත් තාවකාලිකව ජන මතය ව්‍යාකූල කර දැමීමට එයට හැකිය.

අදත් ප්‍රධාන පෙලේ ධනපති දේශපාලකයන්ගේ සිට ඇතැම් විද්වත් ලෙස පෙනී සිටින අය අතරද, පොදුවේ පීඩිත සමාජ කොටස අතරද මෙවැනි විඥානවාදී මිත්‍යාවන් තහවුරු වී තිබේ.

මිත්‍යා විශ්වාස හා මතවාද පැරදවීම මතවාදී කටයුතුවලින් පමණක් හැකියයි සිතීම නුවණක්කාර නොවේ. මේ පිළිබඳව ජීවමාන අත්දැකීම් පැරණි සෝවියට් දේශයෙන් සොයා ගත හැකිය. ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර් විප්ලවයට නායකත්වය දුන් ලෙනින් සහෝදරයා මිත්‍යාවට එරෙහි මානව සංහතියේ අරගලයේ ශ්‍රේෂ්ඨ නියමුවෙකි. ඔහු විසින් මේ පිළිබඳව වැදගත් කෘති ගණනාවක් ලියා ඇත. Meterialism and Empirio critism, On the Question of Diaiectiectice වැනි කෘති ඉන් විශේෂ වේ.

එවකට පැවති පාරභෞතිකවාදී මතවලත්, සාපේක්ෂ විද්‍යාවේ සොයාගැනීම්වල අර්බුදත් විසින් විඥානවාදය, දාර්ශනික හැඩයකින් (අද මෙන්ම) මතු වී හොල්මන් කරමින් තිබුණි. ඉහත කෘතිවලින් ඒවාට ඍජු පැහැදිලි පිළිතුරු ලබා දුන් ලෙනින්, දයලෙක්තික භෞතිකවාදී මතය තහවුරු කළේය. එසේම මිත්‍යාව පැරදවීම මතවාදී තලයට පමණක් සීමා නොකළ ලෙනින් භෞතික වශයෙනුත් සමාජවාදී සෝවියට් දේශය අඳුරින් මුදවා ජනතාව නූගත්කමින් මුදවා ගැනීමට මහා මෙහෙයුම් අරඹන ලදී.

විප්ලවය සිදුවන විට රුසියාවේ ධනවාදී සංවර්ධනය වත් හරි හැටි සිදු වී නොතිබුණි. විප්ලවය සිදු වු බව සමහර ප්‍රදේශවල නොදැන සිටි බවද කියවේ. එකී පසුගාමීකමත්, විප්ලවයත් සමග මතු වූ ප්‍රතිවිප්ලවවාදී ප්‍රහාරයත්, අධිරාජ්‍යවාදී බලපෑමුත්, නිසා ළදරු සෝවියට් දේශය යුද්ධ, සාගත, දුර්භික්ෂ හා වසංගත රෝගවලට මුහුණ පා සිටියේය.

මේ කාලයේ ප්‍රසිද්ධ විද්‍යා ප්‍රබන්ධකරුවකු වූ එච්.ජී.වේල්ස්, ලෙනින් හමුවී තිබුණි. එහිදී ලෙනින් ඔහු සමග සෝවියට් දේශය විද්‍යුතනය කිරීම ගැනත්, අභ්‍යවකාශය තරණය ගැනත් කතා කර තිබුණි. මෙය වේල්ස්ට අදහා ගැනීමටවත් නොහැකි දෙයක් වූ අතර ඔහු සිතා ඇත්තේ, සෝවියට් දේශය මුහුණ පා සිටින බරපතළ ව්‍යසනකාරී තත්වය ගැනය. මේ නිසා ඔහු ලෙනින්ගේ සංකල්පය කෙසේ වත් සාර්ථක නොවන බවට උපකල්පනය කොට, ලෙනින්ව ''ක්‍රෙම්ලිනයේ සිහින දකින්නා'' ලෙසින් හඳුන්වා ඇත. ලෙනින් කියුදේ ගැන වේල්ස් ගේ සටහන්වල මෙසේ සඳහන් වේ.

මගේ ''කාලයේ යන්ත්‍රය'' කියවූ ලෙනින්, හැම මිනිස් උපස්ථිතියක්ම ඇතිව තිබෙන්නේ, අපේ පෘථිවියේ පරිමාණයන් අනුව බව වටහා ගත්තේ යැයි මට කීවේය. ඒ හැම උපස්ථිතියක්ම, කාර්මික විද්‍යා ඥානය පෘථිවියෙනි ඔබ්බට නොගෙ නියයි. අපට අජඨාකාශය අභිබවා අනෙකුත් ග්‍රහලෝකවලට යන්නට පුළුවන් නම්, දැනට අප අතර ඇති දර්ශනවාදී, සමාජමය හා අධ්‍යාත්මික මතයන් හැම එකක්ම වෙනස් වනු ඇතැයි ලෙනින් කීය. එවිට කාර්මික බලය අසීමිත වී ප්‍රගතියේ එක් සාධකයක් වන ප්‍රචණ්ඩත්වය අවසන් වනු ඇත.''

1818 දීම වහාම ඇරඹිය හැකි විද්‍යා පර්යේෂණ ගැන දන්වන ලෙස ලෙනින් එහි විද්‍යා පීඨයට යෝජනා කළේය. 1918 දෙසැම්බර් "මධ්‍යම රාජ්‍ය කාර්මික හා විද්‍යාත්මක ආයතනයක්" පිහිටුවීමේ පනත සම්මත කළේය. කුප්පි ලාම්පු වැනි කලාමැදිරි එලියකින් ජීවත් වූ ගම්බද රුසියාව විද්‍යුතනය කිරීමද, පරමාණුවේ බලය ගැන පර්යේෂණ කිරීමද, අජටාකාශය තරණය කිරීමද යන මේ සියලු කටයුතු ගැන ලෙනින් විශාල සැලකිල්ලක් යොමු කළේය.

ලෙනින් මෙසේ ලිවීය "ඊයේ මිනිස් බුද්ධිය පරමාණුව දක්වා පමණක් වර්ධනය වී තිබුණි. අද එය ඉලෙක්ට්‍රෝනයට සීමා වී ඇත.......පරමාණුව මෙන්ම ඉලෙක්ට්‍රෝනයද නොසිඳෙන උල්පතකි, ප්‍රකෘති ස්වභාවය මෙන් සදාකාලිකය."

සැබැවින්ම එච්.ජී.වෙල්ස් පමණක් නොව මුලු ලොවම මවිත කරමින් විදුලි බල මධ්‍යස්ථාන පිහිටුවමින් මුලු සෝවියට් දේශයම විද්‍යුතනය කිරීමෙන්ද, විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථාන හරහා කාර්මික සංවර්ධනයේ වේගවත් ඉදිරියක් අත්පත් කර ගැනීමෙන්ද, අභ්‍යාවකාශය තරනය කිරීමෙන් දැවැන්ත ජයග්‍රහණ ලබා ගනිමින්ද විශාල ඉදිරි පිම්මක් තැබීමට ඉතා කෙටි කලක් තුළ සෝවියට් දේශය සමත් විය.



# අවදි වන්න

අවදි වන්න, නැගී සිටින්න
අවදි වන්න, නැගී සිටින්න, ඔබේ අයිතීන් වෙනුවෙන් නැගී සිටින්න
අවදි වන්න, නැගී සිටින්න, සටන අත් නොහරින්න
අවදි වන්න, නැගී සිටින්න, සටන අත් නොහරින්න

ධර්ම දේශකයාණෙනි, මහ පොළවට පහළින් දිව්‍ය
ලෝකය පවතී යැයි මා හට නොකියන්න
ජීවිතයේ නියම වටිනාකම කුමක්දැයි ඔබ නොදන්නා
බව මම දනිමි
දිලිසෙනා සියල්ල රත්තරන් නොවන්නේය
කතාවෙන් අඩක් කිසිදා නොපවසනු ලැබ ඇත
ඉතින් දැන් ඔබ ආලෝකය දකින්නෙහිය
ඔබේ අයිතීන් වෙනුවෙන් නැගී සිටින්න

එන්න, අවදි වන්න, නැගී සිටින්න, ඔබේ අයිතීන්
වෙනුවෙන් නැගී සිටින්න
අවදි වන්න, නැගී සිටින්න, සටන අත් නොහරින්න
දෙවියන් වහන්සේ ආකාශයේ සිට පැමිණෙතැයි
බොහොමයක් දෙනා සිතති
ඔහු සියලු වේදනා රැගෙන යනු ඇතැයිද සියලු
දෙනා හට උසස් හැඟුමන් දනවනු ඇතැයිද සිතනු
ඇත
නමුත් ජීවිතයේ සැබෑ වටිනාකම කුමක්දැයි ඔබ
දන්නෙහි නම්, ඔබ මිහිතලය මත ඔබේම වූවන්
සොයනු ඇත
දැන් ඔබ ආලෝකය දකින්නෙහිය
ඔබ ඔබේ අයිතීන් වෙනුවෙන් නැගී සිටින්න
අවදි වන්න, නැගී සිටින්න, ඔබේ අයිතීන් වෙනුවෙන්
නැගී සිටින්න
අවදි වන්න, නැගී සිටින්න, සටන අත් නොහරින්න
අවදි වන්න, නැගී සිටින්න, ජීවිතය යනු ඔබේ
අයිතියයි
ඉතින් අපට සටන අත් හළ නොහැක

යේසුස් වහන්සේගේ නාමයෙන් මියෙන සහ දෙව්
ලොව යන-
නොයෙක් වාදයන් සහිත ඔබගේ සෙල්ලමෙන් අපි
පීඩාවට පත්ව සිටින්නෙමු
ස්වාමි දරුවාණෙනි අප තේරුම්ගත් කල්හි දන්නෙමු
සර්ව බලධාරී දෙවියන් ද මිනිසෙකු බව
ඔබට ඇතැම් මිනිසුන් ඇතැම් කල්හි මුලා කළ හැක
නමුත් සෑම කල්හිම සැම දෙනාම මුලා කළ නොහැක
ඉතින් අප දැන් ආලෝකය දකින්නෙමු අප අපගේ
අයිතීන් වෙනුවෙන් නැගී සිටින්නට යන්නෙමු
ඉතින් ඔබත් අවදි වන්න නැගී සිටින්න ඔබේ අයිතීන්
වෙනුවෙන් නැගී සිටින්න

අවදි වන්න, නැගී සිටින්න, සටන අත් නොහරින්න
අවදි වන්න, නැගී සිටින්න, ඔබේ අයිතීන් වෙනුවෙන්
නැගී සිටින්න
අවදි වන්න, නැගී සිටින්න, සටන අත් නොහරින්න
ඔහ් කරුණාකර ඔබ මගේ බෝට්ටුව නො-
පදවන්නෙහිද
මක් නිසාද යත් මට මගේ බෝට්ටුව පැද්දවීමට දීමට
අවශ්‍ය නොවන හෙයිනි
මගේ බෝට්ටුව නොපදවන්න

Get up, stand up: stand up for your rights!
Get up, stand up: don't give up the fight!
Get up, stand up: don't give up the fight!


Preacher man, don't tell me, Heaven is under the earth.
I know you don't know what life is really worth.
It's not all that glitters is gold; and half the story has never been told:
So now you see the light, eh!
Stand up for your rights. come on!

Get up, stand up: stand up for your rights!
Get up, stand up: don't give up the fight!


Most people think, Great god will come from the skies,
Take away everything and make everybody feel high.
But if you know what life is worth, You will look for yours on earth:
And now you see the light,
You stand up for your rights. yeah!
[tand+up_20021743.html ]
Get up, stand up! Stand up for your rights!
Get up, stand up! Don't give up the fight!
Get up, stand up! life is your right!
So we can't give up the fight!
Stand up for your rights! lord,
Lord, Get up, stand up! keep on struggling on!
Don't give up the fight!

We sick and tired of your ism-skism game -
Dye and going to heaven in Jesus' name, lord.
We know when we understand: Almighty god is a living man.
You can fool some people sometimes,
But you can't fool all the people all the time.
So now we see the light We gonna stand up for our rights!
So you better: Get up, stand up! Stand up for your rights!

Get up, stand up! Stand up for your rights!
Get up, stand up! Don't give up the fight!
Get up, stand up! Stand up for your rights!



# ධනපති පංතියේ දේශප්‍රේමයේ සීමාව




ප්‍රංශයේ කම්කරු පංති සටන් වේගවත්ව නැගී සිටි අවසන් වූ 1849 දී ප්‍රංශ අධිරාජ්‍යයා වූ ලුවී නැපෝලියන් බොනපාට්ගේ ආණ්ඩුවේ ප්‍රබල භූමිකාවන් ඉටුකළ ඔහුගේ සොයුරු චාල්ස් මෝර්නි හා තවත් ධනපති රාජ්‍ය තාන්ත්‍රිකයකු වූ මාෂල්
බියුගාඩ් ප්‍රංශයේ කම්කරු පංති සටන් පිළිබඳ හුවමාරු කර ගත් ලිපි දෙකක උපුටා ගැනීමකි.

මාෂල් බියුගාඩ් විසින් නැපොලියන්ගේ සොයුරාට,

''කෙතරම් කෲර හා අයෝමිය මතකයන් සමූහයක්ද? දෙවියන් වහන්සේ මොවුන්ගේ මව්වරුන්ට මොවුන් මෙතරම් කෲර ලෙස හැදීමට අවසර දුන්නේ කෙසේද? අපගේ සැබෑම සතුරන් මොවුන් මිස රුසියානුවන් හෝ ඕස්ට්‍රියානුවන් නොවේ!

1849 - අප්‍රේල් 07

නැපොලියන්ගේ සොහොයුරා විසින් මාෂල් බියුනාඩ්ට,

''සමාජවාදය බියගෙන දෙන මට්ටමේ වර්ධනයක් ඇති කරගෙන තිබේ. කිරීමට ඉතිරිව ඇති එකම දෙය නම් ඇඳුම් ගමන් මලුවල අසුරා ගැනීමත් සිවිල් යුද්ධයක් සංවිධානය කර, කොසැක්වරු (රුසියන්වරු) පැමිණ අප බේරාගන්නා ලෙස දෙවියන්ට යැදීමත් පමණි. මම මෙම වාක්‍ය ලියන අතර සිනහසෙමි. මෙම වාක්‍යය ඔබගේ සිත තුළ අපගේ ජාතියේ අභිමානය පිළිබඳ ඇති හැඟීම් ප්‍රකෝප කරනු ඇතැයි මම සිතමි. එහෙත් මා විශ්වාස කරන්න! ඔබ සමාජවාදියෙකු ලඟින් දැකීමට වඩා කොසෑකයකු දැකීමට කැමති විය යුතුය. මගේ දේශප්‍රේමයේ සීමාව එයයි! - 1849



# ගොවි ජනතාවගේ ජීවිත
## වඩා යහපත් කිරීම වෙනුවෙන්
# අරගල කිරීමට සූදානම්!

**සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති,**
**ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික අනුර දිසානායක සහෝදරයා**

***නියමුවා: මෑත කාලයේ ගොවි ජනතාවගේ අරගල, උද්ඝෝෂණ මාධ්‍යවල දක්නට ලැබුණේ අඩුවෙන්. දැන් ඔවුන්ගේ ගැටලු විසඳිලාද? නැත්නම් අරගල ජනතාවගෙන් සැඟවිලාද?***

***අනුර දිසානායක සහෝදරයා:*** ගොවි ජනතාවගේ ගැටලු කිසිසේත්ම විසඳී නොමැතිවා පමණක් නොවෙයි; දිනෙන් දිනම ඔවුන්ගේ ප්‍රශ්න උග්‍ර වෙමින් පවතිනවා. පසුගිය දිනවල එළවළු සහ පළතුරු නාස්තිය අවම කිරීම කියන සටන් පාඨයට මුවා වී ගොවි ජනතාව මත තවත් අතිරේක බරක් පටවන කූඩ හඳුන්වාදීමට ආණ්ඩුව කටයුතු කළා. එයට විරුද්ධව ගොවි ජනතාව විශාල අරගලයක් කර එය ආපස්සට හරවන්න සමත් වුණා. එතන ගැටලුව වුණේ පසු අස්වනු නාස්තිය නතර කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් වෙනුවට කූඩ ව්‍යාපාරිකයන්ගේ වුවමනාවන්ට අනුව යෝජනාවක් ගෙන ඒමයි. ඒ වගේම මේ වනවිට ගොවි ජනතාවගේ විශ්‍රාම වැටුප් ගෙවීම නතර කොට තිබෙනවා. විශ්‍රාම වැටුප ලබාගන්නා ගොවීන් 110,000ක් පමණ සිටිනවා. ඒ වගේම විශ්‍රාම වැටුපට දායක වූ ගොවීන් දශලක්ෂයක් පමණ සිටිනවා. ඔවුන් මේ වනවිට විශාල අපහසුතාවයකට පත්ව සිටිනවා. ඒ වගේම ගොවි ජනතාවට තමන්ගේ අස්වනු සාධාරණ මිලකට විකුණා ගැනීමේදී පවතින ගැටලුද නිෂ්පාදන වියදම අධික වීම නිසා පත්වී තිබෙන දුෂ්කරතාවයන්ද අතිමහත්. එමෙන්ම ගොවි ජනතාවගේ තුන්වන පරම්පරාවේ දුවාදරුවන්ට ගොවිතැන් කටයුතු කිරීම සඳහා විධිමත් ඉඩම් බෙදා දීමක් අවුරුදු 30කින් වත් සිදුවී නැහැ. ඒ වෙනුවට කොම්පැනිවලට ඉඩම් අක්කර දහස් ගණනින් ලබාදෙමින් තිබෙනවා. කෘෂිකර්මාන්තය ප්‍රමුඛ කොටගෙන ගොඩනැගූ ප්‍රධාන ජලාශවලට අද සංචාරක ව්‍යාපාරය ආකර්ෂණය කිරීමේ මුවාවෙන් මේ වනවිට සී ප්ලේන් ගොඩබස්වමින් තිබෙනවා. ඒ වගේම සමාජය මුහුණ දෙන සියලු ගැටලු එයට වඩා තුන්හතර ගුණයකින් ගොවි ජනතාව මත පටවෙමින් තිබෙනවා.

***නියමුවා: ගොවි ජනතාව මුහුණ දෙන ඔබ සඳහන් කළ ගැටලු විසඳාගැනීම සඳහා සමස්ත ලංකා ගොවි ජන සම්මේලනයේ මැදිහත්වීම් කවරාකාරද?***

***අනුර දිසානායක සහෝදරයා:*** මේ වනවිටත් ගොවි විශ්‍රාම වැටුප් ලබානොදීමට එරෙහිව ගොවි ජනපදවල උද්ඝෝෂණ ව්‍යාපාරයක් සූදානම් කොට තිබෙනවා. ඒ වගේම ගොවිජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක ව්‍යාපාරයක්ද සකස් කොට තිබෙනවා. අද ගොවි ජනතාවගේ අයිතීන් සඳහා අන් කවරදාටත් වඩා වැඩියෙන් ගොවි ජනතාව සංවිධාන විය යුතු කාලයක් එළඹ තිබෙනවා. ඒ වෙනුවෙන් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය එහි අනුබද්ධ දිස්ත්‍රික්ක ගොවි සංවිධාන ශක්තිමත් කරමින් සිටිනවා. රජරට ප්‍රදේශයේ ගොවි ජනතාව මුහුණ දී තිබෙන ප්‍රධාන ගැටලු අතර ඇති වකුගඩු රෝගය හේතුවෙන්ද බෙහෙවින්ම දුෂ්කරතාවයකට පත්ව තිබෙන්නේ, ගොවි ජනතාවයි. එයට හේතු වූ සැබෑ කරුණුවත් සොයාගෙන්න ආණ්ඩුව අසමත් වී තිබෙනවා. එහෙයින් වකුගඩු රෝගය බහුල කලාපවල එම ජනතාව වෙනුවෙන් හඬක් නැගීමටත් සමස්ත ලංකා ගොවිජන සම්මේලනය කටයුතු කරලයි තිබෙන්නේ. එදිනෙදා පැන නගින මේ ගැටලුවලට මැදිහත් වීමට අමතරව සැබැවින්ම ගොවි ජනතාවගේ හා අනෙකුත් ජනතාවන්ගේ ජීවිත වඩාත් යහපත් කිරීම වෙනුවෙන් පොදු සමාජ ව්‍යාපාර සමග එක්ව අරගල කිරීමට සමස්ත ලංකා ගොවිජන සම්මෙලනය ගොවි ජනතාව පෙළ ගස්වමින් සිටිනවා.

***නියමුවා: කෘෂිකර්මය හා දැඩිව බැඳී පවතින අංශයක් වන්නේ, ඉඩම් ක්ෂේත්‍රයයි. පොලිස් බලතලද ඇතුලුව ඉඩම් බලතල පවරා දිය යුතු බවට තැනින් තැන අදහස් පළවෙනවා. මේ පිළිබඳ ඔබේ අදහස?***

***අනුර දිසානායක සහෝදරයා:*** ඉඩම් බලතල සහ පොලිස් බලතල පළාත් සභාවලට ලබාදීමත් 13 වෙනි සංශෝධනයෙන් එහා යන විසදුමක් ලබාදීමත් ලංකාවේ ජාතික ප්‍රශ්නයට විසඳුමක් බව ඉන්දියාවත් රජයත් දෙමළ ප්‍රභූ පැලැන්තියේ නායකත්වයත් විවිධ සුළු ධනේශ්වර කණ්ඩායමුත් විසින් නිරන්තරයෙන් මතුරනු ලබන දෙයක්. එහෙත් ජාතික ප්‍රශ්නය විසඳීමට කිසිසේත්ම බලය බෙදීම විසඳුමක් නොවේ. එය තවදුරටත් ජනතාව අසමගි කරන, සැකය අවිශ්වාසය වර්ධනය කරන්නක්. සැබවින්ම මෙය බලය බෙදීමක් නොව ජනතාව මත පීඩනය පතුරුවන්න, ඒ වගේම මර්දනය පැතිරවීම සඳහා බලය දිගුකිරීමක්. මින් අදහස් වන්නේ, මෙහි තිබෙන ඒකීය රාජ්‍යය තුළ මෙම ප්‍රශ්නය විසඳීමට හැකියාවක් තිබෙන බව නොවෙයි. ජනතාව තුළ අසමානතාවය, ජාතිකත්ව වෙනස්කම් තහවුරු කරන, ප්‍රජාතන්ත්‍රවාදී නිදහස නොමැති තාක්කල් ඒකීය රාජ්‍යය යනු බලහත්කාරී මධ්‍යගතකරණයි. ඒ නිසා පවතින ඒකීය රාජ්‍ය තුළින් මෙම ප්‍රශ්නයට විසඳුමක් ලබාගත නොහැකියි. අවශ්‍ය වන්නේ අසමානතාවය දුරුකරන ලද, සමාන අවස්ථා ඇති කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතකරණයයි. එය කිසිසේත්ම අපේ රටේ පවතින දුබල, පිළුණු වුණු ධනපති ක්‍රමයට ඇති කළ හැක්කක් නොවෙයි. විශේෂයෙන්ම ඉන්දියාව මේ මොහොතේ 13 ප්ලස් පෙන්නලා තමන්ගේ තවත් ආර්ථික වුවමනාවන් ඉටු කරගැනීමයි අපේක්ෂා කරන්නේ. දශක ගණනාවක් තිස්සේ ජාතික ප්‍රශ්නය පිළිබද විවිධ බලපෑම් කරමින් කේවල් කරමින් ඉන්දියාව අද අපේ රටේ ආර්ථිකයේ විශාල පදාසයක් අත්පත් කරගෙන තිබෙනවා.




> අර්බුද හමුවේ රාජපක්ෂ පාලනයට ඉතිරිව ඇත්තේ, තවදුරටත් සහන හා සේවා කප්පාදු කරන, අධිරාජ්‍යවාදයට ආර්ථිකයේ සාරය උරාබීමට ඉඩ සකසන, ස්වාභාවික සම්පත් බහුජාතික සමාගම් වෙත පවරන නව ලිබරල් ධනවාදයේ ගමන්මගමයි.

***නියමුවා: ශ්‍රී ලංකාවේ ආර්ථික, දේශපාලන කටයුතුවලට ඉන්දීය බලපෑම ඉහළ යමින් තිබෙනවා. එය ශ්‍රී ලංකා මුහුදේ මසුන් මැරීමේ දින තීරණය කිරීමේ සිට 13 වැනි සංශෝධනයෙන් ඔබ්බට යායුතු බව අවධාරණය කිරීම දක්වා පරාසයක ක්‍රියාත්මකයි. මේ තත්වය හමුවේ රාජපක්ෂ ආණ්ඩුවේ ගමන කොතැනටද?***

***අනුර දිසානායක සහෝදරයා:*** මා පෙර කියූ පරිදි ඉන්දියාවට තිබෙන්නේ වෙනස් වුවමනාවක්. ඔවුන් අපේ රටේ ආර්ථිකයේ විශාල පදාසයක් ගිලගෙන හමාරයි. අද අපේ රටේ මෝටර් රථ වෙළඳපොළෙන් විශාල ප්‍රමාණයක් ඔවුන් අතෙයි. ඖෂධ වෙළඳපොළත් ඔවුන් අත්පත් කොට ගෙන. තවත් අපේ රටේ පවතින දේශීය කර්මාන්ත අනතුරේ හෙළන සිපා ගිවිසුම වෙනුවෙන් බලපෑම් කරමින් ඉන්නවා. රටට ජාතික ආර්ක්ෂාවට ඉතාමත් වැදගත් බලශක්ති ක්ෂේත්‍රයට ඔවුන් ඇතුල් වී හමාරයි. ඒ අනුව ඛනිජ තෙල් වෙළෙඳපොළෙන් 1/3ක් අයි.ඕ.සී මගින් අත්පත් කොටගෙන. සාම්පූර් බලාගාරය මගින් විදුලි බල ක්ෂේත්‍රයටත් ඇතුල් වෙලා. උතුරු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, කොළඹ මාතර දුම්රිය මාර්ගය අධිවේගී කිරීමේ ව්‍යාපෘතිය පළාලි ගුවන්තොටුපල, කන්කසන්තුරේ වරාය, දොරේඅප්පා ක්‍රීඩාංගණය අලුත්වැඩියා කිරීම ඔවුන් අත්පත් කරගෙන. විශාල ඉඩම් ප්‍රමාණයක් ඉන්දියානු හෝටල් වෙනුවෙන් පවරා දීලා. ඒ අනුව අපේ රටේ ආර්ථිකයේ ප්‍රධාන මර්මස්ථාන ඔවුන් අත්පත් කරගෙන.

කවර හෝ රටක ආර්ථිකයක් තවත් රටක් විසින් අත්පත් කරගත් විට අත්පත් කරගත් රට කල්පනා කරන්නේ, ඒ ආර්ථිකයේ අත්පත් කරගත් කොටස ආරක්ෂා කරන්නත් තවදුරටත් වර්ධනය කරන්නත්. ඒ වෙනුවෙන් එම රටේ දේශාපාලනය ඔවුනට අවශ්‍ය විදියට හැසිරිය යුතුයි. ඒ නිසා අද ඉන්දියාව කරමින් තිබෙන්නේ ඒ කාර්යභාරයයි. මේ තත්වය හමුවේ රාජපක්ෂ ආණ්ඩුව නිවට නියාලු ලෙස යටත් වීම හැරුණුකොට අන් මගක් ඉතිරිවී නැහැ. පසුගියදා පැමිණි ඉන්දියානු විදේශ අමාත්‍යවරයා ප්‍රකාශ කර සිටියා, ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා 13න් එහාට යන විසඳුමක් ලබාදීමට ජනාධිපතිවරයා එකඟ වූ බව. ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය රටට ප්‍රකාශ කළේ, ඉන්දියානු විදේශ අමාත්‍යවරයායයි. එය තමිල්නාඩුවේ හෝ මහාරාෂ්ඨයේ ප්‍රශ්නයක් නම් අපට කමක් නැහැ. එහෙත් ශ්‍රී ලංකාව ස්වෛරී ස්වාධීන රාජ්‍යයක්. නමුත් රාජපක්ෂ ආණ්ඩුව හැසිරෙන්නේ, ශ්‍රී ලංකාව ඉන්දියාවේ තවත් එක් ප්‍රාන්තයක් යැයි පිළිගම්නුයි. එයින්ම පෙන්නුම් කරනවා ඔවුන්ගේ යටත් වීමේ ස්වභාවයි.

**15වැනි පිටුවට**



කෙනෙකුගේ මිනිස්කම පිළිබිඹු වන්නේ, අන්‍යයන්ගේ මිනිස්කම ප්‍රකාශ කිරීම සඳහා ඔහු විශ්ද්ශ්‍ධානිකව ක්‍රියා කිරීමේ ප්‍රමාණයට අනුවය. මේ නිසා අන්‍යයන් හඳුනා ගැනීමට කටයුතු කිරීමෙන් මිනිසා අන්‍යයන්ද සමඟ මනුෂ්‍යත්වයේ නියම ලක්ෂණ බුක්ති විඳිනු ලබයි.

**කාල් මාක්ස්**

# දෙබරවැව සමුළුව හා අවස්ථාවාදයේ පරාජය



කුමන්ත්‍රණ කල්ලි පිළිබඳ අත්දැකීම් ලෝකයේ වමේ ව්‍යාපාරයට කිසිසේත්ම අලුත් දෙයක් නොවේ. ජනතා විමුක්ති පෙරමුණටද අලුත් දෙයක් නොවේ. සිය ඉතිහාසය පුරාම වරින් වර එවැනි අත්දැකීම්වලින් නොසැලෙන ශක්තියක් පක්ෂයට හිමිව තිබේ. විටෙක පුද්ගල කේන්ද්‍රීයවද, විටෙක අතිධාවනකාරී ලෙසද, තවත් විටෙක අති වාමාංශික සහ දක්ෂිණාංශික වැනි විවිධ මුහුණුවරින් අවස්ථාවාදීන් හා කුමන්ත්‍රණ කල්ලි බිහිවී තිබේ. ඒ සෑම සියලු අවස්ථාවක්ම පක්ෂය විසින් තීරණාත්මක ලෙස පරාජය කරනු ලැබ ඇත. මෙවරද අවස්ථාවාදීන්ගේ 'මාර්කටිං ප්‍රොජෙක්ට්' කොතරම් ප්‍රබල වුවත් අව්‍යාජ විප්ලවවාදීහු බිම් මට්ටමේ සිට යෝධ ශක්තියකින් පක්ෂය වටා ඒකරාශී වී පක්ෂය ආරක්ෂා කරගැනීමට සමත්වූහ. අවසානයේදී කල්ලිවාදීන්ගේ නෂ්ටවශේෂයන්ද පරාජය කරලීම සටහන් වූයේ, පක්ෂයේ විශේෂ මහා සමුළුව 2012 ජනවාරි 01 දින තිස්සමහාරාම දෙබරවැව මහජන ක්‍රීඩාංගණයේදී පවත්වනු ලැබීමෙනි.

කෙසේ වුවද අවස්ථාවාදී කල්ලි සමුළුව කඩාකප්පල් කිරීමට පවා ගත්තේ, අසීමිත උත්සාහයකි. සමුළුව දෙබරවැව පැවැත්වීම පවා ඔවුන්ගේ කලබලයට හේතු විය. දුර වැඩි බවට මාධ්‍ය හමුවල මැසිවිලි නැගීමේ සිට සමුළුව වාරණය කරන ලෙස ඉල්ලා අධිකරණය හමුවේ බැගෑපත් වීම දක්වා පරාසයක මෙම කලබලය ප්‍රකාශයට පත් විය. අධිකරණයෙන් තම ඉල්ලීම ප්‍රතික්ෂේප වීමෙන් පසු ඔවුනට ඉතිරිව තිබුණේ සමුළුව 'වර්ජනය' කරන බවට කෙඳිරිලි හඬ නැගීම පමණි.

දහස් ගණනක් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජික සාමාජිකාවන්ගේ හදවත්වල කුළුග ැන්වුණු දැඩි උණුසුම මැද, රට පුරා හා ලොව පුරා ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයින්ගේ සුබපැතුම් මැද ජනාවරි 01 දින දෙබරවැව සමුළුව අති සාර්ථකව මුළුදුන්නේය.

ධනවාදී සමාජ ආර්ථික දේශපාලන ක්‍රමය පෙරළා දමා සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීමේ දැවැන්ත මහජන බලවේගය වැළැක්විය හැකි ජගතෙක් මේ මිහිමත නැත.

# 'සහෝදරත්වයේ ජනතා පවුර' ශක්තිමත්ව පෙරට




ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභිකයින් වන සුනිල් හඳුන්නෙත්ති සහ රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරවරු සම කැඳවුම්කරුවන් ලෙස වගකීම් දරන, සහෝදරත්වයේ ජනතා පවුර සංවිධානය මේ දිනවල උතුර හා නැගෙනහිර පළාත්වල ජනතාව දැනුවත් කරමින් සිටී. එම දැනුවත් කිරීමේ එක් පියවරක් වශයෙන් පසුගිය 23දා වව්නියාව නගරයේදීද, තවත් පියවරක් 28දා මඩකලපුවේදීද පත්‍රිකා බෙදීමේ ව්‍යාපාරයක් දියත් කෙරිණි. උතුරු නැගෙනහිර ජනතාවගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමටවත් නොහැකි වී සිටින මහින්ද රාජපක්ෂ ආණ්ඩුව සහ එයට කලාපීය බලපෑම් කරමින් ඉන්දියාව කරන දැඩි බලපෑම් පිළිබඳව ජනතාව දැනුවත් කරමින් අතිශය දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන ජනතාවට අවශ්‍ය මූලික ගැටලු වහාම විසඳා දෙන ලෙස රජයට බලකරන ලදී.

23දා වව්නියාව නගරයේදී කළ පත්‍රිකා බෙදාහැරීමට ඉතා ඉහළ ජනතා පිළිගැනීමක් ලැබිණි. එහෙත් ජනතා පවුරේ සුනිල් හඳුන්නෙත්ති හා රාමලිංගම් චන්ද්‍රසේකර් ඇතුලු සහෝදරවරුන් වටා දැඩි 'රහස් පොලිස්' දලක් හා බුද්ධි අංශ දලක් එළා තිබිණි. ආරක්ෂක අංශවල මෙම පීඩාකාරී මැදිහත්වීම නොතකා පත්‍රිකා ලබාගත් දෙමළ ජනතාව ඉතා හොඳින් ඒවා කියවා බලන අයුරුද එවෙලේම දැකගත හැකි විය. යාපනයේ දෙමළ ජනතාව සහ බුද්ධිමතුන් හමුවීමට 2011 මැයි මස සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ගිය අවස්ථාවේ ඔහුට බුද්ධි අංශ සාමාජිකයන් බරපතළ ලෙස පහර දී තිබිණ. එවැනි කුමන ආකාරයේ තර්ජන ගර්ජන පැමිණියත් ජනතා විමුක්ති පෙරමුණේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව අතර සමගිය ගොඩනැගීම සහ එම ජනතාවගේ අයිතීන් දිනා දීමේ තම වගකීම ධෛර්යය සම්පන්නව ඉදිරියට කරගෙන යයි.

# සෝමවංශ සහෝදරයාගේ ස්වීඩන් සංචාරයෙන් ජයග්‍රහණ රැසක්




ස්වීඩනය ධනේශ්වර සංවර්ධනයේ කෙළ පැමිණි රටක් සේ සැලකේ. වැඩි දෙනෙක් නොදන්නා කරුණක් වන්නේ, ඒ රටේ වාමාංශික ව්‍යාපාරයට සියවසකට ආසන්න ඉතිහාසයක් තිබෙන බවය. ''ස්වීඩන් වාමාංශික පක්ෂය'' ආරම්භ කර ඇත්තේ, 1917දීය. එය පිහිටවූ දා සිට මේ දක්වා මාක්ස් ලෙනින්වාදී පක්ෂයක් ලෙස ඉතා පැහැදිලි න්‍යායික ස්ථාවරයක සිට ක්‍රියා කර තිබේ. ධනේශ්වර සංවර්ධනයේ කෙළපැමිණි රටක වාමාංශික පක්ෂයක් තමන්ගේ න්‍යායික ස්ථාවරයන් රැක ගනිමින් කටයුතු කිරීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ. එහෙත් අවසන් ජයග්‍රහණයක් පෙනෙන්නට නොතිබියේදී පවා ඔවුහු සමාජය තුළ මාක්ස් ලෙනින්වාදී ස්ථාවරයන් දැඩිව තහවුරු කරමින් අධිෂ්ඨානයෙන් රතු ධජය දරාගන පෙරටම යමින් සිටිති.

ස්වීඩන් වාමාංශික පක්ෂයේ මහ සමුළුව පසුගිය 07වනදා පවත්වනු ලැබීය. ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයාටද ඒ සඳහා ආරාධනා ලැබිණි. පක්ෂයේ නව නායක යෝනස් සහෝදරයා සමඟ පැවති හමුවෙන් පක්ෂ දෙක අතර සබඳතා තරකර ගැනීමට අවස්ථාව උදාවිය. විවිධ රටවල වාමාංශික නායකයින් සහ වාමාංශික සංවිධාන සමඟ සබඳතා තහවුරු කර ගැනීමටත් සෝමවංශ සහෝදරයාට අවස්ථාව ලැබී තිබිණි. ස්වීඩන් වාමාංශික පක්ෂයේ ජාත්‍යන්තර කටයුතු භාර ආන් මාගරන් හා මුඩී එෆ්රෙඩ්, දකුණු අප්‍රිකානු කොමියුනිස්ට් පක්ෂයේ ජාත්‍යන්තර ලේකම් ක්‍රිස් මතලිෆ්කෝ, මාලි සමාජවාදී පක්ෂයේ උමාර් මරිකෝ, රුවන්ඩා එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයේ ප්‍රධාන ලේකම් ඩෝන් බැප්ටිස්ට් ම්බර් රාබහීෂි මෙසේ සාකච්ඡා කළ සෙසු ජාත්‍යන්තර සහෝදරත්වය අතර වේ.

ජනතා විමුක්ති පෙමුණ මේ වන විට ඉදිරිපත්කර තිබෙන දකුණු ආසියාවේ කොමියුනිස්ට් පක්ෂ, වාමාංශික පක්ෂ අධිරාජ්‍ය විරෝධී පක්ෂ ''එකතුවක්'' පිළිබඳ අදහසට එම පක්ෂ නායකයින්ගේ ඉහළ පිලිගැනීමක් හිමිවිය.

ස්වීඩනයේ වාමාංශික පක්ෂයේ ආන් මාර්ගරේන් සහෝදරිය ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් කාන්තා බලවේගයක් ගොඩනැග ීමට ඉහළම දායකත්වය ලබාදීමට ජාත්‍යන්තරවාදීව ඉදිරිපත්ව තිබීම විශේෂත්වයක් විය.

# ප්‍රතිඵල විකෘතියට පොදු ජන විරෝධය

පසුගිය 2011 වසරේ අගෝස්තු මස පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාග යේ ප්‍රතිඵල විකෘති කිරීමට එරෙහිව රටපුරා විවිධ ප්‍රදේශවලදී පාසල් සුරැකීමේ ජනතා ව්‍යාපාරයේ මෙහෙයවීමෙන් විරෝධතා ව්‍යාපාර පැවැත්විණි.

සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක වෛ-ද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මෙම ව්‍යාප-ාරයේ මෙහෙයුම් කමිටු සාමාජිකයෙකි.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ අල්ලේ නටන රූකඩයක් බවට විභාග කොමසාරිස් තනතුර පත්කළ හිටපු විභාග කොමසාරිස්වරයා හෝ අධ්‍ය-ාපනය බාර ඇමති බාන හෝ වෙනත් කිසිවෙකු ප්‍රතිඵල විකෘතිය පිළිබඳ වගකීම බාරගෙන නැත. මහින්ද රාජපක්ෂ විසින් ඒ වගකීම කිසිවෙකුට නොපටවා තමනුත් බේරීමට 'ජනාධිපති කොමිසම-ක්'රූකඩයක් අටවන ලදී. පසුගියදා එළිදුටු ඒ කොමිසමේ වාර්තාව ප්‍රතිඵල විකෘතිය ගැන කිසිවක් නොකියා අනාගතයට විසඳුම් යෝජනා කර තිබීම හාස්‍යජනකය. පාසල් සුරැකීමේ ජනතා ව්‍යාපාරය මේ කොමිසමේ වාර්තාව හැඳින්වූයේ, කැකිල්ලේ තීන්දුවක් හැටියටය.

විභාග ප්‍රතිඵල විකෘති වීමට බලපෑවේ ජනාධිපතිවරයාගේ 'බැනුම්' බව උසස් අධ්‍යාපන ඇමති එස්.බී. දිසානායක ප්‍රසිද්ධියේ කියා සිටියේය. ප්‍රතිඵල නිකුත් කිරීමට පෙර එම ලේඛනය විශ්-වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට යවා තිබිණි. හිටපු විභාග කොමසාරිස් නීතිපතිගේ උපදෙස් ලබාගෙන තිබිණි. එසේම විද්වත් කමිටුවක් යැයි කියූ පිරිසක් අලුත්ම ිජදරු ගණනය කිරීමක් හඳුන්වා දී තිබිණි. අවසන් ප්‍රතිඵලය වූයේ, විභාගයට පෙනී සිටි සිසුන් 294,000කට ලැබුණු ප්‍රතිඵල බරපතළ සැක සහිත තත්වයට තිබීමය.





# සංස්කෘතියේදී වරද්දා ගැනීම

සමාජවාදී විප්ලවය උදෙසා වැඩ කිරීමේදී සංස්කෘතිය සම්බන්ධයෙන් වන ආකල්පය හා ඒ කෙරෙහි දැක්විය යුතු ප්‍රතිචාරය පිළිබඳ ගැටලුව නිතර මුණගැසේ. රාජ්‍ය බලය දිනා ගැනීමට පෙරත් ඉන් පසුව සමාජවාදය ගොඩ නැගීමේ දීත් එම ගැටලුව යළි යළිත් හමුවේ. මෙහිදී නිර්ධන පංති ව්‍යාපාර පවා වරද්දා ගත් අවස්ථා බොහෝය. සමාජවාදී චීනයේ සංස්කෘතික විප්ලව අවදියේදීත්, කාම්බෝජයේ පොල්පොට් පාලන සමයේදීත් සිදු වූ අභාවාචක සිදුවීම් ඊට උදාහරණය.

තවදුරටත් එකී ප්‍රශ්නය එලෙසම පවතී. අද දවසේද සංස්කෘතිය පිළිබඳ ගැටලුවේදී එක් හෝ තවත් අන්තයක සිට එය විග්‍රහ කරගන්නා ඊට ප්‍රතිචාර දක්වන පිරිස් බොහෝය. එක්කෝ සමාජවාදය මාක්ස්වාදීව විග්‍රහ කර ගැනීමේ ඔවුන්ගේ අසමත්කම නිසා හෝ ඔවුන්ගේ සුළු ධනේශ්වර මනෝභාවයන් නිසාවෙන් හෝ ඉතාම දැනුවත්භාවයෙන් යුක්තව කටයුතු අවුල් කිරීමේ වුවමනාව නිසා හෝ මෙම ප්‍රශ්නය විකෘති කරන්නා වූ පිරිස් බොහෝය. ලාංකේය භූමිය තුළදී පැරණි වාමාංශික පක්ෂ ලාංකේය සමාජවාදයට මාක්ස්වාදය ගැලපීමේදී ලාංකේය සමාජයේ සිරිත් විරිත්, සදාචාරයන් ආදී සංස්කෘතික ලක්ෂණයන් නොසලකා කටයුතු කිරීමට යාමෙන් වරද්දා ගත් අයුරු අප සාකච්ඡා කර ඇත්තෙමු.

මේ මොහොතේ දී විවිධ වේශයන් ගෙන් පෙනී සිටිමින් මත දක්වන්නෝ, විවේචන ඉදිරිපත් කරන්නෝ, සමාජය වෙනස් කිරීමට උත්සාහ කරන්නෝද සංස්කෘතික කේන්ද්‍රයට අදාළ මතවාදයන් තුළත් භාවිතාව තුළත් අවිද්‍යාත්මක, වැරදි සහගත හා නිර්මාක්ස්වාදී මත පතුරුවා හැරීමටත් ඒ මත පදනම් ව සමාජය විග්‍රහ කිරීමටත් විවිධ ගුරුකුල හා කණ්ඩායම් සාදාග ැනීමටත් උත්සාහ දරති.

ඔවුන්ගේ එකී මතවාදයන් තුළ බැලූ බැල්මට රැඩිකල් වාමවාදී හා විකල්ප පෙනුමක් දක්නට ලැබේ. ඒ නිසාම විශේෂයෙන් පවතින ධනේශ්වර ක්‍රමයෙන් පීඩාවට පත් වී ඊට ප්‍රතිවිරෝධී මානසික තත්වයෙන් යුතු තරුණ කොටස් ඒ වෙත ආකර්ෂණය කර ගැනීමේ හැකියාවක්ද ඒ තුළ වේ.

එකී කණ්ඩායම් සංස්කෘතිකව තේරුම් ගැනීමේදී ඒ එක් එක් ගුරුකුලයට ආවේණික විවිධ වැරදි හා අවිද්‍යාත්මක අස්ථානයන් මත පිහිටා සිටිති. අයෙක් සංස්කෘතිය යන ප්‍රපංචය තේරුම් ගන්නේම පටු අරුතකිනි. තවෙකෙක් අතීත සංස්කෘතිය උත්කර්ෂයට නංවති. අනෙකා අතීත සංස්කෘතික උරුමයන් සියල්ල බැහැර කරමින් හිස් බිමක උසස්ම සංස්කෘතියක් ගොඩනැගීම ගැන කතා කරති. සමහරෙක් තම ප්‍රතිගාමී හා හීනමාන මානසිකත්වයේ ගොදුරු බවට පත්ව යුරෝපීය සංස්කෘතික ලක්ෂණයන් උත්කර්ෂයට නංවති.

සිය ඉතිහාසය තුළ මිනිසා විසින් අත්කර ගන්නා ලද සියලු අධ්‍යාත්මික හා ද්‍රව්‍යමය වටිනාකම්වල සමස්ත එකතුව සංස්කෘතික ලෙස අපට හඳුනා ගත හැකිය.

එනම් මිනිසා විසින් නිර්මාණය කළ සියලු ද්‍රව්‍යමය දේවල්ද (යන්ත්‍රසූත්‍ර, උපකරණ, ගොඩනැගිලි, ඉදිකිරීම් ආදිය) මෙන්ම අධ්‍යාත්මික දේවල් ද (සිරිත් විරිත්, ආගම, කලාව, මතවාද ආදී) යන සියල්ලම සංස්කෘතියට අයත් වේ.

සංස්කෘතිය යන ප්‍රපංචයේ ද්විසටනය එයයි. එකිනෙකින් වෙන්කළ නොහැකි එකිනෙක මත පෝෂණය වෙමින් වර්ධනය වන දෙපාර්ශවය එයයි.

මෙම දෙපාර්ශවය අතරින් මූලික වන්නේ, භෞතික හෙවත් ද්‍රව්‍යමය පාර්ශවයයි. එනම් සංස්කෘතියේ අනෙක් පාර්ශවය මත අධ්‍යාත්මික පාර්ශවයේ සිරිත් විරිත්, ආගම, කලාව, මතවාදී ආදී අංග ලක්ෂණයන් හැඩගැස්වීම කෙරෙහි මූලික කාර්යභාරය ඉටු කරන්නේ, ද්‍රව්‍යමය හෙවත් භෞතික පාර්ශවය විසිනි.

ඒ නිසා විවිධ පාරිසරික තත්වයන් විසිනුත් විවිධ සමාජ ක්‍රම විසිනුත් සංස්කෘතික විවිධත්වයක් ඇති කරයි.

යම් නිශ්චිත ජන කොටසක සංස්කෘතිය එකී පාරිසරික තත්වයටත්, සමාජ සංවර්ධනයේ මට්ටමටත් සාපේක්ෂ වේ.

එකිනෙකට සතුරු පංතිවලට බෙදුණු සමාජයක සංස්කෘතියද පංතිමය වේ. එසේ වුවද එක් එක් සමාජයේ ප්‍රධාන සංස්කෘතික ප්‍රවාහය වන්නේ, ආධිපත්‍යය දරන පංතියේ සංස්කෘතිය වේ. එසේම මානව සමාජ සංවර්ධනයේ ස්වභාවය විසින් නිර්මල හෝ නොකිලිටි සංස්කෘතියක් ඉතිරි කර නැතුවා පමණක් නොව අතීත සමාජ ක්‍රමයන්ගේ සංස්කෘතික ලක්ෂණයන්ද වර්තමාන සමාජය තුළ ශේෂයන් ලෙස ඉතිරි කර තිබේ.

එබැවින් අප එක් එක් සංස්කෘතිය තේරුම් ගත යුත්තේ, ඉහත කරුණුවලට අනුකූලවය. යම් ජනකොටසක සංස්කෘතික ලක්ෂණ නිරපේක්ෂ ලෙස උසස් හෝ පහත් යැයි විග්‍රහ කර ගැනීම වැරදිය. ඒ එක් එක් සංස්කෘතික ලක්ෂණයන් ඇති වීමට බලපෑ භෞතික හේතූන් සලකා බලමින්ම ඒවා වටහා ගත යුතුය. පසුගාමී යැයි බැලූ බැල්මට පෙනෙන සංස්කෘතික ලක්ෂණයන් තවදුරටත් ඉතිරිව පැවතීමට හේතු කවරේදැයි විමසා බැලිය යුතු වේ. උසස් යැයි බැලූ බැල්මට පෙනෙන සංස්කෘතික ලක්ෂණයන් හටගෙන ඇත්තේ කවර ද්‍රව්‍යමය සාධක නිසා දැයි සොයා බැලිය යුතු වේ. එසේම ඒවා අප තේරුම් ගත යුත්තේ, සමස්ත පාරිසරික, සමාජීය හා ඓතිහාසික වටපිටාවෙන් ව්‍යුක්තව නොව ඒ තුළ තබාගෙ නය.

සමාජවාදී සමාජ විප්ලවය වෙනුවෙන් වැඩකරන මාක්ස්වාදීන්ට, විප්ලවවාදීන්ට නිතරම විවිධ ජන කොටසන් සමඟ, විවිධ ජාතිකත්වයන් සමඟ වැඩ කිරීමට සිදුවේ. අපගේ අරමුණ වන්නේ, ඔවුන්ගේ ජාතිකත්ව භාවමය, සිරිත් විරිත් ආදී වෙනස්කම් ද්විතීක කරමින් ඔවුන් පංති බලවේග ලෙස සංවිධානය කිරීමත්, ඔවුන් තුළ ඇති සංස්කෘතිමය වෙනස්කම් ද්විතීක කොට ඔවුන් තුළ එක්සත් බව ගොඩනැගීමයි. එවිට අපට විවිධ සංස්කෘතීන් සහිත විවිධ ජන කොටස් සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීමට සිදු වේ. එහිදී සංස්කෘතිය පිළිබඳ අපගේ විග්‍රහය තුළ හිඳිමින්ම ඔවුන්ගේ විවිධ සංස්කෘතිත ලක්ෂණ පිළිබඳ විවෘත මතයකින් කටයුතු කිරීමට අපට සිදු විය හැකිය. ඔවුන් තුළ ඇති ඇතැම් පසුග ාමී, වැඩවසම් ආසියාතික හෝ ධනේශ්වර ලක්ෂණ සමඟ ගැටුමකට අප නොයන්නේ, ඒවා වෙනස් කිරීමට නම් ඒවා බිහිවීමට අවශ්‍ය පදනම් සැකසූ භෞතික පාර්ශවයන් වෙනස් නොකොට ඒවා පමණක් වෙනස් කළ නොහැකි බව අප දන්නා නිසාය. එසේ නොමැතිව අප ඒවා අනුගමනය කරන නිසා නොවේ.

මාක්ස්වාදීන් වන අප සමාජ විඥානය වෙනස් කිරීමට නම් සමාජ සත්තාව වෙනස් කළ යුතු බව දනිමු. උත්තර් නිර්මිතය වෙනස් කිරීමට නම් සමාජ ආර්ථික පදනම වෙනස් කළ යුතු බව දනිමු. එවිට උත්තර් නිර්මිතයේ ඇති අංග ලක්ෂණයන් වෙනස් කිරීමට වියුක්ත අරගලයක් කිරීමේ අවශ්‍යතාවයක් අපට ඇති නොවේ. අප ඒවා වෙනස් කරන්නේ, පංති අරගලය මගින්මය. සමාජ විප්ලවය හරහාමය.

එහෙත් සමාජ විප්ලවය කිරීමේ සැබෑ වුවමනාවක් නැති, එය විලාසිතාවක් බවට පත් කර ගත් සුළු ධනේශ්වර මානසිකත්වයක් සහිත පුද්ගලයන්ව ඔවුන්ගේ එම සුළු ධනේශ්වර ස්වභාවය විසින්ම සංස්කෘතිය පිළිබඳ අවිද්‍යාත්මක භාවිතාවක් වෙත තල්ලු කර දමනු ලබයි. එවිට ඔවුන්ට සමාජයේ ඇති පසුගාමී යැයි හඳුනා ගන්නා සංස්කෘතික ලක්ෂණවලට එරෙහිව කරන්නා වූ අරගලය ප්‍රමුඛ අරගලය බවට පත් වේ.

එසේ නම් අප නිර්ධන පංති සංස්කෘතියක් ගොඩ නැගීම පිළිබඳ කතා කරන්නේ මන්දැයි යන ප්‍රශ්නය නිතැතින්ම පැන නගී. අප ඉහතින් නම් කළ වර්ගයේ ගුරුකුලවල නියෝජිතයින් නිර්ධන පංති සංස්කෘතිය යන්න තේරුම් ගන්නේ, ඉතාම යාන්ත්‍රිකවය. නිර්ධන පංති සංස්කෘතිය යනු සංස්කෘතික ලක්ෂණ සමාජ සංවර්ධනයට ගැලපෙන ලෙස යොදා ගැනීමයි. ධනපති ක්‍රමය තුළ නිර්ධන පංති සංස්කෘතිය පවතින්නේ, අධ්‍යාත්මික ක්ෂේත්‍රය තුළ පමණි.

නිර්ධන පංති සංස්කෘතිය අප ගොඩ නැගිය යුත්තේ, අනාගත කොමියුනිස්ට් සමාජය ඉලක්ක කර ගත් සංස්කෘතිය එය වන නිසාය. අප එය ගොඩනගන්නේ, එක්වරම සමාජය තුළ නොවේ. ධනපති ක්‍රමය තුළදී නිර්ධන පංති සංස්කෘතියක් ගොඩ නැගිය හැකි වන්නේ, නිර්ධන පංති පක්ෂය තුළ පමණි. එනම් සමස්ත සමාජය හා සංසන්දනය කළ විට ප්‍රමාණාත්මකව ඉතා කුඩා පිරිසක් අතර වේ. එය ගොඩ නැගෙන්නේ, හුදු සටන්පාඨ හෝ දර්ශනීය වාග් පාඨ තෙපලීමෙන් නොව විප්ලවීය අරගලයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය තුළදීය. 'අප විප්ලවවාදීන් බවට පත්වූයේ අරගලය තුළදී' යැයි වරෙක චේ පැවසීය.

ඒවා එසේ තේරුම් නොග න්නා ඇතැමෙක් ව්‍යුක්ත ලෙස නිර්ධන පංති සංස්කෘතිය ගොඩ නැගීමට කතා කරති. අරගලයේ විවිධ තත්වයන් තුළදී විවිධ තැන්වල භාවිතයට නගා ගත් ක්‍රමවේදයන් නිරපේක්ෂ ලෙස ගැලපීමට උත්සාහ කරති. එහෙත් එය නිවැරදි නොවේ. අනෙක් අතට නිර්ධන පංති සංස්කෘතියේ මූලික අංග ලක්ෂණ පැන නගින්නේ, නිර්ධන පංතිය වෙත වන අසීමිත ප්‍රේමයත් අධිරාජ්‍යවාදයත් ධනේශ්වර ක්‍රමයත් වෙත ඇති පංති වෛරයත් තුළිනි.

චේ ගුවේරා සහෝදරයා ගැන සඳහන් කරමින් පිදෙල් සහෝදරයා මෙසේ පවසයි.

''අධිරාජ්‍යවාදය කෙරෙහි වූ වෛරයකින් හා අප්‍රලකින් යුත් පූර්ණ ශක්තියකින් ඔහු පිරී සිටියේය. ඔව්, සීමාන්තික ජාතිවාදය හා ස්වාර්ථකාමිත්වය යන වචනවලින් ඔහුට වැඩක් නොවීය. ඕනෑම රටක ජනතාවක් වෙනුවෙන්, ඕනෑම රටක ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් අවශ්‍ය වූ විටෙක තම රුධිරය හෙළිමට ඔහු සූදානමින් සිටියේ කිසිදු පැකිලීමකින් තොරවය.

''චේ ඔහුගේ චාම් බවත්, චරිතවත් බවත්, තාත්වික බවත්, සහෝදර ආකල්පයත් ඔහුගේ පෞරුෂයත්, යථා බවත් නිසා ඔහුගේ අනෙක් චරිතවත් හා අසමසම ගුණාංග නොදන්නා අය විසින් වුවත් වහාම ආදරය කරනු ලැබීමට ලක්වන වර්ගයේ පුද්ගලයන් අතරින් කෙනෙකු විය. විප්ලවවාදියෙකු වශයෙන් නියම කොමියුනිස්ට් වාදියෙකු වශයෙන් ඔහු තුළ සදාචාර හරයන් කෙරෙහි අසීමිත විශ්වාසයක් විය. ඔහුට මිනිසාගේ හෘද සාක්ෂිය කෙරෙහි අසීමිත විශ්වාසයක් විය. මානව සමාජයේ කොමියුනිස්ට්වාදය ගොඩනැගීමේ මූලික ධාරකය වශයෙන් ඔහු සදාචාරාත්මක සම්පත් පූර්ණ පැහැදිලි බවකින් යුතුව දුටු බව අප කිව යුතුය''

පිදෙල් කැස්ත්‍රෝ - 1967 ඔක්තෝබර් 18

සුළු ධනේශ්වර මානසිකත්වයෙන් යුතු තැනැත්තාට නිර්ධන පංති සංස්කෘතිය යනු තවත් එක් විලාසිතාවකි. ඔහුට වැදගත් වන්නේ, අසීමිත පංති ප්‍රේමයත් අධිරාජ්‍යවාදය කෙරෙහි වන වෛරයත් තුළින් පැන නගින අභ්‍යන්තර ගුණාංගයන් නොව බාහිර හැඩ තලයන්ය. ඔවුන්ට වැදගත් වන්නේ, විප්ලවවාදී භාවිතාව නොව විප්ලවවාදී පෙනුමය.

පක්ෂය තුළ ගොඩ නැගෙන්නා වූ නිර්ධන පංති සංස්කෘතිය අප ජීවත්වන සමාජයේ සංස්කෘතික ලක්ෂණ විසින් තත්වාරෝපණය වේ. අප ජීවත්වන සමාජයේ සදාචාරයන්, සිරිත් විරිත් නොසලකා හරිමින් ව්‍යුක්ත සංස්කෘතිත භාවිතායකට පක්ෂයට යා නොහැක.

අපගේ උත්සාහය වන්නේ, ධනවාදයට එරෙහි ජනතාව පෙළගැස්වීමය. ධනවාදයට එරෙහිව ජනතාව සටනට කැඳවීමයි. ඒ සඳහා අප ජනතාව සමඟ මතවාදී හා සංවිධාන අරගලයක් කර ගත යුතු වේ. එය සාර්ථක වන්නේ, අප ජනතාව අතර හිඳිමින් ඔවුන්ගෙ 'ම කොටසක් බවට පත්වෙමින් ඔවුන්ට නායකත්වය සපයන විටදීය. ඒ සඳහා අපට ඔවුන්ට තේරෙන භාෂාවෙන් කතා කිරීමටත් ඔවුන්ට වැටහෙන අයුරින් ලිවීමටත් ඔවුන්ගේ ජීවිතය සමඟ ඓන්ද්‍රිය සම්බන්ධයක් ගොඩ නගා ගැනීමටත් සිදු වේ.

එහෙත් සුළු ධනේශ්වර පුද්ගලයාට එය අදාළ නොවේ. ඔහුගේ වුවමනාව වන්නේ, ජනතාවගෙන් වෙන් වූ විදග්ධ විප්ලවවාදී චරිතයක් ලෙස පෙනී සිටීම මගින් වටිනාකමක් දිනා ගැනීමයි. ඒ සඳහා ඔහුට අභ්‍යන්තරික ගුණාංගයක් ලෙස නොපවතින විප්ලවවාදී පෙනුමක් ආරූඪ කර ගැනීමට සිදු වේ. විදග්ධ භාෂාවකින් ලිවීමට සිදු වේ. එලෙස කතා කිරීමට සිදු වේ. එහිම තර්කානුකූල ප්‍රතිඵලය ලෙස අවසානයේදී ජනතාවගෙන් වෙන්ව ගුරුකුල බවට පත් වේ.


අද පක්ෂය තුළ ගොඩ නගන්නා වූ නිර්ධන පංති සංස්කෘතිය අනාගත කොමියුනිස්ට් සංස්කෘතියේ මූලික අංග ලක්ෂණ උරුම කර ගත්තකි. කොමියුනිස්ට් සමාජය ගොඩ නැගීම ආරම්භ කරන්නේ, සමාජවාදය තුළ දීය. එබැවින් එය ගොඩ නැගීමට සිදුවන්නේ, ධනවාදය විසින් නිර්මාණය කළ සංස්කෘතික පදනම මතය. ධනවාදය විසින් උරුම කරන ලද සාධනීය ලක්ෂණයන් රඳවා ගනිමින්, නිෂේධනීය ලක්ෂණයන් බැහැර කරමින් හා නව ගුණාංග යන් එක් කර ගනිමින් වඩා උසස් තලයක දී එය ගොඩ නංවනු ලැබේ. අනාගත ජගත් සංස්කෘතිය වන එය බිහිවන්නේ, මිනිසා නිර්මාණය කරන ලද සියලුම සංස්කෘතික ලක්ෂණයන්ගේ එකතුවෙනි.



සංස්කෘතික ආක්‍රමණයක් යනු හරියට අපේ අහස, අපේ හිරු, අපේ තරු අපට නොපෙනෙන්නට මුවා කරගෙන සිටිනා කොල පිරි විශාල ගසක් වගේය. ඒඅනුව අප හමුවේ ඇති භාරදූර කාර්යය වනුයේ අපට උරුම අපේම හිසට උඩින් ඇති අපේම අහස දැක ගන්නට මේ දැවැන්ත ගස කපා මාවත හෙළි කිරීමයි.

**වික්ටර් හාරා**

# කලාවට නිර්වචනයක් සොයා...



කලාව පිළිබඳව කරගන්නා අධ්‍යයනයකදී, කලාව පිළිබඳව වන සංවාදයකදී මගහැර යා නොහැකි අත්‍යාවශ්‍ය කරුණක් තිබේ. ඒ කලාව යනු කුමක්ද? යන ප්‍රශ්නයට නිවැරදිම පිළිතුර සොයා ගැනීමය. නැත්නම් ''කලාව'' නිවැරදි ලෙස නිර්වචනය කරගැනීමය. ඕනෑම ප්‍රපංචයක් නිර්වචනය කරගැනීමේදී අදාල ප්‍රපංචයේ අඩංගුව, හරය හා එහි ප්‍රධාන ජාති ලක්‍ෂණ ඒ තුළ නිවැරදිව සංයුක්ත විය යුතුය. නොඑසේනම් යමක් දෙස මතුපිටින් බලා එහි තමතමන්ට සංවේදී වූ අංග ලක්‍ෂණ කිහිපයකගෙන් එකක් පදනම්කරගෙන නිර්වචනයන් කරන්නේනම් ඒවා බොහෝ විට එක්කෝ අසම්පූර්ණ වේ. නැත්නම් සාවද්‍ය වේ. 'කලාව' යනු කුමක්ද යන්න නිර්වචනය කරගැනීමේදී ඉහත කරුණු කෙරෙහි අවධානය යොමුකිරීම වැදගත්ය.

## කලාව යනු කුමක්ද?

ලෝකයේ විවිධ යුගවල විසූ විවිධ කලාකරුවන් විසින් කලාව සඳහා විවිධ නිර්වචනයන් ලබාදී තිබේ. පුරාණ රෝම කලාකරුවෙක් වූ සීසරෝට අනුව ''කලාව යනු සොබාදහම නිරීක්‍ෂණය කිරීම හා එය ගවේෂණය කිරීම'' වේ. මේ අතර භරතමුනි පවසා ඇත්තේ, ''කලාවේ අරමුණ රස ජනනයයි'' යනුවෙනි. සුප්‍රසිද්ධ රුසියානු ගත්කරු ලියෝ තෝල්ස්තෝයි 'කලාව යනු කුමක්ද?' නම් සිය කෘතියේ මෙසේ සඳහන්කර තිබේ. ''කලාව වූකලී මිනිසා විසින් දියුණු කරනු ලැබූ උත්කෘෂ්ට වූද, සම්භව්‍ය වූද, වේදිතයන් අන්‍යයන් වෙත සම්ප්‍රේෂණය කිරීම අරමුණු කරගත් මානව කාර්යයකි.'' තෝල්ස්තෝයි එසේ පවසද්දී ප්‍රවීණ ලේඛකයෙක් වූ හැයිජ් නැමැත්තා කලාව ගැන පවසා ඇත්තේ, ''සෞන්දර්යාත්මක සත්‍යයක් නිපදවීමේ ශක්‍යතාවය ඇති දෙය කලාවයි.'' යනුවෙනි.

## කලාවට මාක්ස්වාදී නිර්වචනයක්

කලාව පිළිබඳ ඉදිරිපත්ව ඇති ඉහත සඳහන් හා තවත් බොහෝ නිර්වචන සාවද්‍ය නොවූවද ඒවා අසම්පූර්ණ බව පෙනේ. ඒවා තුළ කලාවේ ගුණාංග කිහිපයක් හෝ පෙනුම අන්තර්ගත වුවත් කලාවේ සියලු ගුණයන් හා ජාති ලක්‍ෂණයන් සංයුක්ත වීමක් ඒවා තුළ දැකිය නොහැක. එය අඩුවකි. කලාව පිළිබඳ මාක්ස්වාදී නිර්වචනය අපට වැදගත් වන්නේ මෙහිදීය. එය කලාවේ ප්‍රධාන ගුණයන් හා ජාති ලක්‍ෂණ සංයුක්ත කොට ඉතාම කෙටියෙන් ඉදිරිපත් කර තිබේ. වී. ජී. අපනාසියෙව්ගේ ''මාක්ස්වාදී දර්ශනයේ මූලධර්ම'' නම් කෘතියේ එය මෙසේ සඳහන් වේ. ''ප්‍රකෘතිය සෞන්දර්යාත්මක ලෙසින් මිනිස් මනසේ පිළිඹිබු වීම කලාව වේ.'' යනුවෙනි. කලාව පිළිබඳව නිවැරදි අංග සම්පූර්ණ හා එහි සියලු ජාති ලක්‍ෂණ අඩංගු කරගත් නිර්වචනයක් ලෙස ඉහත නිර්වචනය අන් නිර්වචන සියල්ලට වඩා ඉදිරියෙන් සිටී. ඉන් කියවෙන්නේ, කලාව හෙවත් සෞන්දර්යය යනු මිනිස් මනසේ ඇති හැකියාවක් හෙවත් ගුණයක් බවය. මිනිසාද ඇතුළත් අප අවට වන ප්‍රකෘතිය (ස්වභාවධර්මය) ඒවා පවතින ලෙසින්ම මිනිස් මනසේ පරාවර්තනය වෙනවා වෙනුවට ඒවා සෞන්දර්යාත්මක ප්‍රතිරූප ලෙස පරාවර්තනය වීම කලාව බව ඉන් කියවේ.

## කලාව පවතින්නේ කොතැනද?

කලාව පිළිබඳ ඉහත නිර්වචනය හරිහැටි අවබෝධ කර නොගතහොත් කලාව පවතින්නේ, ප්‍රකෘතියේ භෞතික වස්තූන් තුළද නැතිනම් මිනිස් මනස තුළදැයි විවාදයක් මතුවිය හැක. විඥානවාදයට නොවැටී සිටිමින්ම ඉහත මාක්ස්වාදී නිර්වචනය හොඳින් විග්‍රහකර බලන විට පැහැදිලි වන්නේ, කලාව හෙවත් සෞන්දර්යය පවතින්නේ, භෞතික වස්තූන් තුළ නොව මිනිස් මනස තුළ බවය. කලාව හෙවත් සෞන්දර්යය යනු මිනිස් මනසේ ගුණයක් හෙවත් හැකියාවක් ලෙස පවතින දෙයකි. භෞතික වස්තූන් හෝ සිදුවීම් මිනිස් මනස තුළ භෞතික වස්තූන් ලෙසම පරාවර්තනය විය හැකිවාක් මෙන්ම භෞතික වස්තූන් හා සිදුවීම් මිනිස් මනස තුළ සෞන්දර්යාත්මක ලෙසද පිළිඹිබු විය හැකිය. ඒ අනුව කලාව උපදින්නේ මිනිස් මනස තුළ එහි ගුණයක් නැතිනම් ජාති ලක්‍ෂණයක් ලෙසය.

අපේ ග්‍රහ ලෝකයේ ''චින්තනය'' සහිත එනම් සිතීමේ හැකියාව සහිත එකම සත්වයා මිනිසාය. එකී චින්තනය මිනිස් මොළයේ ක්‍රියාකාරිත්වය තුළ උපදින්නක් වන අතර එය මිනිස් මොළයේ විශේෂ හැකියාවක් ගුණයක් නැතහොත් ජාති ලක්‍ෂණයක් වේ. මිනිස් මොළය යනු අනෙක් අතට ද්‍රව්‍යයකි. එය එහි පරිණාමය තුළ සිතීමට හැකි ද්‍රව්‍යයන් හෙවත් සිතන ද්‍රව්‍යයක් දක්වා වර්ධනය වී තිබේ. කලාව හෙවත් සෞන්දර්යය උපදින්නේ, මෙම 'සිතන ද්‍රව්‍යය' හෙවත් මිනිස් මොළයේ පවතින ගුණයක්, හැකියාවක් ලෙසය. ඒ අනුව කලාව හෙවත් සෞන්දර්යය පවතින්නේ, භෞතික වස්තූන් තුළ නොව මිනිස් මනස තුළය. මිනිස් චින්තනය තුළය.

## ගඟක සෞන්දර්යය නොදකින මාලුවා

ඉහත කරුණ උදාහරණ කීපයකින් පැහැදිලි කර ගැනීමට අපට පුළුවන. තමා අවට ඇති පරිසරයේ භෞතික වස්තූන් හෝ සිදුවීම් සෞන්දර්යාත්මක ලෙස දකින්නේත් එය සෞන්දර්යාත්මක ලෙස අන් අයට සම්ප්‍රේෂණය කරන්නේත් මිනිසා පමණි. කිසිම සතෙක් පරිසරය සෞන්දර්යාත්මකව නොදකින අතර මිනිසුන් අතර පවා මේ ගුණය පවතින්නේ සමානව නොවේ. අඩුවැඩි වශයෙනි. සිය තෙළි තුඩින් මනරම් සිතුවමක් බවට පත්වන රුස්ස ගසක, චිත්‍ර ශිල්පියා දකින සෞන්දර්යය ලී මුදලාලි කෙනෙක් දකින්නේ නැත. ඔහුට එම ගස පෙනෙන්නේ, එහි වට අඩි ප්‍රමාණය හා මූල්‍ය වටිනාකම සහිත දෘෂ්ටියකිනි. ගලා යන ගඟුලක සෞන්දර්යය දැකීමට ඒ දෙස බලා සිටින මිනිසා සමත් වුවද එහි පිහිනා යන මාළුවන් එම සෞන්දර්යය දකින්නේ නැත. මලක සෞන්දර්යය වර්ණනා කරන කවියා මිස ඉන් පැණි උරා බොන මී මැස්සා හෝ සමනලයා එහි සෞන්දර්යය දකින්නේ නැත.

භෞතික වස්තූන් දෙස බැලීමේදී මිනිසා පවා එය හැමවිටම සෞන්දර්යාත්මකව දකින්නේ නැති බවත්, කිසියම් වස්තුවක් එක් පුද්ගලයෙකුගේ මනසේ සෞන්දර්යාත්මකව පිළිඹිබු වෙද්දී එම වස්තුවම තවත් කෙනෙකුගේ මනසේ පිළිඹිබු නොවන බවටත් උදාහරණ ඕනෑතරම් සොයාගත හැක. රෑ අහසේ බබලන සඳ දෙස බලමු. භෞතික විද්‍යාඥයෙකුට, තාරකා විද්‍යාඥයෙකුට සඳ යනු අජීවී භෞතික වස්තුවකි. එය පෘථිවියේ උප ග්‍රහයාය. එයට තමාගේම ආලෝකයක් නැත. එය සූර්යාලෝකය පරාවර්තනය කරයි. එහෙත් කවියෙකුගේ කවි සිතුවිලි තුළ එම සඳ පරාවර්තනය වන්නේ කෙසේද? විටෙක වළාකුළු නැමති දුහුල් සළුව අතරින් එබී බලන 'සඳවතිය' වේ. තවත් විටෙක තරු කැළ පිරිවරාගත් 'සඳ රැජින' වේ.

ආරියවංශ රණවීර කවියා සිය ''සරා සඳ'' නම් කවි පෙලෙහි සඳ දකින්නේ මෙසේය.

*අත්තෙන්*
*අත්ත*
*අතහැර*
*යන්න*
*සඳ*
*යා යුතු නිසා*

*නිත්තෙන්*
*දිලෙන*
*සඳ මත*
*අතු පතර*
*දල්වා තබා*

ඒ අතර පරාක්‍රම කොඩිතුවක්කු කවියා එම සඳම සිය කවියක මෙලෙස දැක තිබේ.

*රෑයේ රෑ මහ මැදියම*
*වාට්ටුවේ සුදු වීදුරු*
*ජනේලයකින්*
*බෙහෙත් වතුර වගේ ඇලෙන*
*පින්න යටින්*
*දුටුවා මං*
*අහස් ගැබේ දියවෙන සඳ*
*ඩිස්ප්‍රින් පෙත්තක් විදියට*

ඉදින් මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ, කලාව හෙවත් සෞන්දර්ය පවතින්නේ, භෞතික වස්තූන් තුළ නොව මිනිස් මනසේ බවය. එය මිනිස් මනසේ විශේෂ ගුණයක් හා හැකියාවක් බවය. එහෙත් කලාව භෞතික වස්තූන්ගෙන් වියුක්ත නොවේ. මන්ද කලාත්මක ප්‍රතිරූප ලෙස මිනිස් මනසේ පිළිඹිබු වන්නේ, ස්වභාදහම හෙවත් ප්‍රකෘතියම වන බැවිනි. ඒ අනුව කලාවේ විෂයමූල පදනම ප්‍රකෘතිය හෙවත් ස්වභාදහම වන අතර එය කලාව බවට පත්වන්නේ, මිනිස් මනස තුළදී එහි සෞන්දර්යය සමගය. එය කලාවේ ද්‍යලෙක්තිකය නිරූපනය කරයි. ස්වභාදහම හෙවත් ප්‍රකෘතිය කලාත්මක ප්‍රතිරූප ලෙස පිළිඹිබු වන්නේ, මිනිස් මනසේය. එසේම මිනිස් මනස තුළ කලාත්මක ප්‍රතිරූප ලෙසත් පිළිඹිබු වන්නේ ප්‍රකෘතිය වේ. එබැවින් කලාව යනු ප්‍රකෘතියේත් මිනිස් මනසේ සෞන්දර්යාත්මක හැකියාවේත් අන්තර් සම්බන්ධය හා අන්තර් රඳා පැවැත්ම මත පිළිඹිබු වන දෙයකි.

## දෙවියන් මැවූ මිනිසා

කලාව මිනිස් මනසේ ගුණයක් යැයි කියන විට කලාව පවතින්නේ, භෞතික වස්තු තුළ නොව මිනිසාගේ මනසේ ගුණයක් ලෙස යයි කියන විට සියලු විඥානවාදීන් විසින් එය තමන්ගේ වාසියට වැරදි ලෙස අර්ථකථනය කිරීමේ ඉඩක් තිබේ. එහෙත් එය එසේ නොවේ. අතීතයේ සිටම කලාව දෙවියන්ගේ නිර්මාණයක් ලෙස සැලකීමට බොහෝ දෙනා පුරුදුව සිටිති. කලාවට අධිපති දෙවඟන ලෙස සරස්වතිය සලකන්නේද ඒ අනුවය. කලාව එහි සැබෑ නිර්මාතෘවරුන් මෙන්ම එහි සැබෑ හිමිකරුවන් වන පොදු ජනතාවගෙන් ඉවත්කොට මිනිසාට ඉහළින් වන්දනාමාන කිරීමට පාරිශුද්ධ තත්වයට නගාලනු ලැබූයේ, පංති සමාජය ආරම්භ වූ කාලයේ සිටමය. කලාව පොදු ජනතාවගෙන් ඉවත් ඉවත්කර රජුන් පිනවන දෙයක් කිරීමටත් කලාකරුවාද අනියමින් දේවත්වයට නැගීමටත් මෙම සංකල්පය යොදාගන්නා ලදී. එහෙත් පැහැදිලිවම කලාව දෙවියන්ගේ නිර්මාණයක් නොවේ. දෙවියන් පවා මිනිසාගේ කලාත්මක නිර්මාණයකි. සැබැවින්ම සිදුව තිබෙන්නේ, දෙවියන් විසින් මිනිසා හෝ කලාව නිර්මාණය කළා නොව මිනිසා විසින් දෙවියන් නිර්මාණය කිරීමය.

අප කලින්ද සඳහන් කළ පරිදි මිනිස් මනසේ පිළිඹිබු වන්නේ, අප අවට ඇති ප්‍රකෘතිය හෙවත් සොබාදහමය. මිනිසා සිය පංචේන්ද්‍රියයන් මගින් සොබාදහම හා එහි සංසිද්ධි සංජානනය කරයි. තම මනස තුළ පරාවර්තනය කරගනී. මිනිසාගේ පංචේන්ද්‍රයන්ගේ හැකියාවන් සීමිත නිසාම සොබාදහම මිනිසා තුළ පරාවර්තනය වන්නේ, එහි හරයෙන්ම හා අංග සම්පූර්ණව නොවේ. ප්‍රකෘතිය හරයෙන් හා වඩාත් නිවැරදිව පරාවර්තනය කරගැනීම සඳහා මිනිසාට විද්‍යාත්මක උපකරණ මෙන්ම තාර්කික දැනුමද අවශ්‍යවෙයි. කෙසේ වෙතත් මිනිසාගේ පංචේන්ද්‍රයන්ගේ මෙම සීමිත හැකියාව නිසා තමා අවට ප්‍රකෘතිය වටහා ගැනීමට නොහැකිවූ මිනිසා එසේ වටහා ගැනීමට නොහැකි දේවලට, සිදුවීම්වලට දේවත්වයක් ආරෝපණය කරන ලදී. එයද මිනිසාගේ මනසේ වූ නිර්මාණශීලීත්වයේම ප්‍රතිඵලයක්ද වේ. කෙසේ වෙතත් හැමවිටම මිනිස් මනසේ පිළිඹිබු වන්නේ, මිනිස් චින්තනය තුළ පවතින්නේ, තමා අවට සොබාදහම තුළින් මිනිසා හඳුනාගත් හැඩතලයන්ය. වස්තූන්ය. වර්ණයන්ය. ඉන් බැහැරවූ දේවල් තම මනස තුළ පරාවර්තනය කිරීමට මිනිසාට නොහැක. එහෙත් ඔහු තුළ වන සෞන්දර්යයේ හැකියාව නිසා, නිර්මාණශීලීත්වය නිසා ස්වභාදහම තුළ තමන් දුටු තමා තුළ පරිවර්තනය වූ සැබෑ භෞතික වස්තූන් මිනිස් මනස තුළ වෙනස් ලෙස, විකෘති ලෙස පරාවර්තනය කර ගැනීමට මිනිසා සමත්ය. දෙවියන් මෙන්ම යකුන්ද මිනිසාගේ නිර්මාණයක් වන්නේ එසේය.

දෙවියන් විසින් නිර්මාණය කරන ලද කිසිදු වස්තුවක් හෝ කලා කෘතියක් මිහිමත නැත. සොබාදහම විසින් නිර්මාණය කළ දේ හැර අන් සියල්ල මිනිසාගේ නිර්මාණයන්ය. දෙවියන් හා යකුන් පවා මිනිසාගේ නිර්මාණයක් වන්නේ, එසේය. මිනිසා තම රූපකාය තේජස් වී අතිශයෝක්තියකට නැගීම මගින් දෙවියන් නිර්මාණය කළ අතර තම රූපකායම අවලක්‍ෂණ හා බියකරු අතිශයෝක්තියට නැගීම තුළින් යකුන් නිර්මාණය කළේය. සියලු දෙවියන් හා සියලුම යක්‍ෂයින්ගේ අතිශයෝක්තියට නංවන ලද උපාංග, වර්ණ හා කොටස් ඉවත් කළ විට ඉතිරි වන්නේ මිනිස් රූපයකි.

මේ සියල්ලෙන් අප පැහැදිලි කරගත යුත්තේ, කලාව හෙවත් සෞන්දර්යය මිනිස් මොළයේ පවතින ගුණයක් නැතිනම් හැකියාවක් බවත් මිනිස් මොළයේ සෞන්දර්යාත්මක ලෙස පිළිඹිබු වනුයේ, සොබාදහම හෙවත් ප්‍රකෘතිය බවත් ඒ අනුව කලාව යනු ප්‍රකෘතියේත් මිනිස් මොළයේත් (චින්තනයෙන්) අන්තර් සම්බන්ධය තුළ බිහිවන දෙයක් බවත්ය. කලාව පිළිබඳව වන විඥානවාදී විග්‍රහයන් මෙන්ම පාරභෞතිකවාදී විග්‍රහයන්ද හඳුනාගෙන එය පරාජය කිරීම සඳහා කලාව පිළිබඳව වන මාක්ස්වාදී නිර්වචනය අතිශයින්ම වැදගත් වේ.

**මතු සම්බන්ධයි**

# කැටය කඩා සූදු කෙළීම හෙවත් අර්ථසාධක මංකොල්ලය



**රා**ජපක්ෂ පාලනය පසුගියදා හදිසියේම අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කළේ, අරමුදලේ මුදල් තමන්ට අවශ්‍ය පරිදි ආණ්ඩුවට ගැනීමට ඉඩ ලැබෙන පරිදිය. නව සංශෝධනය ආණ්ඩුවේ ඇති කෝකටත් අත උස්සන 2/3 බලය නිසා පාර්ලිමේන්තුවේදී සම්මත කර ගන්නා ලදී. එම සංශෝධනයට ජ.වි.පෙ ඇතුළු විපක්ෂයම විරුද්ධ විය. නමුත්, විපක්ෂයේ විරෝධය තැකීමට තරමවත් නොවන බව ආණ්ඩුවේ බහුතරයේ අදහස විය.

ආණ්ඩුවේ නව අර්ථසාධක සංශෝධනය සමාන වන්නේ, බේබදු පියකු තමන්ගෙම දරුවන්ගේ කැටය කඩා අරක්කු බීමටය. සූදු කෙළීමටය. සූදුවටත් සූරාවටත් ඇබ්බැහි වූ එවැනි පියවරු මුලින් කරන්නේ, දරුවන්ට නොදැනෙන ලෙස දරුවන්ගේ කැටය කඩා ටිකෙන් ටික මුදල් ගෙන තමන්ගේ සූදුව සූරාව පවත්වාගෙන යාමය. ආණ්ඩුවද එහෙමය. මුලින්ම ආරම්භ කළේ බේබදු පියාගේ ඒ ක්‍රමයය. මුලින්ම සේවකයින්ට විශ්‍රාම වැටුපක් ලබාදීමට යෝජනා කළේය. පෙනුමෙන් උපරිම ජනහිතකාමීය. තමන් කම්කරුවන් වෙනුවෙන්ම පෙනී සිටින පාලකයෙක්ය යන්න පෙන්නුම් කිරීමට උපරිම උත්සාහයක් දැරීය. නමුත් ජ.වි.පෙ. ද මැදිහත් වීමෙන් වැඩකරන ජනතාවට කරුණු වටහාදීමත් සමග ඔවුන් උද්ඝෝෂණ කළ නිසා යෝජිත ප්‍රෝඩාකාරී විශ්‍රාම වැටුප් යෝජනාව ඉවත් කර ගැනීමට ආණ්ඩුවට සිදුවිය.

ඊළඟට ආණ්ඩුව අර්ථසාධක කැටය කැඩීමට උත්සාහ කළේ, අර්ථසාධක අරමුදලේ මුදල් තම අභිමතය පරිදි කොටස් වෙළඳපොළේ ආයෝජනය කිරීමට යෙදවීමෙන්ය. සේවක අර්ථසාධක අරමුදලින් රු.මිලියන 26,900ක් සහ සේවා නියුක්ති අරමුදලින් රු.මිලියන 2,700 ක්ද කොටස් වෙළඳපොළේ යොදවා ඇත. කොටස් වෙළඳපොළ යනු අවදානම අධික, මුදල් යොදවන තවත් සූදු පොළකි. පුද්ගලයකු පෞද්ගලික කොටස් මිළදී ගැනීමකට කොටස් වෙළඳ පොළේ යොදවන්නේ නම් ප්‍රතිලාභය හා අවදානම දෙකම ඔහු දරාගත යුතුයි. තමන්ගේ මුදල් සඳහා පුද්ගලයෙකු අවදානම හා ප්‍රතිලාභය යන දෙකම දරාගෙන කොටස් වෙළඳපොළට අවතීර්ණ වීම හා අනුන්ගේ මුදල් සඳහා ආණ්ඩුවක් එම සූදුවට මැදිහත් වීම දෙයාකාරයකි. සේවක අර්ථසාධක අරමුදලේ ඇති මුදල් ආණ්ඩුව තම අභිමතය පරිදි කොටස් වෙළඳපොළට යොදා එමගින් ලැබෙන ලාභාංශයක් සේවකයින්ට දෙන්නේ යැයි තර්ක කරන්නේනම් කොටස් වෙළඳපොළේ ගණුදෙනු මගින් සිදුවිය හැකි පාඩුවක අලාභයද ඒ ලෙසටම ප්‍රතිලාභ වැඩ කරන ජනතාවට බෙදාදෙන බව තේරුම් ගතහැකිය. සේවකයා කිසිවිටකත් නොදන පාඩුවකට හිමිකරු වීමේ අවදානම ඒ නිසා පැනනගී.

අර්ථසාධක අරමුදලේ පමණක් මේ වනවිට ඇති ප්‍රතිලාභීන්ගේ දායක මුදල් ප්‍රමාණය රු. කෝටි ලක්ෂයක් ඉක්මවන බව දැනට වාර්තාවේ. 2010 අගෝස්තු 31 දිනට පැවැති මුදල් ප්‍රමාණය රු. බිලියන 852ක්ය. ආණ්ඩුවට දරාගත නොහැකි වී ඇත්තේ මේසා විශාල මුදලක් ආණ්ඩුවට හිතේ හැටියට වියදම් කිරීමට නොහැකි වීමයි. ඒ නිසා දැන් පියවරෙන් පියවර අර්ථසාධක අරමුදල මංකොල්ලකෑම ආරම්භ කර ඇත්තේය.

රාජපක්ෂ පාලනය නැව ගිලුනත් බැන් චූන් මට්ටමෙන් ක්‍රියාකළද මේ වනවිට පත්ව ඇත්තේ දැඩි මූල්‍ය අර්බුදයකටය. 2010-12-31 දිනට ඩොලර් බිලියන 6.6ක් වූ විදේශ වත්කම් සංචිතය මේ වනවිට ඩොලර් බිලියන 6ක් දක්වා පහත වැටී ඇත්තේය. යුද්ධය අවසන් වනවිට ඩොලර් බිලියන 8කට ආසන්න මට්ටමේ පැවැති විදේශ වත්කම් සංචිතය මෙලෙස කඩා වැටීම විසින්ම ආණ්ඩුවේ මූල්‍ය අස්ථාවරයේ තත්වය තේරුම් ගත හැකිය. කොටස් වෙළඳපොළේද තත්වය එයමය. මූල්‍ය ක්ෂේත්‍රයේ සිටින ප්‍රවීණ සූදුකරුවන් කිහිප දෙනෙකු අත හිතාමතා විකිණීමේ අගය වැඩි කිරීමේ සූදුවෙන් කොටස් මිළ ඉහළ ගියද මේ වනවිට එහි සාපේක්ෂ ලාභය සූදුකරුවන් ලබාගෙන අවසන් නිසා කොටස් වෙළඳපොළද සීඝ්‍ර කඩාවැටීමකට ලක්ව ඇත. ආණ්ඩුවට දැන් ආර්ථිකයේ පාලනයට ඉතිරිවී ඇත්තේ, විකල්ප මාර්ග දෙකක් පමණි. ඒ, එක්කෝ තවත් ණය ගැනීමය. නැතිනම් මුදල් ඇති අරමුදල් ආණ්ඩුවේ ප්‍රයෝජනයට ගැනීමය. කොටස් වෙළඳපොළ ආර්ථිකය කෘත්‍රිමව පිනවීමකි. නමුත් අර්ථසාධක අරමුදල මංකොල්ලකෑම එසේ කෘත්‍රිම කොල්ලකෑමක් නොව සත්‍ය ලෙසම වැඩකරන ජනතාවගේ මුදල් මංකොල්ලකෑමකි.

## අර්ථසාධක අර්ථය

අර්ථ සාධක අරමුදල නිර්මාණය වී ඇත්තේ, සම්පූර්ණයෙන්ම සේවකයින්ගේ හා හාම්පුතුන්ගේ මූල්‍ය දායකත්වයෙන් පමණි. ඒ සඳහා ආණ්ඩුවේ මුදල් දායකත්වයක් ඇත්තේ නැත. සේවක අර්ථ සාධක අරමුදල මහා භාණ්ඩාගාරය යටතේ පාලනය නොවන්නේ එහි ඇති ස්වාධීනත්වය ආරක්ෂා කිරිමට නිසාවෙනි. එහි මුදල් මහා බැංකුවේ මුදල් මණ්ඩලය යටතේ භාරකාර වගකීමෙන් පවතී. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතට අනුව මෙම අරමුදලේ මුදල් යෙදවිය හැක්කේ, නිශ්චිත ලෙසම රජයේ වගකීම යටතේ පමණි. රජයේ අවශ්‍යතාවයන්ට ණය දීමට ඇති හැකියාව යොදා ගෙන දැන් ආණ්ඩුව වෙනත් ව්‍යාපාරික කටයුතු වලටද අර්ථ සාධක අරමුදල යොදාගෙන ඇත.

රු.ට්‍රිලියනයකට (බිලියන 1000කට ආසන්න මුදලක් ඇති මෙම අරමුදලේ මුදල් මේ වනවිට ආණ්ඩුව තමන්ගේ අභිමතය අනුව යොදාගෙන ඇති ආකාරය 1 වගුවේ සඳහන්ය.

| භාර අරමුදලේ අයෝජන 2011 නොවැම්බර් | |
|---|---|
| රජයේ සුරැකුම්පත්වල | බිලියන 120 |
| කෙරවලපිටිය විදුලිබල ව්‍යාපෘතියට | බිලියන 3 |
| කොටස් වෙළඳපොළ අයෝජන | බිලියන 7.5 |
| ස්ථාවර තැන්පතු ණයකර | බිලියන 2.5 |
| එකතුව | බිලියන 133 |

I වගුව

## අර්ථසාධක ප්‍රාසාදය

අර්ථසාධක අරමුදලේ අරමුණ සේවකයින් විශ්‍රාම යන වයසට පත් වූ විට ඔවුන්ට යැපීම සඳහා පාරිතෝෂික අරමුදලක් ලෙස කටයුතු කිරීමයි. ඒ වෙනුවෙන් 60 ලක්ෂයක් වන පෞද්ගලික අංශයේ සියලුම සේවකයින්ගේ වැටුපෙන් 8%ක් හා හාම්පුතාගෙන් 12%ක් බැගින් කපා හැර මෙම අරමුදල ගොඩනගා ඇත්තේය. සේවකයාගේ විශ්‍රාම කාලය කල් පිරුණු පසු ඔහුගේ යැපීම සහතික කරන්නේ, මෙම අරමුදල විසින්ය. නමුත් රාජපක්ෂ පාලනය පාර්ලිමේන්තුවට සංශෝධනයක් ඉදිරිපත් කර සිදු කර ඇත්තේ, සේවකයාගේ යැපීමේ අරමුදල ආණ්ඩුවේ යැපීමේ මාර්ගය බවට පත් කිරීමය. එම අරමුදලින් තිස් මහල් ප්‍රාසාදයක් ඉදි කිරීමට වැය වන මුදලෙන් ''යම් මුදල් ප්‍රමාණයක්'' ගැනීමට හැකි වන පරිදි පනත සංශෝධනය කරන ලදී. එය 'යම් මුදල් ප්‍රමාණයක්' යන්න අසීමිත බැවින් මෙම සංශෝධනයට උපරිම සීමාවක් යෙදිය යුතු යැයි ජ.වි.පෙ කළ සංශෝධනය ප්‍රතික්ෂේප කිරීමෙන්ම ආණ්ඩුව අර්ථසාධක අරමුදල මුළුමනින්ම මංකොල්ලකෑමේ වුවමනාවෙන් කටයුතු කරන බව පැහැදිලිය.

යෝජිත එවැනි මන්දිරයක් ඉදිකළහොත් එය ලංකාවේ උසම ගොඩනැගිල්ල වනු ඇත. උසම හා ලොකුම දේවල් ඉදිකිරීම රාජපක්ෂ ආණ්ඩුවේ මෝස්තරයක් වී ඇති බව පැහැදිලිය. නමුත් ආණ්ඩුව උසම දේවල් හදන්නට උත්සාහ කරන්නේ, ජනතාවගේ ශ්‍රමයේ ප්‍රතිඵල ඉහළින්ම සූරාකෑමෙන් වීම අපට ඇති ගැටලුවයි.

රුපියල් ට්‍රිලියනයක මුදල් ඇති අර්ථසාධක අරමුදල කොල්ලකෑමට දරන මෙම උත්සාහයට අවශ්‍ය නීතිමය පහසුකම ආණ්ඩුවේ කෝකටත් අත උස්සන බහුතරය මගින් හදාගැනීමට ආණ්ඩුව සමත් වුවද එය යුක්ති සහගත කිරීමට ආණ්ඩුවට නොහැකිය. වැඩකරන ජනතාවගේ කැටය පොළොවේ ගසා ආණ්ඩුව මහා මුදල් මංකොල්ලයක් සිදු කිරීමට සූදානම්ය. පසුගිය දෙසැම්බර් 18 වනදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ සේවක අර්ථසාධක අරමුදල් සංශෝධන පනතේ මූලික අවශ්‍යතාවය එය විය. ලංකාවේ වෙනත් අරමුදල් ඇතත් ඒවායේ මුදල් නැත. ඇත්තේ කඩදාසිවල සටහන් කරන ඉලක්කම් අගයන් පමණි. අර්ථසාධක අරමුදල ඉන් වෙනස් වන්නේ, එය පැහැදිලි ලෙසම වැඩකරන ජනතාවගේ හා හාම්පුතුන්ගේ දායක මුදල් සහිත අරමුදලක් වීමය නිසාවෙන්ය. ඒ මුදල් ඇති අරමුදලකි. ආණ්ඩුව මුහුණ දී සිටින දැවැන්ත ආර්ථික අර්බුදය හමුවේ තම පැවැත්ම සඳහා දැන් ආණ්ඩුවට අවශ්‍යව ඇත්තේ, පොත්වල සටහන් වන ඉලක්කම් මුදල් නොව සැබෑ ලෙසම සේප්පුවල ඇති මුදල්ය. සේවක අර්ථසාධක අරමුදලට අත තැබීමේ ආණ්ඩුවේ වුවමනාව එය වේ. සේවා නියුක්ති භාර අරමුදලද අර්ථසාධක අරමුදල මෙන්ම ආණ්ඩුවේ හිතුමතේට අනුව යොදාගෙන ඇත. භාර අරමුදලේ 2011 නොවැම්බර් වන විට සිදු කර ඇති රුපියල් බිලියන 133ක ආයෝජන මගින් ඒ බව ඔප්පු වේ. (II වගුව)

II වගුව

2011 නොවැම්බර් වන විට අර්ථසාධක අරමුදලේ මුදල් අයෝජනය කර තිබූ ආකාරය

| | මුදල (රු.මිලියන) | ප්‍රතිශතය |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 866,890 | 88.4% |
| රුපියල් ණය ලෙස රජයට | 23,100 | 2.4% |
| කොටස් වෙළඳපොළේ (ලැයිස්තුගත) අයෝජන | 73,412 | 7.5% |
| ලැයිස්තුගත නොකළ සමාගම්වල ආයෝජන | 4481 | 0.4% |
| බැඳුම්කර | 7490 | 0.8% |
| Repo ගණුදෙනු | 3118 | 0.3% |
| භාණ්ඩාගාර සහතිකපත් | 2119 | 0.2% |
| එකතුව | 980,610 | 100% |

ජේසුස් වහන්සේ පැවසුවේ යැයි ඉතිහාසයේ සඳහන් වන්නේ, ''දෙවියන්ගේ දේ දෙවියන්ටය. සීසර්ගේ දේ සීසර්ටය'' කියාය. වර්තමාන කොල්ලකාරී ධනවාදයේ පීතෘවරුන් වන රාජපක්ෂ පාලනය දෙවියන්ගේ දේත් සීසර්ගේ දේත් එකවර කොල්ලකන වර්ගයේ පාලනයකි. එක අතකින් බදු ගසා බර පටවන්නේද පාරිභෝගිකයා ලෙස පෙනී සිටින වැඩකරන ජනතාවටය. එවිට තම වැටුපෙන්

15වැනි පිටුවට



අපට අවශ්‍ය වී තිබෙන්නේ, අපගේ අව්‍යාජ අසමවේත සබඳතා, විශේෂයෙන්ම මුදල් හා බැඳුණු සබඳතා වනසා දමා විශ්වයත් සූර්යයාත් මහ පොළොවත් මානව සංහතියත් ජාතියත් කුටුම්භයත් සමඟ ජීවමාන සමවේත සබඳතා යළි පිහිටුවා ගැනීමයි. හිරුගෙන් පටන් ගනු. එවිට අන් සියල්ල හෙමින් සිදුවනු ඇත.

**ඩී.එච්. ලෝරන්ස්**

# රාජ්‍යය බිහිකළේ

# දෙවියන්ද? යුද්ධද? සම්මුතීන්ද?



රාජ්‍යයේ සම්භවය පිළිබඳව පෙරදිග මතයන් සහ ඒ පිළිබඳව තවත් මතයන් බිහිවීමට නූතන යුගයේ තෝමස් මුවර්, ඉරාමස්, මාටින් ලූතර් හා කැල්වින්ගේ බලපෑම් පිළිබඳව අප පසුගිය කලාපය තුළින් සාකච්ඡා කරන ලදී. මෙවරද එවැනි මත කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරමු.

**රජුන් තනන්නේ දෙවියන් බව**

රාජ්‍යය බිහිවීම පිළිබඳව මත ගවේෂණයේදී අපට ප්‍රධාන සංකල්ප කිහිපයක් හමුවේ. දෙවියන් විසින් රාජ්‍යය නිර්මාණය කොට පාලකයෙකුද පත්කොට ඔහුට බලය පවරා ඇතැයි යනුවෙන් මතයක් පවතී රාජ්‍යයන්හි උපත පිළිබඳව පැරණිම මතවාදය මෙය වන අතර මෙය ''දේව වරම්වාදය'' යනුවෙන් හැඳින්වේ.

මෙම මතයට අනුව පාලකයා මිහිපිට දෙවියන්ගේ නියෝජිතයා වන අතර දිව්‍යමය නීතිරීති සහ නියෝග අනුව ඔහු විසින් යටත් වැසියා පාලනය කළ යුතුය. පාලකයා කෙතරම් කෲර වුවත් ඔහුට විරුද්ධ වීමට ජනතාවට අයිතියක් නොමැත.

මේ පිළිබඳව ක්‍රිස්තු ධර්මයේ මුල් අවධියේ දේශකයෙකු වූ ශාන්ත පාවුල් මෙසේ පවසා ඇත. ''සියලු දෙනාම තමන්ට ඉහළින් ඇති බලයට යටත් විය යුතුය. දෙවියන් වහන්සේගේ බලය හැර අන් බලයක් නැත. දෙවියන් වහන්සේගේ අභිෂේක ලත් බලයට (වැසියන්) යටත් විය යුතුය.'' - (නව ගිවිසුම - ශුද්ධ බයිබලය)

තවද පෙරදිගදීද මෙම මතය ක්‍රි.පූ. සියවස් ගණනාවකට පෙර ලියවුණු 'මනුෂ්මුනි' කෘතියේ මෙලෙස සඳහන් වේ. ''ආරාජිකත්වය හේතුකොට ගෙන වෙහෙසට පත්ව සිටින මිනිසුන්ගේ ආරක්ෂාව සඳහා දෙවියන් වහන්සේ විසින් රාජ්‍යය නිර්මාණය කොට පාලකයන් පත්කළ බවත් පාලකයා වූකලී මිනිස් වේශයෙන් මිහිපිට හැසිරෙන දෙවියන් වහන්සේ බවත් මිනිසුන් ඔහුට ශාප නොකළ යුතු බවත්'' සඳහන් වේ.

භගවත් ගීතාවේද මිහිපිට වසන මිනිසුන්ගේ පාලකයා තමන් බව ක්‍රිෂ්ණ දෙවියා පැවසූ බව සඳහන් වේ.

මධ්‍යතන යුගයේදී (ක්‍රි.ව. 400-1400) ක්‍රිස්තියානි සභාවේ මහා දාර්ශනිකයා හැටියට සැලකෙන තෝමස් ඇක්වයිනාස් විසින් මෙම මතයට සංශෝධන එක්කරන ලදී. එනම් ඔහුට අනුව මිනිස් ජීවිතයේ වඩා උසස්වූ යහපත වෙනුවෙන් ඇපකැපවූ සංවිධානය වන පල්ලියටත් එහි උත්තරීතර නායකයා වන රෝමයේ පාප් වහන්සේටත් ලොව පුරා සෑම පාලකයෙකුම යටත්විය යුතුය. එනිසා පාලකයා පාප්ට අවනත විය යුතු බවත් අවධාරණය කළේය.

එබැවින් මධ්‍යතන යුගයේ අවසන් දශක කීපය දක්වා රාජ්‍යයේ පාලකයන්ගේ බලතල සම්බන්ධයෙන් වලංගුවූයේ ඉහත තෝමස් ඇක්වයිනාස් මැදිහත්වී සිදුකළ දේව වරම්වාදයේ සංශෝධනයයි.

එහෙත් 15 වන සියවසේ අවසාන දශක කීපය තුළ පාලකයා පාප්ට අවනත විය යුතුය යන මතය වෙනස්වී දේවවරම්වාදය පිළිබඳව පැරණි අර්ථකථනය යුරෝපා දේශපාලනය තුළ නැවත ඉස්මතු වන්නට විය. ඊට යුරෝපයේ ධනවාදයේ නැගිටීම තෝමස් මුවර්, මාටින් ලූතර් වැන්නන් රාජ්‍යය පිළිබඳ පල්ලියේ බලපෑම්, පාප්ගේ සර්ව බලධාරී බලය ආදිය විවේචනයට ලක්කිරීම වැනි කාරණාද හේතුවිය.

එලෙසම මෙකල ගොඩනැගුණු රාජාණ්ඩුවල අසීමිත බලය යුක්තිසහගත කිරීම සඳහා දේවවරම්වාදය යොදා ගනිමින් යුරෝපා රාජාණ්ඩු පාලනයන් නව න්‍යායක්ද ගොඩනගන ලදී. අසාහය ඒකාධිපති රාජාණ්ඩුවක් ක්‍රියාත්මක කළ ෂ ජේම්ස් (1605-1625) රජු ගේ එම න්‍යායේ නිර්මාතෘවරයා ලෙස සැලකෙයි. ඔහුගේ පාලනයට මහජනතාවගේ සහයෝගය නොලැබුණු අතර රජු සහ පාර්ලිමේන්තුව අතර අර්බුදය ආරම්භ වූයේද මොහුගේ පාලන කාලයේදීය. මෙවන් වටපිටාවක් තුළ පාලකයා යුක්තිසහගත කිරීම සඳහා මෙම න්‍යාය බිහිවූ බව ඉතා පැහැදිලිය.

එහි මූලික ලක්ෂණ මෙසේය.

01 දෙවියන් කෙලින්ම පාලකයාට බලය පවරා ඇති අතර පාලකයා ක්‍රියාවට නගන්නේ, දෙවියන්ගේ කැමැත්තය.

02 අධිකාරී බලය පදනම් කොටගෙන පාලකයා විවිධ නීති සකසනු ලැබේ. එබැවින් පාලකයා නීතිවලට ඉහළින් සිටී.


03 පාලකයා පනවන නීතිවලට යටත් වැසියා ප්‍රශ්න කිරීමකින් තොරව යටත් විය යුතුය. පාලකයාගේ නීතිවලට නියෝගවලට විරුද්ධ වීමට ජනතාවට අයිතියක් නොමැත.

04 පාලකයාගේ ක්‍රියාවලට එරෙහිවීම දෙවියන්ටද එරෙහිවීමක් වන බැවින් එය බරපතළ දඬුවම් ලැබිය යුතු අපරාධයකි.


05 යටත් වැසියාගේ ජීවිතය හා මරණය පිළිබඳ අවසාන බලය පාලකයා සතුය.

06 පාලකයා වූ කලී සෑම අතින්ම දෙවියන් නියෝජනය කරන දෙවියන්ගේ මිහිපිට නියෝජනය වේ.


එහෙත් මෙම කොන්දේසි මගින් පාලකයාගේ අත්තනෝමතිකභාවය මෙන්ම කෲරත්වය සාධාරණීකරණය කළද පසුව ඇතිවූ තත්වයන් හේතුවෙන් එම කෲර පාලකයන් පෙරළීමට ජනතාවට ඇති අයිතිය පිළිගැනීමටද පාලකයන්ට සිදුවිය. එවැනි තත්වයන් සනාථ කිරීම සඳහා කෲර රාජ්‍ය පාලකයා රාක්ෂයින් විසින් එවන ලද බවත් එවැනි පාලකයෙකු රාජ්‍යයෙන් පහකිරීම හෝ මරා දැමීම යෝග්‍ය බවත් ආදී මතද නිර්මාණය විය. එබැවින් ඉහත කරුණු කාරණා සැලකීමෙන් පෙනී යනු ලබන්නේද දේවවරම්වාදය බිහිවූයේ, රජගේ බල ඒකාධිකාරිය සාධාරණය කිරීමට බවය.



Thomas Hobbes



John Locke



Jan Jack Russo

**යුද්ධයෙන් රජෙකු උපදින බව**

රාජ්‍යයේ සම්භවය පිළිබඳව තවත් මතයක් වන්නේ, ''බලවාදය'' යන්නයි. සංක්ෂිතව ගත්කල මෙහි අදහස වන්නේ, යුද්ධයෙන් රජෙකු උපදී යන්නයි. නැතහොත් ශක්තිමත් තැනැත්තා විසින් දුර්වලයන් මැඩපැවැත්වීමෙන් ඇතිවන ප්‍රතිඵලය රාජ්‍යය වේ.

ජර්මනිය තුළ සීඝ්‍රයෙන් වර්ධනය වූ ජාතිකවාදයට සහය දැක්වීමට අපේක්ෂා කළ දාර්ශනිකයන්ගේ කාර්යභාරය බලවාදයේ වර්ධනයට බලපෑවේය. එවන් ජර්මන් දාර්ශනිකයෙකු වූ නිට්ෂේට (Nietzsche). අනුව රාජ්‍යයේ උත්තරීතර බලය මෙහෙයවන තැනැත්තාට තම කැමැත්ත යටත් වැසියන් කෙරෙහි පැනවිය හැකිවන්නේ, තමන්ගේ ආත්ම ශක්තිය බලය මත පදනම්ව ක්‍රියාවට නැගුවහොත් පමණි.

තවත් දාර්ශනිකයෙකු වූ ට්‍රෙයිස්කි පවසා සිටියේ, රාජ්‍ය වූ කලී ආක්‍රමණික ක්‍රියා සඳහා සංවිධානය කරන ලද පොදු බලයක් බවය. රාජ්‍යයේ ප්‍රථම කාර්යය වන්නේ, යුද්ධ කිරීම හා යුක්තිය පරිපාලනය කිරීමයි. මෙයද පාලකයන්ගේ අත්නෝමතිකත්වය සාධාරණීකරණය කිරීමට ගෙන එන ලද්දකි.

මෙයට අමතරව රාජ්‍යයේ සම්භවය පිළිබඳව පීතෘ මූලික හා මාතෘ මූලිකවාදය, විකාශනාත්මකවාදය ආදි වාද කිහිපයක් පවතී. එහෙත් දැනට වැඩිපුරම සාකච්ඡාවට බඳුන්වී ඇති මතය වන්නේ, සමාජ සම්මුතිවාදයයි. අප මෙම මතවාදය පිළිබඳව මදක් අවධානය යොමු කරමු.

සම්මුතියකින් එන රාජ්‍යය මිනිසුන් අතර ඇති වූ සම්මුතියක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය බිහිවූ බවට මතයක් පවත්නා අතර ඒ සමාජ සම්මුතිවාදය යනුවෙන් හැඳින්වේ. මෙම වාදය ඉදිරිපත්කළ ප්‍රධාන පුද්ගලයන් තිදෙනෙකි.

01 තෝමස් හොබ්ස් (එංගලන්තය, ක්‍රි.ව. 1588-1679)

02 ජොන් ලොක් (එංගලන්තය, ක්‍රි.ව. 1632-1704)

03 ජීන් ජැක් විස් රූසෝ (ප්‍රංශය, ක්‍රි.ව.1712-1778)

නමුත් මේ පුද්ගලයන් තිදෙනා විවිධ වකවානුවලදී වෙනස් අරමුණු සඳහා මෙම වාදය යොදාගෙන ඇති බව ඔවුන් ජීවත්වූ වටපිටාවේ සමාජ, ඓතිහාසික හා දේශපාලනමය කරුණු අධ්‍යයනයේදී අපට පෙනී යනු ඇත.

තවද මොවුන් මෙම සම්මුතිවාදය ගොඩනැගීම සඳහා මූලික කරගත් උපකල්පන කිහිපයකි.

01 ස්වභාවික සමාජය හෙවත් ප්‍රකෘතිය තුළ මිනිසා ගතකළ ජීවිතය.

02 සමාජ සම්මුතිය මගින් සිවිල් සමාජයට ප්‍රවිෂ්ඨවී සංවිධානය කරගැනීම සහ සිවිල් ආණ්ඩු පිහිටුවා ගැනීම.

තොමස් හොබ්ස් (ක්‍රි. ව. 1588-1679)

රෙපරමාදු ආගමික පූජකතුමෙකුගේ පුතෙකු වූ හෝබ්ස් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ඇත. I ජේම්ස් රජුගේ පාලන කාලය සහ 1649 I චාල්ස් රජුගේ මරණය දක්වා කාල පරාසය තුළ රාජ්‍ය පාලනය හෝබ්ස්ගේ කෘති තුළ අන්තර්ගත වේ.

I ජේම්ස් රජු අත්තනෝමතික පාලකයෙක් වූ අතර එනිසා ජනතාවගේ සහාය ඔහුට නොලැබුණි. එසේම පාර්ලිමේන්තුව සහ ඔහු අතරද ගැටුමක් පැවතුණු අතර 1625 දී ඔහුගේ මරණින් පසු රජකමට පත්වූ I චාල්ස්ගේ පාලන සමයේදී එය උග්‍ර අතට පෙරලුණි. ඔහුට විරුද්ධ වූ පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් සිරභාරයට ගැනීමට පවා I චාල්ස් රජු පෙළඹුණි. රජු හා පාර්ලිමේන්තුව අතර ඇතිවූ මෙම අර්බුදය රට තුළ සිවිල් යුධ තත්වයක් ඇති කිරීමට සමත්විය. රාජපාක්ෂිකයින් හා පාර්ලිමේන්තුවාදීන් අතර හටගත් මෙම යුද්ධයෙන් I චාර්ල්ස් රජු පරාජයට පත්වූ අතර 1649 දී ඔහුගේ හිස ගසා දමන ලදී. ඉන්පසු පාර්ලිමේන්තුවාදීන් මෙහෙයවූ ඔලිවර් ක්‍රොම්වේල් පොදු රාජ්‍ය මණ්ඩලය නමින් අලුත් ආණ්ඩු ක්‍රමයක් හඳුන්වාදී 1658 දක්වා එකී පාලන ක්‍රමය තුළ ඒකාධිපති පාලනයක් ක්‍රියාත්මක කළේය.

එනිසා හොබ්ස් ජීවත්වූ වකවානුව තුළ එංගලන්තයේ මතුව තිබූ මෙම අස්ථාවර හා ආරාජික තත්වයන් වෙනුවට අසීමිත බලතල සහිත රජෙකු යටතේ ශක්තිමත් පාලනයක් ගොඩනැගීමට හොබ්ස්ට අවශ්‍ය විය. ඒ සඳහා අවශ්‍ය කරන මතවාදීමය දායකත්වය Leviathun or God man කෘතියෙන් ඔහු අවධාරණය කරන ලදී.

අසීමිත බලතල සහිත රාජාණ්ඩුවක් ඉලක්ක කරගනිමින් තම මතය මෙහෙයවූ හොබ්ස්ට අනුව ප්‍රකෘති සමාජය තුළ මිනිසා ගතකළ ජීවිත වූ කලී කෲර අධම හා අවුල් වියවුල්වලින් පිරි කෙටි එකක් වේ. එසේම තම පැවැත්ම පමණක් මුල්කරගනිමින් බලය සඳහා එය පිටුපස දුවන මෘගයින් වැනි මිනිසුන්ගෙන්ද එය සමන්විත වී තිබුණි. තවද ඔවුන් පාලනය කිරීමට බලයක් සහිත පාලන ක්‍රමයක්ද නොවීය.

එබැවින් හොබ්ස් පවසන ආකාරයට ප්‍රකෘති සමාජයෙන් සිවිල් සමාජයට අවතීර්ණ වූ ජනයා තමන් අතුරින් කෙනෙකු තම පාලකයා ලෙස තෝරාපත්කරගෙන එම පාලකයා හට තමන් බුක්තිවිඳි සියලු බලතල හා අයිතිවාසිකම් පවරා දෙනු ලැබේ. මෙනිසා පාලකයාට අසමාන බලයක් හිමිවේ. නීතිය වූ කලී ඔහුගේ ආඥාවන්ය. හොබ්ස්ගේ සමාජ සම්මුති නියමය අනුව පාලකයා සම්මුතියේ කොටස්කරුවෙකු නොවේ. එනිසා පාලකයා කෙතරම් අත්තනෝමතික වුවත් ඔහුට එරෙහිව කටයුතු කිරීමට කිසිදු බලයක් ජනතාව හට නොමැත.

මේ අනුව පෙනී යන්නේ, අසීමිත බලතල ඇති රාජණ්ඩුවක් ඉලක්ක කරගනිමින් එය සාධාරණීකරණය කිරීම සඳහා සමාජ සම්මුතිවාදය හොබ්ස් විසින් යොදාගත් බවයි. මෙහි විශේෂය වන්නේ, දේවවරම්වාදයේදී මෙන් නොව මෙහිදී පාලකයා හට අසීමිත බලයක් ලබාදී ඇත්තේ, දෙවියන් විසින් නොව ජනතාව විසින් වීමයි.

# ගිනි ගන්නා නොරොච්චෝලේ සැබෑ කථාව

විදුලිය ජනතාවගේ දෛනික අවශ්‍යතාවයන් සපුරාලීමේදී ප්‍රධානතම කාර්යභාරයක් ඉටුකරනු ලබයි. එම නිසාම වර්තමානය වන විට විදුලිය අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් වන තරමටම එහි අදාලත්වය ප්‍රබල වී තිබේ. අපේ රටේ විදුලි පරිභෝජනය 40,82,067 කි. (හතලිස් ලක්ෂ අසූදෙදහස් හැට හතකි.) රටේ විදුලි අවශ්‍යතාවය දෛනිකව ගණනය කළ ඇති ආකාරයට ගිගා වෝට් 2170 කි. දැනට විදුලි බල මණ්ඩලය විසින් ප්‍රධාන ධාරාවන් තුනක් යටතේ විදුලි උත්පාදනය කරනු ලබයි.

01. ජල විදුලිය
02. තාප විදුලිය
03. සුළං බල විදුලිය

දැනට ජලය උපයෝගගි කරගෙන විදුලිය උත්පාදනය කරන බලාගාර 16 ක් තිබෙන අතර එමගින් මෙගාවෝට් 1207 ක් පමණ ජාතික විදුලි පද්ධතියට එක්කරනු ලබයි. සාමාන්‍ය ගණනය කිරිමට අනුව ජල විදුලි නිෂ්පාදනය සඳහා ඒකකයක පූර්ණ වියදම රු:7.50 කි. තාප බලාගාරවලින් ජාතික විදුලි පද්ධතියට එක්කරනු ලබන ප්‍රමාණය මෙගාවෝට් 548 කි. ඒ සඳහා ක්‍රියාත්මක බලාගාර ප්‍රමාණය 05 ක් වන අතර ඩීසල් යොදා ගනිමින් එම බලාගාර ක්‍රියාත්මක වන බැවින් විදුලි ඒකකයක නිෂ්පාදන වියදම රු:13.00ක් පමණ වේ. ඊට අමතරව සුළං බලය උපයෝගි කරගෙන විදුලිය උත්පාදනය කරන බලාගාර එකක් ඇති අතර එමගින් මෙගාවොට්ස් 03 ක් ජාතික පද්ධතියට එක්කරනු ලබයි.

අපේ රටේ විදුලියේ ආරම්භය 1885 දි පමණ කොළඹ ප්‍රදේශයට විදුලිය ලබා දී ඇත්තේ, බ්‍රවුස්ටර්ස් සහ සහෝදරයෝ සමාගම මගිනි. (BROWSTERS & BROTHERS -B&B) එය අපේ රටේ පළමු විදුලිය ලබාදීම බව ඉතිහාසයේ සඳහන් වේ. ඉන් පසුව 1905 දි පමණ සීමාසහිත කොළඹ ගෑස් සහ ජල සමාගම මගින් මහනුවර ප්‍රදේශයට විදුලිය ලබාදීමට කටයුතු කිරිමත් සමග පිට පළාත්වලට ව්‍යාප්ත කිරීම ආරම්භ වි තිබේ.

1912 දී පමණ එවකට පාලකයින් වූ ඉංග්‍රිසින් විසින් නුවරඑළිය බ්ලැක්ෆුල් නම් ප්‍රදේශයේ කුඩා ජල විදුලි බලාගාරයක් පිහිටුවන ලද අතර එය අපේ රටේ ජල විදුලිය සම්බන්ධයෙන් පළමු අත්දැකීම විය. විදුලි ව්‍යාප්තිය සිදුවීමට සාපේක්ෂව ඊට අදාල පරිපාලන යාන්ත්‍රණයක්ද සකස් විය. ඒ අනුව 1927 දී රාජ්‍ය විදුලි කර්මාන්ත දෙපාර්මේන්තුව ආරම්භ කරන ලද අතර ඉන් පසු රට පුරා විදුලි ව්‍යාප්තිය නිශ්චිත පරිපාලන ක්‍රමවේදයකට යටත්ව සැලසුම් සහගත ක්‍රියාවලියක් බවට පත්විය.

**තාප බලාගාර ආරම්භය**

ලංකාවේ පළමු තාප බලාගාරය ලෙස සැලකෙන්නේ 1929 දී පමණ කොලොන්නාව ප්‍රදේශයේ ආරම්භ කරන ලද තාප බලාගාරයයි. පසුව එය වෙනත් ප්‍රදේශයකට රැගෙන ගොස් තිබේ. දැනට මේ රට පිහිටුවා ඇති තාප බලාගාර සංඛ්‍යාව 05කි.

01. කැළණි තිස්ස තාප බලාගාරය
02. කැළණි තිස්ස චක්‍රීය තාප බලාගාරය
03. සපුගස්කන්ද තාප බලාගාරය
04. චුන්නාකම් තාප බලාගාරය (දැනට අක්‍රියයි)
05. නොරොච්චෝල තාප බලාගාරය

මෙම බලාගාරවලින් නොරොච්චචෝල හැරුණු විට ඉතිරි තාප බලාගාර සියල්ල ක්‍රියාත්මක වන්නේ ඩීසල් මගිනි. නොරොච්චෝල තාප බලාගාරය පමණක් ගල් අඟුරු යොදා ගනිමින් ක්‍රියාත්මක වේ.

**නොරොච්චෝල තාප බලාගාරය**

අපේ රට අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා වැසි ලැබෙන රටකි. එසේම සූර්ය තාපයද පාරිසරික අවශ්‍යතා සීමා ඉක්මවා අපේ පොළවට පතිත වේ. එහෙත් ඒ කිසිවකින් නිසි ප්‍රයෝජන ගැනීමේ දැක්මක් මෙතෙක් රට කරවූ පාලකයින්ට නොතිබූ බැවින් ඒවායින් ගත හැකි ප්‍රයෝජන පිළිබඳව විද්‍යාත්මක පරීක්ෂණයක නිරත වීමටවත් ඔවුහු උත්සුක නොවූහ. එහෙත් විවිධ ලාභ ප්‍රයෝජන අරමුණු කර ගනිමින් අපේ රටේ ස්ථාපිත කිරීමට අපහසු ව්‍යාපෘති ආරම්භ කිරීමට මෙම පාලකයින් උත්සාහ කිරීම පුදුමය දනවන කරුණක් නොවන්නේ, එහි අරමුණම සමාජ සුභසාධනය නොව පෞද්ගලික මූල්‍ය ලාභය වන බැවිනි. පුත්තලම දිස්ත්‍රික්කයේ නොරොච්චෝල නම් ප්‍රදේශයේ අක්කර 230 ක භූමි භාගයක් තුල නොරොච්චෝල තාප බලාගාරය පිහිටා තිබේ. මෙම බලාගාරය සඳහා පූර්ණ මූල්‍ය දායකත්වය චීන මහජන සමූහාණ්ඩුව දරණ අතර (EXIM) නම් බැංකුව මගින් ඊට අදාල ණය මුදල මුදාහැර තිබේ. එහි සියලු ඉදිකිරීම කටයුතු භාරව සිටින්නේ CHINA NATIONAL MECHENARY ) EQUIPMENT IMPORT) EXPORT CO-OPAERATION නම් සමාගමයි. මේ සඳහා ලංකා ආණ්ඩුව ලබාගෙන තිබෙන ණය මුදල ඇ.ඩො.මි. 455 කි. එය ලංකා මුදලින් රුපියල් මිලියන 50,000 ක් පමණ වේ. වසර 2006 මැයි මස එකොළොස්වන දින මෙහි ආරම්භක කටයුතු සිදුකළ අතර බලාගාරයෙන් අපේක්ෂිත මෙගාවොට් ප්‍රමාණය 900 කි. එය අදියර තුනකින් නිම කිරීමට අපේක්ෂිත අතර නිමා වීමේ වසර 2030 ලෙස ඇස්තමේන්තු කර තිබේ. දැනට පළමු අදියර ලෙස යැයි සඳහන් කරමින් ජාතික පද්ධතියට මෙගාවොට් 300 ක් එක් කරන බව ආණ්ඩුව පවසන ලදී.

**නොරොච්චචෝල ගිනිගැනීම**

2006 මැයි මස ආරම්භ කරන ලද මෙම ගල් අඟුරු බලාගාරය නිම කිරිම සඳහා ගතවන කාලය ලෙස චීන මහජන සමූහාණ්ඩුවේ ඉංජිනේරුවන්ගේ ගණන් බැලීම අනුව වසර 24 කි. එපමණ කාලයක් මේ සඳහා වැය වනු ඇත්තේ ගල් අඟුරු වැනි ඉතා වේගයෙන් දහනයට ලක් වන තාප ශක්ති ප්‍රභවයක ඇතිවිය හැකි අවදානම් සහගත බව අවම කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන් සහ ඊට අදාල යන්ත්‍ර සූත්‍ර මෙන්ම තාක්ෂණ ශිල්පීන්ද එහි ක්‍රියාකරුවන්ද හොඳම සූදානමකට පත්කිරිම සඳහාය. එහෙත් 2006 සිට 2009 දක්වා වසර තුනක කාලයක් ඉක්ම ගිය තැන මහින්ද රාජපක්ෂ ආණ්ඩුව හදිසි කර්තව්‍යයක් සේ සලකා පළමු අදියර යයි සඳහන් කරමින් එය විවෘත කිරිමට කටයුතු කරන ලදී. සැබවින්ම අපේ රටේ ජාතික විදුලි පද්ධතිය පුළුල් කිරිම හදිසි කාර්යයක් සේ සැලකීම වැරදි කටයුත්තක් නොවේ. එහෙත් අවශ්‍ය වන්නේ, එය කවරෙකුගේ හෝ බල ව්‍යාපෘතියක කොටසක් ලෙස සලකා හදිසි කිරිම නොව ජනතා අවශ්‍යතාවයට යටත්ව කඩිනම් කිරිමය.

නමුත් නොරොච්චෝල බලාගාරය 2009 දී විවෘත වුයේ, ඉහත ජනතා අවශ්‍යතාවය ප්‍රමුඛත්වයෙහිලා නොවන බව ඉතා පැහැදිලිය. එහි ප්‍රමුඛතාවය ලෙස සඳහන්ව තිබුණේ, මහින්ද රාජපක්ෂ මහතා දෙවන ජනාධිපතිවරණ තරඟයට ඉදිරිපත් වීමත් එම මැතිවරණයේ ජයග්‍රහණය යම් අභියෝග යකට ලක්ව තිබීමත්ය. එම නිසා ඔවුන්ගේ අපේක්ෂාව වුයේ නොරෙච්චචෝල බලාගාරය තම දේශපාලන අභියෝගය ජයගැනීම සඳහා මෙවලමක් ලෙස යොදා ගැනීමයි. ඊට අදාල කටයුතු සිදුකෙරුණු අතර, එම නිසා තම ජයග්‍රහණය වෙනුවෙන් විවිධ මෙහෙයුම් ක්‍රියාත්මක කරවන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ සම්පූර්ණයෙන් විධිමත් ලෙස නිමා නොවූ නොරෙච්චෝල බලාගාරය වැඩ නිමාවූ සේ ප්‍රසිද්ධ කරමින් විවෘත කිරිමට රාජපක්ෂ මහතා කටයුතු කරන ලදී. එහෙත් එමගින් සැබැවටම සිදුවී ඇත්තේ කුමක්ද? නොරච්චෝල බලාග ාරය 2009 නොවැම්බර් මාසයේ විවෘත කිරිමෙන් පසු ගෙවී ගිය මාස 26 ක පමණ කාලයෙන් එය ක්‍රියාත්මක වී ඇති මුළු කාලය මාස එකොළහකි. එනම්, මාස 15 ක් පමණ විවිධ හේතුන් නිසාවෙන් එහි ක්‍රියාකාරිත්වය ඇණ හිට තිබේ. මෙහිදි සිදුවන ප්‍රධානතම යාන්ත්‍රික දෝෂය වන්නේ, හදිසියේ ඇතිවන ගිනි ගැනීමයි. මෙලෙස ගිනි ගැනීමේ අවදානමක් ඇති නිසාම ඒ වෙනුවෙන් සැකසිය යුතු ආරක්ෂිත උපක්‍රම මෙන්ම යන්ත්‍ර සූත්‍ර සූදානම් කිරීමද අත්‍යවශ්‍ය කරුණක් වුවද ඊට අදාලව ගත යුතු අනිවාර්ය කාලය ලබා ගැනීමට එහි ඉංජිනේරුවන්ට ඉඩකඩ විවරකර ගැනීමට බාධා කිරිම මෙහි මතුවන ප්‍රධාන ගැටලුවයි.

මෙවන විටත් ගිනි ගැනිමේ හේතුවක් නිසාවෙන් අඛණ්ඩව මාසයක පමණ කාලයක් තිස්සේ නොරොච්චෝල බලාගාරය වසාදමා තිබේ. එහෙත් මෙම බලාගාරයේ විදුලි නිෂ්පාදනය සඳහා උපයෝගි කරගනු ලබන ගල් අඟුරු විදේශ රටවල් තුනකින් ගෙන්වනු ලබන අතර ඒ සඳහා විදුලි බල මණ්ඩලයට අනුයුක්තව වෙනත් සමාගමක්ද ස්ථාපිත කර තිබේ. එහෙත් නොරොච්චචෝල බලාග ාරය අක්‍රිය වුවද මෙම සමාගම සක්‍රියව පවතිනු ඇත. ඒ අනුව එම සමාගමට සභාපතිවරයෙක් සහ අධ්‍යක්ෂක මණ්ඩලයක්ද, සේවක සේවිකාවන් විශාල ප්‍රමාණයක්ද විදුලි බල මණ්ඩලය විසින් නඩත්තු කළ යුතුව ඇත. අඩු වියදම් වැඩි උපයෝගීතා යනුවෙන් ආර්ථික විද්‍යාවේ ඇති මූලධර්මය මත පිහිටා අති විශාල ණය මුදලක් ගෙන ආරම්භ කරන ලද මෙම බලාගාරයෙන් රටට වාසියක් වී නැති නමුත් ගනු ලැබූ ණය මුදල පොලියද සමඟ ගෙවීමට අපට සිදු වී ඇත.එය රටේ ආර්ථිකයට පහසුවක් නොව අතිරේක බරක් එක් කිරිමකි.

නොරොච්චෝල බලාගාරය ආරම්භ කරමින් මහින්ද රාජපක්ෂ මහතා එදා සදහන් කළේ, මෙම බලාගාරය නිසා අධික වියදමක් දරා පෞද්ගලික අංශයෙන් මිලදී ගනු ලබන විදුලි ඒකක ප්‍රමාණය සැලකිය යුතු මට්ටමකින් අඩුවන බැවින් ජනතාවට යම් සහන මිලකට විදුලිය ලබාදීමට කටයුතු කරන බවයි. එහෙත් ගෙවී ගිය මාස 24 ක කාලය තුළ විදුලි බිල වැඩි වුවා මිස අඩු වීමක් සිදුවුයේ නැත.

එමගින් තහවුරු වන්නේ, මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රකාශනය හුදු බොරු කීමක් නොව සාවද්‍ය ප්‍රකාශනයක් බවයි. බොරුවක් යනු සැලසුම් සහගත බවකින් තොරව යම් නිශ්චිත කරුණක් පිළිබඳව නොදන්නාකම නිසා හෝ යම් කරුණකින් තමන්ට හෝ තවකෙකුට අවැඩක් සිදුවීම වළක්වා ගැනීම හෝ අරමුණු කරගෙන කරනු ලබන සත්‍ය නොවන වචන මුදා හැරීමකි. එහෙත් සාවi ප්‍රකාශනයක් යනු යම් සැලැස්මක් සහිතව අනෙකා මුලා කිරිම අරමුණ කරගෙන හිතාමතාම කරනු ලබන අසත්‍ය ප්‍රකාශනයන්ය. ඒ අනුව රාජපක්ෂ මහතා නොරොච්චෝල බලාගාරය විවෘත කරමින් කරනු ලැබුවේ, බොරුවක් නොව සාවද්‍ය ප්‍රකාශනයකි. එහෙත් එය පුදුම විය යුතු කරුණක් නොවන්නේ, මෙවැනි පාලකයින්ගේ සම්පූර්ණ ක්‍රියාකාරිත්වයම සාවද්‍ය ප්‍රකාශනයන් වන බැවිනි.


අනෙක් අතට නොරොච්චෝල තාප බලාගාරය ගිනි ගැනීමත් ඒ නිසාම එය අක්‍රිය වීමත් පිළිබඳව තාක්ෂණ වි¡ාව පිළිබඳව කරුණු දන්නා ඉංජිනේරුවන්ගේ නිරීක්ෂණයට අනුව එය අහම්භයක් හෝ අත්වැරදීමක් නොවේ. ඔවුන් සඳහන් කරන්නේ, මෙවැනි සංවේදී ඉන්ධන දහනයට යොදා ගනු ලබන යන්ත්‍ර සූත්‍ර සඳහා කාල පරීක්ෂාව අත්‍යවශ්‍ය බවයි. සාමාන්‍ය ව්‍යවහාරය අනුව යන්ත්‍රයක් අදාල කාර්යය සඳහා පදම් කිරීම යනුවෙන් හඳුන්වන්නේ, මෙයම බව යාන්ත්‍රික විද්‍යාව සහ සාමාන්‍ය ප්‍රයෝගික විද්‍යාව දන්නා අයගේද නිගමනයයි. එහෙත් නොරොච්චෝල බලාගාරයේ සිදුවුයේ, ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. තම බල වුවමනාව ඉෂ්ට කර ගැනීම සඳහා රටේ ජාතික අවශ්‍යතාවයක් බිල්ලටදී තිබේ. එමගින් විනාශයට ලක්වන්නේ, අපේ රටේ ජාතික නිෂ්පාදනයයි. ජාතික නිෂ්පාදනය පාලකයින්ට පමණක් අයිති දෙයක් නොවේ.

එහෙත් මෙහි ඇති ඛේදනීය තත්වය වන්නේ, ජාතික නිෂ්පාදනයේ අයිතිකරුවන් එය තමන්ට හිමි දෙයක් බව නොදැන සිටිමයි. එම නිසාම මහින්ද රාජපක්ෂ වැනි නායකයන්ට විවිධ සංදර්ශන පවත්වමින් ජනතාව මුලා කිරීම හැර අන් මගක් නොමැති බවත්, ඔවුන් තම බල වුවමනාව වෙනුවෙන් ජන මනස ආක්‍රමණය කිරිමට නග්න ලෙස කටයුතු කිරීමත් අඛණ්ඩව සිදු කරනු ඇත. එයට එරෙහි ජන පෙළගැස්මක් සිදු නොවන්නේ, නම් අනාගතයේ තවත් බොහෝ වාර ගණනක් නොරොච්චෝල බලාගාරය මෙන්ම තවත් ව්‍යාපෘතිද ගිනිගැනීමටත්, අක්‍රියවීමටත්, අසාර්ථක වීමටත් කටයුතු පෙළගැසෙනු නියතය. එවැනි කුමන ආකාරයක දෙයක් සිදු වුවද ඒ සියල්ලේම බර ජනතාව මත පැටවීමටද මෙම පාලකයන් පසුබට නොවනු ඇත.

**''පාලකයන් ජනතාව රැවටීමට උත්සාහ කළ යුතු වන්නේ, ඔවුන් රවටා ගත හැකි යැයි තමන්ට කුමන ආකාරයකින් හෝ ඒත්තු යන්නේ නම් පමණි. ඒ සඳහා විවිධ උපක්‍රම යෙදිය යුතු අතර එහි සාර්ථකත්වය සෑම විටම අපේක්ෂා කළ යුතුය. එවැනි පාලකයින්ගේ විශේෂත්වය වන්නේ, ජනතාව රවටා ගැනීමේ උත්සාහය කිසි විට අත් නොහළ යුතු බවයි.''**

- මැකියාවේලි -





පොතේ උගත්කම ඇති අය නියම තේරුමෙන් උගතුන් බවට හැරවිය හැක්කේ කෙසේද? එකම මග ඔවුන් ප්‍රායෝගික වැඩට සහභාගී වී, ප්‍රායෝගික වැඩ කරන්නන් බවට පත්වීමට සැලැස්වීම, න්‍යායික වැඩවල යෙදී සිටින්නන් වැදගත් ප්‍රායෝගික ප්‍රශ්න අධ්‍යයනය කිරිමට සැලැස්වීම මගින් පමණි.

**මාඕ සේතුං**
**(තෝරාගත් ලිපි**
**195 පිටුව)**

# කාන්තාව පසුගාමී ද

කාන්තාව පිරිමියාට වඩා දුබලය: ඇය තවත් අයෙකුගේ රැකවරණය යටතේ ජීවත් විය යුතුය: ඇය දුර්වල සිතක් ඇත්තියකි: ඇය සියල්ල විඳ දරා ගත යුතුය; ඉවසා සිටිය යුතුය: සමාජමය කටයුතුවලට වඩා ගෙදර දොර පුද්ගලික වැඩ කටයුතුවලට ප්‍රමුඛතාව දිය යුතුය.

ඉහත සඳහන් ආකල්ප කාන්තාව සම්බන්ධයෙන් අප ජීවත්වන මෙම සමාජය තුළ මුල්බැසගෙන ඇති ආකල්පයන්ය. සමාජය තුළ පවතින මෙකී නොකී ආකල්ප ඉතා පසුගාමී මෙන්ම සමාජ සංවර්ධනයටද ඉතා හානිදායකය. එම ආකල්පයන්ගෙන් සමහර ඒවා පැරණි ආසියාතික සමාජයේ සිටම පැවත එන ඒවා වන අතර වත්මන් ධනපති සමාජයට ගැලපෙන අයුරින් සමහර ආකල්පයන් වෙනස් කොටද ඇත.

සමාජය තුළ පවතින මෙවැනි පසුගාමී ආකල්ප කාන්තාවන්ගේ ඉදිරිග මනටත්, ගරුත්වයටත් බාධා කරන්නක් වුවද ප්‍රශ්නය වනුයේ අපේ සමාජයේ බහුතරයක් කාන්තාවන් එකී ආකල්පයන් තුළ කැමැත්තෙන් හිරවී සිටීමට හිත හදාගෙන තිබීමය.

අප ජීවත්වන ධනවාදී සමාජය තුළ සෑම කෙනෙක්ම, සෑම දෙයක්ම වෙළෙඳ භාණ්ඩයක් බවට පත් වී හමාරය. එවන් පසුබිමක් තුළ සමාජ ආකල්ප නිර්මාණය කර ඇත්තේද වහල් හා පරාධීන තත්වයක් තුළ පීඩිතයන් දිගටම තබා ගනිමින් ශ්‍රමය සූරාකෑමටය. එසේ හෙයින් කාන්තාව සම්බන්ධයෙන් නිර්මාණය කර ඇති ආකල්පයන් තුළින් සිදුවන්නේද ඇය ශ්‍රම වහලියක් ලෙස, ලිංගික වහලියක් ලෙස හා පරාධීන සත්වයෙක් ලෙස තබා ගනිමින් ඇගේ ශ්‍රමය සූරාකෑම සාධාරණය කිරීමය.



### පසුගාමී ආකල්ප නිර්මාණය කළෝ කවුරුන්ද?

අප මිනිස් සමාජයක් ලෙස සංවිධානය වී ඇත්තේ අප සතු නිෂ්පාදන ක්‍රියාකාරිත්වය මත හෙයින් ද්‍රව්‍යමය නිෂ්පාදනය අප ජීවත්වන සමාජයේ පදනම වේ. සමාජයේ ජීවත්වන සියලුදෙනාට සිතීමේ හැකියාව ඇති නිසාම සිතුම් පැතුම්, විශ්වාසයන්, ආකල්ප, මතවාදවලින් පිරි පුද්ගල විඥානයක් එක් එක් පුද්ගලයාට තිබෙන අතරම එම පුද්ගලයා සමාජමය සත්වයෙක් වන නිසාම ඔහුගේ විඥානයද සමාජමය එකක් වේ. එකී සමාජ විඥානය, සමාජයේ ජීවත්වන මිනිසුන්ගේ ද්‍රව්‍යමය නිෂ්පාදනය සහිත ජීවිතයේ (සමාජ සත්තාවේ) ප්‍රකාශනයකි. ඒ නිසා සමාජ විඥානය නිර්මාණය කිරීමේ හා එය හැසිරවීමේ බලය හා අයිතිය ඇත්තේ නිෂ්පාදන බලවේග (නිෂ්පාදන මාර්ග) හිමිකාරිත්වය ඇති පාලක පංතියටය. එහෙයින් හැමවිටම යම් සමාජයක සමාජ විඥානය සකස් කරනු ලැබුවේ එකී සමාජයේ පාලක පංතියේ වුවමනාව මතය.

යම් සමාජයක සමාජ විඥානයේ පවතින ආකල්ප පසුගාමීද, ඉදිරිගාමීද යන්න තීරණය වන්නේ, එම සමාජයේ නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයේ ස්වභාවය අනුවය. එහෙයින් යම්කිසි රටක නිෂ්පාදන බලවේග වේගයෙන් සංවර්ධනය නොවන විට, තාවකාලිකව එකතැන පල්වෙන විට එම සමාජයත්, එම සමාජය තුළ වන බලවේගත් ඊට සාපේක්ෂව පසුගාමී වේ. එකී රටේ ජීවත්වන මිනිසුන්ගේ ද්‍රව්‍යමය ජීවිතය (සමාජ සත්තාව) පසුගාමී වන විට ඒ මත ගොඩ නැගෙන සමාජ විඥානයද පසුගාමී වේ.

මේ පිළිබඳව මාක්ස් හා එංගල්ස් විසින් ලියන ලද කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයේ මෙසේ සඳහන් කොට ඇත.
''ජීවන තත්වයන් සමග, එහි සමාජීය සබඳතාවයන් සමග, සමාජීය ජීවිතයෙහි ඇතිවන හැම වෙනස්වීමක් සමග මිනිසාගේ අදහස්, දෘෂ්ටිය සහ සංකල්පනා, එක වචනයකින් කියතොත්, ඔහුගේ සවිඥානය වෙනස් වන බව වටහා ගැනීමට විශේෂ ගැඹුරු බුද්ධියක් අවශ්‍ය වන්නේද? ද්‍රව්‍යමය නිෂ්පාදනය වෙනස් වන තරමට, ඊට සමානුපාතිකව අධ්‍යාත්මික නිෂ්පාදනය වෙනස් වන්නේ යැයි හැරුණු විට, සංකල්ප පිළිබඳ ඉතිහාසය වෙන කුමක් ඔප්පු කරන්නේද? හැම කාලයකම බලපෑ අදහස් එම කාලයේ පාලක පංතියේ අදහස් විය.''
පොදුවේ සමාජයක් ලෙස පවතින සිතුවිලි, මතවාද, ආකල්ප, සංකල්ප හා මනෝභාවයන් ප්‍රබල නිසාම ඒවායින් සමාජයට කළ හැකි බලපෑම විශාලය. එනිසා පසුගාමී සමාජ ආකල්ප විසින් සමාජයට සිදුකරනු ලබන බලපෑමද සුළුපටු එකක් නොවේ. කාන්තාවන් සැබෑ ලෙස වහල්භාවයෙන් මුදවාගත හැක්කේ කෙසේද යන්න ලෙනින් විසින් ලියන ලද ශ්‍රේෂ්ඨ ආරම්භයක් නැමැති ලිපියේ මෙසේ සඳහන් කර ඇත.
''කාන්තාවට විමුක්තිදායක නීති කොතරම් තිබුණද, ඇය තවදුරටත් ගෙදර වහලියක්ම වන්නීය. එසේ වන්නේ අවශේෂ ගෙදර වැඩ විසින් ඇය පෙළනු ලබන, ඇගේ ගෙළ හිරකරනු ලබන, ඇය ඔබා තබනු ලබන හා ඇය කුස්සියටත්, දරුවන් බලාගැනීමටත් බැඳ තබනු ලබන හෙයිනි. එමනිසා ඇයට සිදු වී ඇත්තේ අමානුෂික තරම් ඵලදායී නොවූවද, අවශේෂ වූද මනස්තාපය දල්වන්නාවූද, අවහිර ගෙන දෙන්නා වූද දාස වැඩ කරමින් ස්වකීය ශ්‍රමය අපතේ හැරීමටය. කාන්තාවන්ගේ නියම විමුක්තිය, නියම කොමියුනිස්ට් ක්‍රමය ආරම්භ වන්නේ (රාජ්‍ය බලය මෙහෙයවන නිර්ධන පංතිය යටතේ) මෙම අවශේෂ ගෙදර වැඩට එරෙහිව දෘඩතම අරගලයක් ආරම්භ වූ විට, නැතහොත් එය සම්පූර්ණයෙන්ම මහා පරිමාණ සමාජවාදී ආර්ථිකයකට පරිවර්තනය වීම ආරම්භ වූ විට පමණි.''

එසේ හෙයින් කාන්තාවන්ගේ ඉදිරි ගමන වැළැක්වීමටත්, තමන්ට හිමි ගරුත්වය ලබා නොදීමටත්, තමන් ශ්‍රම වහලියන්, ලිංගික වහලියන් බවට පත්කර තබා ගැනීමටත් නිර්මාණය කර ඇති සියලු පසුගාමී ආකල්පයන් හොඳින් අවබෝධ කරගනිමින් එම ආකල්පවලින් මිදී ඒවා පරාජය කිරීමට අරගල කළ යුතු වන්නේත්, පසුගාමී ආකල්පයන් පවතින සමාජය වෙනස් කර වඩාත් හොඳ සමාජයක් නිර්මාණය කර ගැනීමට පෙරමුණ ගත යුතු වන්නේත් කාන්තාවන්මය. අප ජීවත්වන පසුගාමී සමාජයත්, එකී සමාජයේ පවතින පසුගාමී ආකල්පත් පරාජය කළ හැකි වන්නේ එවන් අධිෂ්ඨානශීලී කාන්තා දායකත්වයක් තුළ පමණි.

# උස් පරමාර්ථ දරා ගත් ඔවුන්...

සෝවියට් රුසියානු ලේඛක චිංගිස් අයිත්මාතව් විසින් රචනා කරන ලද ගුරුගීතය නැමැති කෙටි කතාවේ හමුවන අල්තීනායි වරෙක මෙසේ පවසයි.
''ටොකොල්, දෙවන බිරිඳ අහෝ ඒ වචනවලට මම කොතරම් වෛර කරම්ද? කවුරුන් විසින් එම වචන සොයාගනු ලැබුවේද? සිතත්, කයත් දෙකම වහල්භාවයට හෙළනු ලැබ සිය කැමැත්තට එදිරිව දෙවෙනි බිරිඳක් බවට පත්වූ එකියකගේ තත්වය කොතරම් අසරණදැයි ඔබ දන්නෙහිද? මිනිස් උරුමය උදුරාගනු ලැබ වද වේදනාවලට විනාශයට හා මරණයට කැප වූ අවාසනාවත් කාන්තාවනි, මිනීවලවල් තුලින් නැගිටපල්ලා වද හිංසා වලට පාත්‍ර වූ කාන්තාවෙනි, ඒ අඳුරු යුගය බියගන්වමින් නැගී සිටපල්ලාෟ නුඹලාට මුහුණ පාන්නට සිදු වූ ශෝකජනක ඉරණමට මුහුණ දී එය අභිබවා නැගී සිටීමට උත්සහ කරන නුඹලාගේ පෙළපතට අයත් අන්තිම එකිය වූ මා නුඹලාට මෙසේ ආමන්ත්‍රණය කරන්නේ.''
ජීවිතයම ප්‍රශ්නයක් බව ගුරු ගීතයේ අල්තීනාට සිතෙයි. එහෙත් ඇය එම ප්‍රශ්න බාර ගන්නවා වෙනුවට එම ප්‍රශ්නවලට අභියෝග කරයි. අල්තීනායි, නුඹ විදි පීඩාව කොතෙක්ද? දෙමව්පියන් අහිමිව, නැන්දනියගේ නිවසේ බැල මෙහෙවර කරමින් නැන්දනියගේ අතමිට සරුකර ගැනීම වෙනුවෙන් රතු මූණාට විකුණනු ලැබ,විටෙක ඔබ අඳුරු අගාධයක ගිල්වා දැමීමට සූඳ නම් වූ ඒ ක්‍රමය මොනතරම් කෲරද? ඒ අඳුරු අගාධයෙන් අල්තීනායිගේ මෙන් උරුමය අහිමිකර අසරණ කළ පීඩිතයන්ගේ විමුක්තිය වෙනුවෙන් සටන් කළ ඒ මිනිසුන්ගේ අධිෂ්ඨානය කෙතරම් බලවත්ද? ඒ ශ්‍රේෂ්ඨ මිනිසුන්ගේ කැපකිරීම්වල ඵලයන් ලෙස රුසියාව නව සමාජවාදී ගමනකට පිවිසීම මොනතරම් භාග්‍යයක්ද?
අල්තිනායි, නුඹ පමණක් නොව නුඹ වැනිම අල්තිනායිලාගෙන් එදා රුසියාව පිරී තිබුණි. ඔවුන්ගේ හැකියාවන් ඔහේ වැලලී යනවා වෙනුවට ඔසවා තැබීමට, ඔබට මහාචාර්යවරියක් දක්වා ඉහළට යාමට හැකි වූයේ රුසියාව තුළ වූ සමාජවාදී සමාජ විප්ලවය නිසාමයි. සදාකාලික අඳුර වෙනුවට සදාකාලික ආලෝකයත්, සදාකාලික මරණය වෙනුවට ජීවිතයත්, අනාරක්ෂිතභාවය වෙනුවට සුරක්ෂිතභාවයත් සමාජවාදී රුසියාවට ලැබුණි.
එදා රුසියාව තුළ තිබූ ඒ වැඩවසම් වහල්භාවය වෙනුවට නිවහල්, නිදහස්, සමානාත්මතාවය රජයන සමාජයක් ගොඩනැගීම වෙනුවෙන් පුංචි මිනිසුන් කළ කැප කිරීම් පිටිනැලියක් පිපෙන්නට සලස්වන මුහුන් පොදක් වැනියි. ඔවුන් කිසිදු පුද්ගලික වටිනාකම්, ප්‍රශංසා, වරප්‍රසාද කිසිවක් අබමල් රොනක් තරම්වත් බලාපොරොත්තු නොවුනි.
බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙක් වන දුයිෂෙන්, විටෙක දේශප්‍රේමී යුධ පෙරමුණේ සෙබලෙක් ලෙසද, විටෙක වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවකයෙක් ලෙසද, විටෙක අධ්‍යාපනය යන වචනයේ තේරුම නොදත් අයිලයේ නූගත් මිනිසුන්ගේ දූවාදරුවන්ට අකුරු කියා දුන් මුල් ගුරුතුමා ලෙසද සේවය කරනු ලබයි. තමාගේ සේවය අවැසි කොතනටද, කොයි අයුරින්ද ඒ අනුව එය ලබාදීමට ඔහු නොපැකිලෙයි.
එවැනි උස් කොමියුනිස්ට්වාදී ගුණාංග යන්ගෙන් යුත් පුංචි මිනිසුන්ගේ වෙහෙසේ අනගි ඵලයක් ලෙස රුසියාව මහා පරිවර්තනයකට ලක් වෙයි.
එහි ප්‍රතිලාභ ලබන්නට අල්තිනායි වැන්නවුන්ට හැකිවෙයි. සමාජවාදී යුගයක් උදානොවන්නට අල්තිනායිගේ ඉරණම වනුයේද දරාගත නොහැකි වද වේදනාවන්ට, හිරිහැරයන්ට, පීඩාවන්ට, අයිතීන් අහිමිකරනු ලැබීමට ගොදුරු වූ කළුම කළු පාට අගුරු කැබැල්ලක් මෙන් නොසැලකිල්ලට ලක් වීමටයි.
හුදකලාව, තනි පුද්ගල හැකියාවකින් එවැනි ඉරණමක් වෙනස් කළ නොහැකියි. එය වෙනස් කළ හැක්කේ පොදු මිනිස් බලයකින් පමණයි.
එදා අයිලයේ ජීවත් වූ අල්තීනායි වැනි කුඩා දරුවන් පිරිවරා ගනිමින් තමා උගත් දෑ කියාදීමට දුයිෂෙන් ආදරණීය පියෙක් ලෙස කටයුතු කරන විට අල්තිනායි තම ජීවිතය තුළ වූ අනේක වදවේදනා සියල්ල අධිෂ්ඨානශීලීව පරාජය කර, ඇගේ හැකියාවන් දක්ෂතාවයන් සමාජවාදය තුළ ජනතාවට ලබාදීමට කටයුතු කරයි.
අභියෝග හමුවේ හඬා වැළපී පසුබසිනවා වෙනුවට ඇය පීඩාවට පත් සියලු කාන්තාවන්ට ආයාචනා කරනුයේ පීඩාවට එරෙහිව නැගී සිටින ලෙසයි.
ඉදින් මේ මොහොතද අප සමාජයට වැඩි වැඩියෙන් එවැනි දුයිෂෙන්ලා අල්තිනායිලා අවශ්‍ය කර තිබෙන අවධියක් නොවන්නේද?



# ඉරාන අර්බුදය
## නව භූ දේශපාලන රටාවක නිමිත්ත

ඇමරිකා එක්සත් ජනපදයේ ලෝක වෙළඳ මධ්‍යස්ථානය 2001 සැප්තැම්බර් 09 බිමට සමතලා වීමේ උණුසුම යන්නටත් පෙර 2002 ජනවාරියේ ජනාධිපති ජෝර්ජ් ඩබ්. බුෂ් ප්‍රකාශ කළේ, ලෝකයේ දුෂ්ට අක්ෂයක් (Axis of Evil) පවතින බවයි. ඊට ඉරානය, ඉරාකය හා උතුරු කොරියාව යන රටවල් අයත් බව ඔහු පැවසුවා. ඉරාකය සඵල ඝාතක රසායනික අවි තනමින් එක්සත් ජනපදයට තර්ජනයක් වී ඇති බව කී ඔහු ඉරාකය හා උතුරු කොරියාව න්‍යෂ්ටික අවි තනමින් ලෝක සාමයට තර්ජනයක් වී ඇති බව කියා සිටියා.
2003 දී ඉරාකය ආක්‍රමණය කළ බුෂ්, සදාම් පාලනය පෙරළා දමා 2004 දී රූකඩ ආණ්ඩුවක් ස්ථාපිත කළේ, ඉරාකයේ සමූල ඝාතන අවි පිළිබඳ තමාගේ චෝදනා කිසිවක්ම ඔප්පුකරගත නොහැකිව තිබියදීමයි. එහෙත් සත්‍යයට වඩාත්ම ළඟ හේතුව ලෙස ලෝකය පසුව හඳුනා ගත්තේ, අර්බුදයට යමින් තිබූ එක්සත් ජනපද ආර්ථිකය තවත් වසර කිහිපයක් අල්ලා සිටීම සඳහා බුෂ්ට එසේ කිරීමට සිදුව තිබූ බවයි.

**ඔබාමාගේ රණ බෙරය**


2008 ආර්ථික අර්බුදයෙන් බැට කා තවමත් ගොඩ ඒගත නොහැකිව සිටින එක්සත් ජනපදයේ සුක්කානම දැන් භාරවී ඇත්තේ බුෂ්ගේ අනුප්‍රාප්තික, 'වෙනස' තම මැතිවරණ තේමාව කරගත් ඔබාමාටයි. එසේ වුවද කඩා වැටෙන ධනවාදී ආර්ථිකයට කිසිදු 'වෙනසකින්' තොරව බුෂ්ගේ විසඳුම්ම ආදේශ කිරීම පිළිබඳව සලකා බැලීමට ඔබාමාටද සිදුව තිබෙනවා. ඊනියා දුෂ්ට අක්ෂයේ ඉතිරි රටවලට, ඉරානයට හා උතුරු කොරියාවට, එක්සත් ජනපදයේ බැල්ම හෙළන්නේ ඒ අනුවයි. උතුරු කොරියාවට සම්බාධක පනවා බලපෑම් කිරීමට නොහැකි බවත් පහරදී අතපුච්චා ගැනීමට සිදුවන බවත් තේරුම් ගෙන ඇති එක්සත් ජනපදය, රුසියාවට පමණක් දෙවැනි වන තෙල් හා ගෑස් සංචිත පිහිටි අනිත් ඉලක්කය වෙතට මාරුවී තිබෙනවා ආර්ථික අර්බුදයෙන් පීඩා විඳින ඇමරිකානුවන්ගේ අවධානය දිනාගත හැකි යමක් ඔවුනට තළුමරමින් සිටීම සඳහා ඉදිරිපත් කිරීමට ඔබාමා පාලනයට අවශ්‍යයි. මෙය අත්‍යාවශ්‍ය කරුණක් වන්නේ 2012 වසරේදී ඇමරිකානු ජනාධිපතිවරණය යෙදී තිබීම නිසයි. නැවත වරක් බලයට පැමිණීමේ අපේක්ෂාවෙන් පසුවෙන ඔබාමා, බුෂ්ගේ සුපුරුදු රණ බෙරය වැයීමට පටන්ගෙන තිබීම තේරුම් ගත යුත්තක්. ඉරානයේ න්‍යෂ්ටික වැඩපිළිවෙළද සාමකාමී වූවක් නොවන බවටත් එය ලෝකයට, විශේෂයෙන් මැදපෙරදිග සාමයට තර්ජනයක් බවටත් චෝදනා පිට චෝදනා එල්ල වෙමින් තිබෙනවා.
එක්සත් ජනපද මැතිවරණ ව්‍යාපාරය තුළ යුදෙව් සම්භවයක් ඇති සියොන්වාදීන්ගේ බලපෑම ඉහළ වන අතර මැදපෙරදිගදී එක්සත් ජනපදයේ භූමිකාවට උරදෙන සියොන්වාදී ඊශ්‍රායලයේ බලපෑමද ප්‍රබල එකක්. ඉරානයේ න්‍යෂ්ටික වැඩපිළිවෙළ දෙස නිරතුරු සැකයකින් පසුවන ඊශ්‍රායලය තමන් හැරෙන්නට අනෙකකු සතුව (විශේෂයෙන් මුස්ලිම් ලෝකය සතුව) න්‍යෂ්ටික බලය නොතිබිය යුතු බව ඇමරිකාවට අවධාරණය කරනවා. තමන් න්‍යෂ්ටික අවි නොතනන බවත් තම න්‍යෂ්ටික වැඩපිළිවෙල සාමකාමී වූවක් බවත් ඉරානය පුන පුනා කියා සිටියෙදීත් ඉරානයට එරෙහි යුධ සූදානමක් ප්‍රකාශ වීමට එයත් සැලකිය යුතු බලපෑමක් කරනවා. 1981 දී සදාම්ගේ ඉරාකයේ ඉදිකෙරෙමින් තිබූ ඔසිරක් (Osirak) න්‍යෂ්ටික බලාගාරයට බෝම්බ හෙළා විනාශ කළ ඊශ්‍රායලයට ඉරානයේ න්‍යෂ්ටික වැඩපිළිවෙළෙහිද අවසානයක් දකින තෙක් සැනසීමක් නැති ආකාරයක් බඳුයි.

ඉරානයේ න්‍යෂ්ටික ගමන

ඉරානයේ න්‍යෂ්ටික වැඩපිළිවෙළට එරෙහිව දැන් එක්සත් ජනපදය යුධ ප්‍රකාශ කරමින් සිටියත් ඉරාන න්‍යෂ්ටික ව්‍යාපෘතියේ ඉතිහාසය 1953 කාලය තෙක් දිවයනවා. ඒ මහජන ඡන්දයෙන් බලයට පත් මොහොමඩ් මොසාඩ්ගේ ආණ්ඩුව හමුදා කුමන්ත්‍රණයකින් බලයෙන් පහකර ඇමරිකානු රූකඩ පාලක ෂා බලයට පැමිණීමත් සමගයි. එක්සත් ජනපද සහාය ඇතිව කෙරුණු පර්යේෂණවල ක්‍රමික ප්‍රතිඵලයක් ලෙස 1968 දී ඉරානය ජාත්‍යන්තර පරමාණු බලශක්ති ඒජන්සියේ සාමාජිකත්වය ලැබුවා. 1975 දී බුෂර් (Busher) න්‍යෂ්ටික බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කළේ, ඇමරිකා එක්සත් ජනපදයේ ආශිර්වාදය ඇතිව ජර්මානු සමාගමක් විසිනුයි. ෂා රජු යුරේනියම් ලබා ගැනීම සඳහා ප්‍රංශය සමග ගිවිසුමක් පවා අත්සන් කළා.
නමුත් 1979 දී ෂාගේ බටහිරකරණය මුළුමනින්ම ආපසු හැරවූ ඉරාන විප්ලවය විසින් බටහිර අධිරාජ්‍යවාදයේ සියලු සැලසුම් කණපිට හැරවූවා. 1935 ට පෙර පර්සියාව යනුවෙන් හැඳින්වනු ලැබුවා වූද කලක ලෝකයේ බලවත් අධිරාජ්‍යයන්ගෙන් එකක් වූවා වූද ඉරානය, බටහිර විරෝධී ඉස්ලාමීය ජනරජයක් වුණා. ඉන්පසු ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවල ප්‍රාර්ථනය වූයේ, න්‍යෂ්ටික බලයෙන් තොර (බෙලහීන කරවන ලද) ඉරානයක්. ජර්මානු සමාගම් න්‍යෂ්ටික බලාගාර ඉදිකිරීම අතරමග නවතා රටින් ඉවත්වී ගිය අතර ප්‍රංශය යුරේනියම් සැපයීම ප්‍රතික්ෂේප කළා. ඇමරිකානු බලපෑම මත ආර්ජන්ටිනාවටත් යුරේනියම් සැපයීමනවතා දැමීමට සිදුව තිබුණා. එවකට ඇමරිකානු හිතවාදියෙකු වූ සදාම් හුසේන් ලවා ඉරානයේ බුෂර් න්‍යෂ්ටික බලාගාරයට ප්‍රහාර එල්ල කෙරුණේත් වරක් දෙවරක් නොවෙයි.
මේ සියලු බාධා මැද රුසියානු විද්‍යාඥයින්ගේ න්‍යෂ්ටික උපදෙස් අනුව ඉරාන න්‍යෂ්ටික වැඩපිළිවෙළ ඉදිරියට ඇදෙමින් තිබුණා. ඉරාන විප්ලවයේ ප්‍රමුඛ කාර්යධරයෙකු වූද විප්ලවීය ආරක්ෂක හමුදාවේ නිලධරයෙකු වූද ටෙහෙරානයේ නගරාධිපතිවරයා, මොහොමඩ් අහමඩිනේජාඩ්, 2005 දී ඉරාන ජනාධිපතිවරණයෙන් බලය හිමිකර ගැනීමද සුවිශේෂ තත්වයක් නිර්මාණය කළා. වසර 24කට පසු පූජකයකු නොවන ජනාධිපතිවරයෙකු ලෙස තේරීපත්වූ ඔහු රටේ ස්වෛරීභාවය හා නවීකරණය වෙනුවෙන් න්‍යෂ්ටික වැඩපිළිවෙළ ඉදිරියට යායුතු බව අවධාරණය කර තිබුණා. 2000 පළමු දශකයේ මැද වන විට ඉරාන න්‍යෂ්ටික ව්‍යාපෘතියේ යුරේනියම් පිරිපහදු කිරීම නතර කිරීම සඳහා කිරීම එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවල් සම්බාධක අවි අමෝරා ගනු ලැබුවා. එහෙත් න්‍යාෂ්ටික අවි හරණ (Nuclear Non-Proliferation Treaty) ගිවිසුමට අත්සන් තබා ඇති රටක් වශයෙන් සාමකාමී කටයුතු වෙනුවෙන් න්‍යාෂ්ටික බලය වැඩිදියුණු කිරීමේ අයිතිය පාවිච්චි කළ ඉරානය 2009 වන විට වෙනිසියුලාව වැනි මිත්‍ර රටවලින් යුරේනියම් ලබා ගනිමින් වැඩපිළිවෙළ ඉදිරියට ගෙන ගියා. මෙතරම් දරුණු සම්බාධක මධ්‍යයේ පවා බටහිරට වේදනා ගෙන දෙන දියුණුවක් න්‍යෂ්ටික ක්ෂේත්‍රයේ ඇතිකර ගැනීමට ඉරානයට හැකිවීම ඉරාන විද්‍යාඥයින්ගේ හැකියාව විදහා පෑවා.
කෙසේ වුවද රටට ඒ හැකියාව අත්පත් කර දීම වෙනුවෙන් ඔවුන්ට තම ජීවිතවලින් වන්දි ගෙවීමට පවා සිදුවුණා . ඒ, බටහිර අධිරාජ්‍යවාදයේ විරෝධය පළවන කටයුත්තක් වෙනුවෙන් කැපවීම නිසා අධිරාජ්‍යවාදී ඔත්තු සේවාවන්ගේ මාරක ප්‍රහාරයන්හි ගොදුරු බවට පත් වෙමිනුයි. 2010.01.12 සිට 2012.01.11 වන විට ඉරාන න්‍යෂ්ටික විද්‍යාඥයින් සිව් දෙනෙකුට බෝම්බ ප්‍රහාර එල්ල වුණා. ඔවුන්ගේ මෝටර් රථවලට එල්ලවූ මෙම බෝම්බ ප්‍රහාර හේතුවෙන් තිදෙනෙක් මියගිය අතර තවත් අයෙක් තුවාල ලබා බේරුණා. 2012 ජනවාරියේ නටාන්ස් න්‍යෂ්ටික බලාගාරයේ විද්‍යාඥ මුෂ්ටාෆා හා අහමඩ් රොෂාන් මියගියේ, ඔහුගේ මෝටර් රථයට සවිකල කාන්දම් බෝම්බයක් පුපුරා යාම නිසයි. එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර ඔත්තු සේවා හා ඊශ්‍රායලයේ මොසාඩ් සහාය ඇතිව සිදුවන මෙම ඝාතන බටහිර මාධ්‍යයන්හි සඳහන් වනුයේ නොවැදගත් පුවත් යටතේයි.
ඉරාන න්‍යෂ්ටික වැඩපිළිවෙළ සාමකාමී වූවක් නොවන බව තහවුරු කිරීම සඳහා ඒ පිළිබඳ චෝදනා නගන බටහිරට පැහැදිලි සාක්ෂි ඇත්තේ නැහැ. ඔවුන්ව ඒ සඳහා මෙහෙය වන්නේ ඉරානය ඩැහැගැනීම සඳහා ඔවුන් තුළ ඇති වුවමනාව විසින් මිස අන් කිසිවකින් නොවෙය. ආර්ථිකමය වශයෙන් එක්සත් ජනපදයේ බංකොලොත් බව නොපිළිගන්නා කෙනෙක් නැති තරම්. එහෙත් එක්සත් ජනපදය පිළිබඳ අලුත්ම හෙළිදරව්ව වන එහි දේශපාලන බංකොලොත්කම ප්‍රකට වනුයේ, ඉරානයට එරෙහි චෝදනා ගොනු කිරීමේදීය. ඉරානයට එරෙහි මෙතරම් ඝෝෂාවක් නැගුවද න්‍යෂ්ටික අවි පිළිබඳ තර්කයක් ගොඩනගා ගැනීමට ඔවුන් සමත් නැහැ. ඒ බව පසුගියදා එක්සත් ජනපද ආරක්ෂක ලේකම් ලියෝන් පැනේටා නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පතට ලබාදුන් සාකච්ඡාවකින් පැහැදිලියි. ''ඉරානය න්‍යෂ්ටික අවියක් තැනීමට උත්සාහ කරමින් සිටියිද?'' යන පැනයට ඔහුගේ පිළිතුර ''නැත'' යන්නයි. සෙසු සියලු චෝදනා, මත දැක්වීම් ඉලක්ක සහගත උපකල්පන මත ගොඩනැගුණු ඒවා, 'ඉරානය කවදා හෝ අවිතැනිය හැකි බව වැනි ඇස්වසාගෙන සිදුකරන වාචික පහරදීම් බව ඉතාම පැහැදිලියි. නිශ්චිත සාධක නොමැති වුවත් සම්බාධක පනවා ඉරානයේ ගෙල සිරකරවා ලීමට එක්සත් ජනපදය ගන්නා උත්සාහය සුළුපටු නැහැ. එමගින් දුබල කරගන්නා ඉරනය පසුකාලීනව යටත්කරලීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කරගැනීමට හෝ ඉරාන පාලනය පෙරළා දැමීම සඳහා අරාබි වසන්තයෙන් උත්තේජනය ලබන විපක්ෂ කණ්ඩායම්වලට තල්ලුවක් දීමට බලාපොරොත්තු වෙනවා විය හැකියි. එහෙත් වුවමනාවට සරිලන තරම් වේගයකින් සම්බාධක යෝජනා ඉදිරියට තල්ලුකරවීමට එක්සත් ජනපදය අසමත්. ප්‍රධානතම විරෝධය මතුවන්නේ, රුසියාවෙන් හා චීනයෙන් ඉරාන ඉරාක යුද සමයේ සිටම ඉරානයේ මිතුරෙකුවන රුසියාව, මැදපෙරදිග මුළුමනින්ම බටහිර අධිරාජ්‍යවාදයේ න්‍යාය පත්‍රයකට යටවනු දැකීමට කැමති වනු ඇතැයි සිතිය නොහැකියි. මේ සම්බන්ධයෙන් චීනයේ අදහස්ද ඊට වෙනස් නැහැ.
චීනයේ විශාලතම තෙල් සැපයුම්කරුට සම්බාධක පැනවීම චීනයට ආර්ථික වශයෙන් හානිදායක වෙනවා පමණක් නොව භූ දේශපාලනික වශයෙන් වැදගත් කලාපයකට විදේශ අතපෙවීම් සිදුවීමේ අවදානමද චීනය සැලකිල්ලට ගනු ඇති. ඉරානය සම්බන්ධයෙන්වන මෙම ස්ථාවරයෙන් අඩුවැඩි වශයෙන් දෙරටේම රාජතාන්ත්‍රිකයන් වෙතින් මේවන විට ප්‍රකාශ වී අවසන්.
2008 දී රුසියාව ජෝර්ජියාවේ දකුණු ඔසේටියා ප්‍රදේශයේ ජෝර්ජියා මෙහෙයුම් නතර කිරීම සඳහා සන්නද්ධ බලය මුදා හැරීම ඒ මොහොතේ කිසිවෙකුත් අපේක්ෂා කර තිබුණේ නැහැ. එහෙත් තමන් තවදුරටත් දැත් බැඳ සිටීමට සූදානම් නොමැති බව රුසියාව පෙන්වා දී තිබුණා. චීන ජාතික ආරක්ෂක සරසවියේ මහාචාර්ය

15වැනි පිටුවට





උන්ගේ යුද්ධය හා
උන්ගේ සාමය
දොඩවන කල පාලකයන්
සාමය ගැන
ජනයා වටහා ගන්නේ
යුද්ධයකට වැඩි කල්
නොයනා වග...
ශාප කරන කල යුද්ධයට
පාලකයින්
යුද්දෙට මිනිසුන්
අරගෙන
හමාර බව දැනගත
යුතු...
සාමය උන්ගේ නැවතත්
යුද ගිණිසිළුවක් පමණයි

**බර්ටෝල් බ්‍රෙෂ්ට්**

කවුළුව හැර තබමි

# දුම සහ ගින්න

මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ මධු සමය නිමාවෙමින් පවතී. එසේ වූයේ කෙසේද? තමන් මුහුණ දෙන සමාජ ආර්ථික ප්‍රශ්න යනු සුරාකෑම මුල්කරගත් පවත්වා ගෙන යන ධනපති ක්‍රමයේ ගැටලුවක් මිස පුද්ගල ප්‍රශ්නයක් නොවන බව අවබෝධ කරගත් ජනතාව වසර 63 ක් පුරාම සිදුකරනු ලැබුවේ පුද්ගල වෙනස්කම්ය.

මෙරට ජනතාව මහින්ද රාජපක්ෂට සිය බහ දෙන්නේද මෙවැනි වටපිටාවක් තුළය. සමහරු සිතුවේ අඩුම ගණනේ වසර තිහක්වත් කිසිදු ආරෝවක් නැතිව රාජපක්ෂ සමඟ දිග කෑ හැකි බවය. තැන් තැන්වල අසු රියන් කටවුට් දැමුණි. සැබෑව නුදුටු රුව පමණක් දුටු දනෝ 'ආයුබෝවන් මහරජාණෙනි' යනුවෙන් එකත් පස්ව කිව්වෝය. දින සති ගෙවී ගියේය. මධු සමයේ ආනන්දය මැකෙන්නටත් පෙර ඒ ජනතාවම වීදි බසිමින් සිටිති.

පුද්ගලික අංශයේ සේවක අර්ථ සාධක අරමුදලට පොකැට් ගසන්නට ගොස් රාජපක්ෂ ආණ්ඩුව රෙදි ඉරා ගත්තේය. ඉන්පසු විශ්වවිද්‍යාල ආචර්ය සටනින් ඇණ ගත්තේය. කුඩ සෙල්ලමෙන්ද ලෙල්ලම් වුයේය. මෙය මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ මධු සමයේ නිමාවක් නොව වසර 63 ක් පුරා මෙරට



ජනතාව වද වේදනාවට ලක් කළ ධනපති ක්‍රමයේ නිමාව බවට පෙරළා ගත යුතුය. 'ජීවත් වීමට සරිලන වැටුපක් ලබාදෙනු' සෑම වැඩබිමකම සටන් ඇවිලෙමින් තිබේ. සෑම තැනකින්ම දුම් දමමින් ඇත. ජනතාව පොලීසිවලට ගල් ගහන්නේත් මහින්දගේ දැවැන්ත කටවුට් ඉරා දමන්නේත් පවතින ක්‍රමය විසින් ඔවුන්ගේ හිස මත පටවා ඇති පීඩනයට එරෙහිවීමක් ලෙස මිස අන් කුමකටද?

# එන පොට හොඳ නැත...


පොතේ ලියැවුන චින්තනය නොව දිග හැරෙමින් ඇත්තේ එහි නව සංස්කරණයකි. එම නව සංස්කරණයට අනුව ලංකාවේ ආර්ථික උපාය මාර්ගය සංචාරක ව්‍යාපාරය වේ. එය නිකම්ම නිකං සංචාරක ව්‍යාපාරය නොව, ලිංගිකත්ව (SEXUAL TOURISUM) සන්තර්පනය කරන සංචාරක ව්‍යාපාරයකි. රාජපක්ෂ ආණ්ඩුව මේවන විට රටේ ජනතාවට නොව රටට එන සංචාරකයින්ට අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කරමින් සිටි. නිරුවත් වෙරළ තීරද කැසිනෝ කලාපද ගණිකා වෘත්තියද සමලිංගික සේවනයද නීතිගත කෙරෙන්නට යන්නේ ඒ අනුවය.



ගෙන්වා ගන්නට යන්නේ, ලෝකයේ එපාම කරපු ජාතියේ සංචාරකයින් පිරිසකි. ඒ අනුව ඔවුන් සතුටු කිරීමටත් ආණ්ඩුවේ නායකයින් සතුටු කිරීමටත් ජනතාවට සිදුවනු ඇත. තමන්ගේ කුසින්, ලෙයින් බිහිකළ දුවරුන්ගේ අනාගතය එතරම් සුබ නොවනු ඇත. ළබාල තරුණියන් අතුරුදහන් වීම් වැඩිවනු ඇත.

පසුගිය දිනක දෙහිඕවිට ජාතික පාසලේ නවවැනි ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ නිරෝෂණී නම් දැරියක් අතුරුදහන්ව ඇත. මේ පිළිබඳව පැමිණිලි කිරිමට පොලීසියට ගියද පොලිස්පතිවරයා හමුවුවද කිසිදු ඵලක් වී නොමැත. ආශ්චර්යයමත් ශ්‍රී ලංකාවේ 2011 වර්ෂයේ ( නොවැම්බර් සහ දෙසැම්බර් මාස දෙක නොමැතිව) වාර්තා ගත වූ ස්ත්‍රී දූෂණ සංඛ්‍යාව පමණක් 1653 කි. සෑම දින දෙකකටම බලහත්කාරී ස්ත්‍රී දූෂණ 11 සිදුවේ. ධනේශ්වර ක්‍රමය දත් තිස් දෙකම විරිත්තා සිනාසෙමින් සිටියි.

# මැරවින් සහ අංගුලිමාල



සියලු කුණු බෙරේ වැවට කියන්නාකේ මෙන් අද කැළණිය විනාශ කිරීමේ එකම වගඋත්තරකරුවා මැරවින් සිල්වාය. බොහෝ නිලධාරින්ට හෝ දේශපාලකයින්ට තමාගේ රථාචාර්යයා ආරක්ෂා කිරීමට සිදුවිය. ඒ මන්ද යත් ඔවුනගේ බොහෝ අන්ඩර් ලයින් වැඩ කර දුන්නේ රථාචාර්යය. එම හේතුව නිසා රථාචාර්ය ඉදිරිපිට නිහඬව සිටිමට සමහර මහත්වරුන්ට සිදු වී ඇත. මැරවින් යනු රාජපක්ෂගේ කෙටි ඉතිහාසය තුළ රථාචාර්ය ලෙස කටයුතු කළ කෙනෙකි. ගුවන් විදුලි සංස්ථාවට බලහත්කාරයෙන් ඇතුළු වී කඩිප්පුලි වැඩ කරද්දී ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව සිටියේ 'ආශ්චර්යයමත්' ශ්‍රී ලංකාව දෙස බලාගෙනය. සමෘද්ධි නිලධාරින් ගස් බැඳුණි. විරුද්ධ පාක්ෂිකයින්ට පහර දීම් සිදුවිය. මත්පැන් කුඩු බිස්නස් ජයටම කෙරුණි. කප්පම් ගැනිණි. අංගුලිමාල මිනිසුන්ගේ ඇඟිලි කැපුවේය. මැරවින් මිනිසුන්ගේ බෙලි කැපුවේය. ගුරුවරයා වූ මහින්ද රාජපක්ෂ ඇහැක් ඇර බැලුවේ නැත. අංගුලිමාල යනු දිසාපාමොක් ආචාර්යවරයා ළඟ ඉගැනුම ලැබූ විනීත ගති පැවතුම් ඇති ශිෂ්‍යයෙකි. අහිංසක සිසුවා දාමරික අංගුලිමාලයෙකු කෙරුවේ ඔහුගේ ගුරුවරයාය. මැරවින් යනු අහිංසක තරම් අහිංසකයෙකු නොවුවත් මුළු රටටම එපා කරපු මිනිහෙක් බවට පත් කරනු ලැබුවේ, සියල්ලට උපදෙස් දුන්නේත්, අනුබල දුන්නේත් රැකවරණය දුන්නේත් ඔහුගේ දේශපාලන ගුරුවරයාය. පවතින ධනපති ක්‍රමය යනු නරක මිනිසුන් හොඳ මිනිසුන් කරන සමාජ ක්‍රමයක් නොව හොඳ මිනිසුන් නොමිනිසුන් කරන සමාජ ක්‍රමයකි. සියල්ල විනාශ වෙමින් යන විට තමාගේ ආරක්ෂාව රැකවරණය වෙනුවෙන් හදාවඩා ගත් සතුන් සිවුපාවුන් විනාශ කෙරෙනු ඇත. ධනපති ක්‍රමය යනු වැඩගත් මිනිසුන් පවා විනාශ කරන, තමන්ගේ වල කපන කම්කරුවන් බිහිකරන සමාජ ක්‍රමයක් බව සියලු දෙනා දැනසිටීම ඇඟට ගුණය.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක බොහොම බරසාරෙට අඩිය තිය තියා පංතියට ආවා. ඇවිල්ලා පංතිය ඉදිරියේ පපුව ඉස්සරහට දාල හරි කෙලින් හිටගත්ත. හරියට නිදහස් දින උත්සවයේදී හමුදා ආචාර පෙළපාලිය පිළිගන්න ඉන්නව වගේ.

''ගුඩ් මෝනිං සර්. සර් අද සෑහෙන්න වෙනස් වෙලා. අයෝමය පුරුෂයා තරඟයට ලෑස්ති වෙනවද? නැතිනම් ජිම් එකකටවත් යන්න පටන් ගත්තද'' චමියා එහෙම ඇහුවේ කින්ඩියට වගේ.

''මම යන ජිම් එකක් නැහැ අයිසේ. ඒත් අපි හැමෝම අයෝමය පුරුෂයෝ වගේ ඉන්න ඕන. එතකොට තමයි දිනා ගත්ත නිදහස රැකගන්න පුළුවන් වෙන්නේ.'' පොලිටික්ක ඒකෙන්ම සබ්ජෙට් එකට බැස්සා.

''පෙබරවාරි මාසය අපිට හුඟක් වැදගත් මාසයක්.'' පොලිටික්ක කතාව එහෙම ආරම්භ කරලා පංතියේ හැමෝම දිහා ආඩම්බරයෙන් බැලුවා.

''ඔව් සර්, පෙම්වතුන්ගේ දිනය තියෙන්නේ පෙබරවාරිවල නේ. 14 වෙනිදා'' වසන්තිය කියාගෙන කියාගෙන ගියා. පොලිටික්කා වසන්තිය දිහා රවලා බැලුවා. වසන්තිය බයෙන් බිම බලාගත්තේ හරියට කැළණියේ ප්‍රාදේශීය සභාවේ සභාපතිව දැකපු මර්වින් වගේ

''පෙබරවාරි මාසයේ තියෙන වැදගත්කම ගැන කියන්න පුළුවන් කාටද?'' ඒ පාර පොලිටික්ක ඔබද ලක්ෂපති, මමද ලක්ෂපති වැඩසටහන මෙහෙයවන නිවේදකයා වගේ පංතියෙන් ඇහුවා.

''මොන වැදගත්කමක්ද සර් අඩුම දවස් තියෙන මාසෙනේ'' සමන මාතෘකාව නෙගෙටිව් පැත්තට ගත්ත. ''ඇයි? කොළ හැලෙන මාසෙත් පෙබරවාරිනේ. අපේ පැත්තේ රබර් ගස්වල කිරි කපන්නෙත් නැහැ.'' අහිසංක විදියට එහෙම කිව්වේ සිරිපාල.

මාතෘකාව කැළේ යනවා දැකලා පොලිටික්කාට මල පැන්නා. ''ඔය මගුල් නෙවෙයි අයිසේ මම අහන්නේ. පෙබරවාරි මාසේ අපට තියෙන වැදගත්කම මොකක්ද කියල මතක නැද්ද?'' පොලිටික්කා සද්දෙට ඇහුවා.

''ඒකනේ. සර්ම කිව්වනම්,'' චමියා අඩියක් පිටුපස්සට තියලා ආරක්ෂාකාරී පියවරක් අනුගමනය කළා.

''ඇයි ළමයිනේ, පෙබරවාරි මාසේ නේද අපිට නිදහස හම්බ වුණේ. ඒක මොනතරම් වැදගත් සිදුවීමක්ද? ඒකවත් මතක නැද්ද?'' පොලිටික්කා උජාරුවෙන් උත්තර දුන්නා.

''කොහෙද සර්, ඒ ගැන හිතන්නවත් නිදහසක් නැහැනේ. ඔලුවේ ප්‍රශ්න ගොඩයි'' සමන පවුලෙ වැඩිහිටියන්ගේ දෙබස් කාණ්ඩයක් කට පාඩමින් කිව්ව.

''ළමයිනේ, අපේ රටේ නායකයෝ සටන් කර ලබාගත්තු නිදහස අපි ආරක්ෂාකර ගන්න ඕන.'' ටෙලිප්‍රොම්ටරය බලාගෙන නිදහස් දින කතාව කියවන ජනාධිපති වගේ පොලිටික්කා වචනවලට බර දාලා කතාව පටන් ගත්ත.

''ඇත්තටම සර් අපි නිදහස්ද?'' වසන්තිය ඇහුවේ ඔළොක්කුවට කියලා පොලිටික්කට තේරුනේ නැහැ.

''ඇයි දැන් බලන්න අපේ රට පාලනය කරන්නේ මහජනතාවගේ ඡන්දයෙන් පත්වුණු අපේම නායකයෝ''පොලිටික්ක එහෙම කිව්ව. ''ඒ උනාට ඒ ගොල්ලන්ට උපදෙස් දෙන්නේ ඇමරිකාවෙයි, යුරෝපයෙයි ඉන්දියාවෙයි ලොක්කොනේ.'' ඒ චමියාගේ හඬ. ''ඒ විතරක්යැ. අපේ රටේ මාධ්‍ය ප්‍රකාශකගේ වැඩේ කරන්නෙත් ඉන්දියාවෙ විදේශ ඇමති ක්‍රිෂ්ණානේ.'' සමන තව කෑල්ලක් එකතු කළා. පොලිටික්ක විභාග ප්‍රතිඵල වරද්දපු අධ්‍යාපන ලොක්කෙක් වගේ මුකුත් නොවුණ ගාණට අහක බලන් හිටියා.

''ඇත්තටම අපේ රටේ මොන තරම් නිදහසවල් තියෙනවද? නේද සර්? අපට ඉගෙන ගන්න නිදහස් අධ්‍යාපනය තියෙනවා.'' වසන්තිය එහෙම කිව්වාම පොලිටික්කා ප්‍රීතියෙන් පිනා ගියා. ''ඔව්, ඔව්, ළමයිනේ, තව කොයි තරම් දේවල් අපට තියෙනවද? කියලා ඒක අනුමත කළේ ඇමතිතුමා කියන හැමදේම අනුමත කරන අමාත්‍යංශ ලේකම් කෙනෙක් වගේ.

එතකොටම චමියා එතැනින් කතාවෙ ඉතුරු ටික පටන් ගත්තා. ''ඒ විතරද? අපට ඉගෙන ගන්න නිදහස තියෙනව වගේම අධ්‍යාපනය විකුණනන්න ආණ්ඩුවටත් නිදහස තියෙනවා. තරුණයන්ට රැකියා නොකර ඉන්න නිදහස තියෙනවා. ගොවියන්ට වගා නොකර ඉන්න නිදහස තියෙනවා. මිනිස්සුන්ට බඩගින්නේ ඉන්න නිදහස තියෙනවා. ආණ්ඩුවේ ලොක්කන්ට හොරකම් කරන්න නිදහස තියෙනවා. ජනතාවට පෙළපාලි යන්න නිදහස තියෙනවා. පොලීසියට ඔළු පලන්න නිදහස තියෙනවා. ....''

චමියා කථාව ඉවර කරන්න කලින් පොලිටික්කා හයියෙන් මේසෙට ගහල අඩි හප්පලා ''නිදහසට අපහාස කරන්න එපා අයිසේ'' කියලා කිව්වා.

''නෑ සර්, අපි නිදහසට අපහාස කරන්නේ නැහැ. අපට නිදහස හුඟක් වටිනවා. අපි නිදහසේ අගය හොඳටම දන්නවා. මොකද, අපට තාම සැබෑ නිදහස ලැබිලා නැති නිසා. ඉතින් නැති නිදහසකට රැවටෙනවා වෙනුවට ඇත්ත නිදහස වෙනුවෙන් සටන් කරන්නත් අපි දන්නවා.'' එහෙම කියලා සමන කතාව නවත්වන කොටත් පොලිටික්කා පංතියේ නොසිට හිමිං සීරුවේ ලිස්සලා ගිහින් තිබුණා.

13 පිටුවෙන් ඉරාන අර්බුදය......



මේජර් ජනරාල් ෂාඕෂෝන් පසුගියදා මාධ්‍යයට කියා තිබුණේ ලෝක යුද්ධ අනතුරක් මතුවුවද චීනය විසින් ඉරාන ජනරජය හමුදා ප්‍රහාරයකින් ආරක්ෂා කරනු ඇති බවයි. යුධ ගැටුමක් අබියස ඉරානයද ප්‍රතිචාරයක් නොමැතිවම සම්බාධක බාර ගැනීමට සූදානම් නැහැ. තම තෙල් වෙනුවට එම තෙල් අඩුව පිරවීම සඳහා නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු නොකරන ලෙස ඉරානය අරාබි අසල්වැසියන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ, යම් හෙයකින් එසේ වුවහොත් එම තෙල් ප්‍රවාහනය කෙරෙන ලොව තුන්වැනියට වැඩිම තෙල් නැව් ප්‍රමාණයක් ගමන් ගන්නා හෝමූස් සමුද්‍ර සන්ධිය (Strait of Hormuz) වසා දැමීමේ තර්ජනයක්ද සහිතවයි. මේ තත්වය තුළ එක්සත් ජනපදයට ගැටුමක් අවුලා ගැනීමට අවශ්‍යම නම් ඉරාන ධජය ඔසවන ලද නැවක් මගින් පළමු ප්‍රහාරය දියත් කිරීම පිළිබඳවද සලකා බැලිය හැකියි.


එහෙත් පවතින තත්වයන් අවි ගැටුම් සහිත යුද්ධයක් තබා දිග්ගැස්සුණු වාචික යුද්ධයක් පවා ධනවාදී ආර්ථිකයන්ට මරු පහරක් වනු ඇති බව පැහැදිලියි. බනිජ තෙල් මිල ඉහළ යාම එවැනි තත්වයක ඍජු ප්‍රතිඵලය වනු ඇති. බිස්නස් ඉන්සයිඩර් වැනි ආර්ථික පුරෝකථන සමාගම් අපේක්ෂා කරන්නේ, 2012 වසර තුළ මෙම ආතතිකාරී තත්වයන් දිග්ගැස්සුණහොත් තෙල් බැරලයක මිල ඩොලර් 150කට ඉහළ යනු ඇති බවයි. එය දැනටමත් උද්ධමනයෙන් බැටකමින් සිටින එක්සත් ජනපද හා යුරෝපා ආර්ථිකයන්ට මරු පහරක් වනු නිසැකයි.

දෙපළුවන ලෝකය

අනෙක් අතට ඉරාන න්‍යෂ්ටික බලාගාර ඉලක්ක කරගනිමින් සිදුවන යුදමය පහරදීමක් ඵලදායී නොවන බවට ඉදිරිපත් වන කරුණුද එක්සත් ජනපදය දුර්මුඛ කරනු ඇති. ආක්‍රමණයක් සිදුකරගත නොහැකිව 1981 දී ඊශ්‍රායලය විසින් ඉරාකයට එල්ල කළ අන්දමේ ප්‍රහාරයක් දැනටමත් න්‍යෂ්ටික දැනුම සතු ඉරානයේ න්‍යෂ්ටික ව්‍යාපෘතිය බිම්ගත කරවිය හැකි බව පැවසෙනවා. ජාත්‍යන්තර පරමාණු බලශක්ති ඒජන්සියේ අනුමැතිය ලත් න්‍යෂ්ටික බලාග ාරයකට පහරදීම නීති විරෝධී ආක්‍රමණික ක්‍රියාවක් වනවා පමණක් නොව ඉන් උද්ගතවිය හැකි විකිරණ මුදාහැරීමක් දශ ලක්ෂයකට මරු කැඳවිය හැකියි. පරමාණු බලශක්ති ඒජන්සියේ හා න්‍යෂ්ටික අවිහරණ ගිවිසුමේ සාමාජිකයෙකුවීම අර්ථ ශූන්‍ය කරන එවැනි ප්‍රහාරයක් ලෝකයට ලබාදෙනු ඇති ආදර්ශය ඉතා බරපතළ වනු ඇති භෞතිකව සිදුවන විනාශයක් ඉරාන ආණ්ඩුව රටතුළ ශක්තිමත් කරවනු ඇති අතරම කලාපීය වශයෙන් ඇමරිකානු, යුරෝපීය හා ඊශ්‍රායල් ජීවිත හා දේපළ දැඩි අවධානමකට හෙළනු ඇති. ඉරාකයට, ඇෆ්ගනිස්ථානයට හා ලිබියාවට ප්‍රහාර එල්ල කිරීමේදී යම් ආකාරයක සාධාරණත්වයක් ව්‍යාජ තොරතුරු මගින් තහවුරු කිරීමට අධිරාජ්‍යවාදීන් සමත් වුවද ඉරානය අරභයා එවැනි පරිසරයක් ගොඩනගා ගැනීමට මෙතෙක් ඔවුන් අසමත්. මේ තත්වය තුළ එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදයේ ඉරාන දඩයම් තැත හුදු කඩදාසි කොටියෙකුගේ ගෙරවීමකට වැඩි දෙයක් නොවීමටත් ඉඩ තිබෙනවා.

කෙසේ වුවද ඉරානය අරභයා අධිරාජ්‍යවාදී රටවල් ගොස් ඇති දුර ඔවුනට ආපසු හැරීමට ඉඩ නොදෙන තරම්. ආර්ථික අර්බුදය උග්‍රවීමේ අනතුරක් තිබියදීම සෙසු සාධක සියල්ල නොසලකා නව ගොදුරු බිමකින් අර්බුදයට විසඳුම් පතා පහරදීමක්ද සිදුවිය හැකියි. එවැන්නක් එක්සත් ජනපදයේ නව ගෝලීය භූමිකාව තීරණය කෙරෙන ෂෂඹ වන ලෝක යුද්ධයක් දක්වා ඇදී යාම අපේක්ෂා කළ හැකි නරකම ප්‍රතිඵලය වනු ඇති. ඉන් මෙපිට සිදුවිය හැකි දේද ලෝක දේශපාලනයේ නව සන්ධිස්ථානයක් විය හැකියි. එය එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවල් එක්පසෙකටත් ඉරානය, චීනය හා රුසියාව ඇතුළු තවත් රටවල් අනෙක් පසෙටත් බෙදෙන නව සීතල යුද තත්වයක් වීමට ඉඩ තිබෙනවා. අනෙක් අතට වහසිබස්වලට වැඩි යමක් ඉරානය අරභයා සිදුකර ගැනීමට එක්සත් ජනපදයට නොහැකි වුවහොත් මැදපෙරදිග මිතුරා වන ඊශ්‍රායලය හා එක්සත් ජනපදය අතර සබඳතා පළුදු වීමටත් මැදපෙරදිග කලාපයේ එක්සත් ජනපද භූමිකාව හැකිළී යාමටත් ඇති ඉඩකඩ බැහැර කළ නොහැකියි.

9 පිටුවෙන් කැටය කඩා සුදු කෙළීම......



ඔහු බදු ගෙවයි. අනෙක් අතට තමන්ගේ වැටුපෙන්ම කපා හරින අර්ථසාධක අරමුදලද නායකයින්ගේ 'මහල් මේනියාව' වෙනුවෙන් ආණ්ඩුවට කපා ගැනීමට ඉඩ දීමට ඔවුන්ට සිදුව ඇත. තැලෙන යකඩය කම්කරුවාය. තලන මිටිය ආණ්ඩුවය. හිතූ හිතූ ලෙස තැලීමේ බලය ලබාගෙන ඇත්තේ, ප්‍රෝඩාකාරී ජනවරමෙන්ය. තම දරුවාගේ කැටය කඩා අරක්කු බොන බේබදු පියවරුන්ගේ තත්වයට වැටී ඇති ජනතා ද්‍රෝහී පාලනයේ රැවටීමෙන් මෝහනයට පත් නොවී මේ අසාධාරණ පාලනය එවැනි පාලනයන් රකින මේ සමාජයත් වෙනස් කිරීමට වැඩකරන ජනතාව සූදානම් විය යුතුය. අද කප්පාදු වන්නේ, අර්ථසාධකය නම් හෙට කප්පාදු වන්නේ, තමන් දැනට ලබන සොච්චම් වැටුප විය හැකිය. යුරෝපය ග්‍රීසිය පුරා වැඩ කරන ජනතාව අද වීදි බැස ඇත්තේ, එවැනි වැටුප් කප්පාදුවලට එරෙහිවය. ලාංකේය වැඩකරන ජනතාවටද ඔවුන් සමග වීදි බැසීමට සිදු වන දිනය වැඩි ඈතක නොවනු ඇත.

5 පිටුවෙන් ගොවි ජනතාවගේ ජීවිත...



*නියමුවා: මතුවෙන සංකීර්ණ දේශපාලන වටපිටාව හමුවේ ජනතාවට මග පෙන්වන දේශපාල ව්‍යාපාරයකට විශාල භූමිකාවක් නිර්මාණය වෙනවා. ඒ හා සමපාත වීමට ජනතා විමුක්ති පෙරමුණට ඇති වැඩපිළිවෙළ මොකක්ද? ඒ වටා ජනතාව සංවිධානය කළ හැකි බවට ඔබට ඇති විශ්වාසය.*

*අනුර දිසානායක සහෝදරයා:* ඔව්. දිනෙන් දිනම උග්‍ර වන සමාජ අර්බුද හමුවේ පෙන්නුම් කරමින් තිබෙන්නේ, ඒත්තු ගන්වමින් තිබෙන්නේ, තවදුරටත් මෙම සමාජ ක්‍රමය තුළ අර්බුදවලට විසඳුම් නොමැතිවා පමණක් නොව අර්බුද තව තවත් තිව්‍ර වන බවයි. ඒ අර්බුද හමුවේ රාජපක්ෂ පාලනයට ඉතිරිව ඇත්තේ, තවදුරටත් සහන හා සේවා කප්පාදු කරන, අධිරාජ්‍යවාදයට ආර්ථිකයේ සාරය උරාබීමට ඉඩ සකසන, ස්වාභාවික සම්පත් බහුජාතික සමාගම් වෙත පවරන නව ලිබරල් ධනවාදයේ ගමන්මගමයි. එහෙයින් අන් කවරදාකටත් වඩා අද සිදුවන සිදුවීම් විසින් ජනතාවට ඒත්තු ගන්වමින් තිබෙනවා, මෙම සමාජ ක්‍රමයේ අසාර්ථකභාවයත් නව සමාජ ක්‍රමයක අවශ්‍යතාවයත්.

ඒ වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ සියලුම පීඩිත ජනතාවගේ විමුක්තිය වෙනුවෙන්, නිදහස වෙනුවෙන් අරගලයක නිරත වෙනවා. ඒ අරගලය ජයග්‍රාහී ලෙස කෙළවර කළහැකි යැයි දැඩි විශ්වාසයක් අප සතුව තිබෙනවා. ඒ වෙනුවෙන් නායකත්වය දිය හැකි ශක්තිමත් පක්ෂයක් රෝහණ විජේවීර සහෝදරයා විසින් ගොඩනගනු ලැබුවා. අද අපට පැවරී තිබෙන කාර්යභාරය වන්නේ, එම පක්ෂය ජයග්‍රහණය තෙක් කැඳවාගෙන යාමයි. ඒ වෙනුවෙන් සියලු පීඩිත ජනතාව, සමාජ බලවේගයන් එක මධ්‍යස්ථානයක් වටා ඒකරාශී කිරීම වෙනුවෙන් පුළුල්තම සටන් මධ්‍යස්ථානයක් ගොඩ නැගීම වෙනුවෙන් අපි කටයුතු කරනවා.

16 පිටුවෙන් මානව නිදහස තහවුරු වන්නේ...



බව කීවා. නමුත් අද වනතුරුත් තමන්ගේ උත්තරය මොකක්ද කියලා ආණ්ඩුව හෙළිදරව් කර නැහැ. ආණ්ඩුවේ මූලික වගකීම තමන්ගේ විසඳුම අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට ඉදිරිපත් කිරීමයි. ඒ මූලික වගකීම ඉටු නොකර විවිධ සංකල්ප ඉදිරිපත් කරමින් ප්‍රශ්නය මගහැර යෑමට බෝලය පාස් කිරීම බරපතළ අනතුරුදායක තත්වයක්. අපි ආණ්ඩුවට බලකරන්නේ, ඉන්දියාව සතුටුකරන්න උත්තර දෙනවා වෙනුවට ප්‍රශ්නය විසඳීමට අදාල පියවර ගතයුතු බවයි.

උතුරේ ජනතාව මුහුණපා සිටින ඇත්ත ප්‍රශ්න කීපයක් තිබෙනවා. අවතැන් කඳවුරුවල ජීවත් වීමට සිදුවී තිබීම, නිවාස නොමැතිකම, අතුරුදහන් වූවන් පිළිබඳ ප්‍රශ්නය, රැඳවුම් කඳවුරුවල සහ සිරගෙවල්වල රඳවාගෙන සිටින්නන් ගැන ප්‍රශ්නය, අර්ධ මිලිටරි පාලනයක් යටතේ ජීවත්වීමට සිදුවී තිබීම සහ එම ජනතාවගේ නිවාස සහ ඉඩම් ලංකා ආණ්ඩුවත් ඉන්දියාවත් කොල්ලකමින් සිටීම පිළිබඳ ප්‍රශ්නය මේ වනවිට එම ජනතාව මුහුණ දෙන මූලික බරපතළ බවට පත්ව තිබෙනවා.

ආණ්ඩුව දැන් කරමින් ඉන්නේ, ඉන්දියාවේ බලකිරීම මත 1987 අත්සන් කළ රජීව් ගාන්ධි ගිවිසුම යළි බලාත්මක කිරීමට ඉන්දියාව කරන බලපෑමට යටවීමයි. ලංකාවේ ප්‍රශ්න ගැන පුවත්පත් සාකච්ඡා පවත්වන්න ඉන්දියාවට ඉඩදීමෙන් පැහැදිලි වන්නේ ඒ කාරණයයි. මහින්ද රාජපක්ෂ මහත්තයගේ ආණ්ඩුව බොරු දේශප්‍රේමය ගැන කතාකරමින් ඉන්දියාවට යටවී ක්‍රියා කරනවා. දෙමළ ජනතාවගේ ප්‍රශ්න විසඳීමට ඉන්දියාව මැදිහත් වී දිනා දුන් එක උත්තරයක් හෝ ලබාදුන් එක් අයිතිවාසිකමක් හෝ නැහැ. ඒ වෙනුවට ආණ්ඩුවට දේශපාලන බලපෑම් කරමින් මේ රටේ ජනතාවගේ සම්පත් කොල්ලකමින් විවිධ ව්‍යාපෘති පටන්ගෙන ඉන්දීය කම්කරුවන් යොදා රැකියා අවස්ථා ලබාදෙමින් ඉන්නවා.

මේ නිසා අපි දෙමළ ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ, ඉන්දියාව දෙමළ ජනතාවගේ ගැලවුම්කරුවෙකු නොව කපටි ආරක්ෂකයෙකුගේ භූමිකාව රඟපාන බව නිවැරදිව තේරුම් ගන්න කියලයි. ඉන්දියාවේ මේ හැසිරීම වගේම ලංකා ආණ්ඩුව ඊට ඉඩ දී තිබීම රටටත් ජනතාවටත් හානිකර බරපතළ ප්‍රශ්න ඇතිකිරීමට හේතුවී තිබෙනවා. ඇමතිවරු විවිධ කතා කීම වෙනුවට ආණ්ඩුවේ විසඳුම් ඉදිරිපත් කර රටේ සංවාදයකට ලක්කළ යුතු බව අපි අවධාරණය කරන්නේ මේ පසුබිම නිවැරදිව තේරුම්ගෙනයි.

ආණ්ඩුව ඉන්දියාවට එක දෙයක් කියනවා; ඊට සම්පූර්ණයෙන් වෙනස් දෙයක් අපේ රටේ ජනතාවට කියනවා; ඊටත් වඩා වෙනස් දෙයක් බටහිර රටවලට කියනවා. ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් හරි කෙලින් උත්තරයක් දෙන්නේ නැහැ. අපි ආණ්ඩුවට බලකරන්නේ, මේ කල්මැරීම නතර කර ආණ්ඩුවේ විසඳුම ඉදිරිපත් කරන ලෙසයි. ඒ විසඳුම සිංහල දෙමළ මුස්ලිම් ජනතාවගේ සමගිය ගොඩනැගීමේ දිසාවට ගමන් කරන්නක් විය යුතුයි. එසේ නොවී ජාතිකත්ව පදනමින් ජනතාව වෙන්කරන බෙදීමේ දිශාවට ගමන් නොකරන විසඳුමක් විය යුතුයි. ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස කරන ආකාරයට පවතින දුර්වල ධනවාදී ආර්ථික දේශපාලනයට මේ සැබෑ උත්තරය දිය නොහැකියි. සියලු ජනතාව එක්වී සමගිය තුළින් සමාජවාදී සමාජයක් නිර්මාණය කර ගැනීම තුළ පමණයි. ප්‍රශ්නයට ඇත්ත විසඳුම පවතින්නේ. ඒ නිසා අපි ජනතාවට ආරාධනා කරනවා. තවදුරටත් ප්‍රශ්නය මගහැරීමේ හෝ කල් දැමීමේ ආණ්ඩුවේ පිළිවෙතට විරුද්ධව සැබෑ විසඳුමක් වෙනුවෙන් පෙළ ගැහෙන්න කියලා.'' ටිල්වින් සිල්වා සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

3 පිටුවෙන් ඩිවොලූෂන් ද ?...



යමක් කියන්න බැහැ'' ආදී කතා කියමින් ප්‍රශ්නයෙන් මගහැර යන්නේද ආණ්ඩුවේ 'පෙනුම' හා 'හරය' තුළ පවතින මෙම ප්‍රතිවිරෝධය නිසාය. දෙබිඩි බව නිසාය.

**ආණ්ඩුවේ සැබෑ වගකීම**

ඉන්දීය විදේශ ඇමති ක්‍රිෂ්ණාට බොහෝ දේවල් දීමට පොරොන්දු වන 13ට එහා යාමට එකග වන ආණ්ඩුවත්, 13ට එහා ඉල්ලන ඉන්දියාවත්, දෙමළ ජාතික සන්ධානයත් දෙමළ ජනයාගේ සැබෑ ප්‍රශ්න හමුවේ නිහඬය. අන්ධය, ගොළුය, බිහිරිය. උතුරු නැගෙනහිර ජීවත් වන ජනතාවගේ මූලික ගැටලු විසඳීමට ආණ්ඩුව ආරම්භක ප්‍රවේශය හෝ ගැනීමට තවමත් අසමත්ව සිටී. විශේෂයෙන් උතුරේ ජනතාවගේ දැවෙන ප්‍රශ්න බවට පත්ව ඇති අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, ඉඩම් අහිමිවූවන් පදිංචිව සිටි ඉඩම් නැවත ලබාදීම, දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම, අතුරුදහන් වූවන්ගේ ගැටලුවලට විසඳුම් ලබාදීම, උතුරේ පවතින අර්ධ මිලිටරි පාලනය අවසන් කොට සිවිල් පාලනය තහවුරු කිරීම අධ්‍යාපන, සෞඛ්‍යය ගමනාගමන වැනි පහසුකම් ලබාදීම පරිපාලනමය බරපතළ ගැටලු විසඳීම වැනි ආණ්ඩුවට කළ හැකි අත්‍යාවශ්‍ය කරුණු පවා ඉටු නොකර සිටී. ජනතාවගේ ඇත්ත වුවමනාවන් බවට පත්ව තිබෙන එවැනි සරල ලෙස විසඳිය හැකි කරුණු පවා නොවිසඳු හිතුවක්කාරී ලෙස කටයුතු කරන ආණ්ඩුව 13ට එහාට යාමට ක්‍රිෂ්ණාට පොරොන්දු දේ. මින් නැවත නැවතත් පෙන්නුම් කරන්නේ ධනපති ක්‍රමය තුළ ජාතික ගැටලුව විසඳීමට නොව ජනතාවගේ මූලික අයිතීන් ලබාදීමට පවා ධනපති ක්‍රමයත්, ධනපති ආණ්ඩුවත් අසමත් බවය. මේ පිළිබඳ තවදුරටත් විවාදයන් තිබිය නොහැක.

**ඩිවොලූෂන් වෙනුවට රෙවොලූෂන්**

ජාතික ප්‍රශ්නයට විසඳුම් දීමේදී ඊට විසඳුම් මාවත් දෙකක් තිබෙන බවත් එය පංති අරමුණු දෙකක් නියෝජනය කරන බවත් මෙහි කලින්ද සඳහන් කළෙමු. ජාතික ප්‍රශ්නයේදී ධනපති පංතියට, අධිරාජ්‍යවාදයට ඉන්දීය ආධිපත්‍යවාදයට හා බෙදුම්වාදයට ඇත්තේ එකම විසඳුමකි. එය බලය බෙදීම මගින් රට බෙදීමය. ජනතාව බෙදීමය. පංතිය බෙදීමය. මතවාදයක් ලෙස කලක් පැවැති බෙදුම්වාදය පසුගිය කාලයේ සන්නද්ධ අරගලයක් දක්වා වර්ධනය වූයේ ඉහත බලවේගයන්ගේ ක්‍රියාකාරිත්වය තුළය. බෙදුම්වාදයේ සන්නද්ධ බලය පරාජය කළද ඉන් වසර 03ක් ගත්වෙද්දීත් ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් දීමට, ඔවුනට ප්‍රජාතන්ත්‍රවාදය ලබාදීමට සමාන ලෙස සැලකීමට ආණ්ඩුව අපොහොසත්වීම හා අධිරාජ්‍යවාදයේ න්‍යායපත්‍රයට අනුව කටයුතු කිරීම නිසා නැවත බෙදුම්වාදී දේශපාලනය වර්ධනය වෙමින් තිබේ.

පසුගිය දා දෙමළ බුද්ධිමතුන් යැයි කියාගන්නා පිරිසක් විසින් නිකුත් කළ නිවේදනයක් මගින් කියා තිබුණේ වෙනම රාජ්‍යයක් සඳහා කළ සටන දිගටම ගෙන යායුතු බවත්, ඊට මෙහා බලය බෙදීමේ විසඳුම් පිළිගැනීමෙන් වෙනම රාජ්‍යයේ සටන දුර්වල විය හැකි නිසා එවැනි අන්දමේ විසඳුම් භාර නොගන්නා ලෙස දෙමළ ජාතික සන්ධානයට බලකරන බවත්ය. දැන් රාජපක්ෂ ආණ්ඩුවද දෙමළ ජනයාගේ මූලික ප්‍රශ්න නොසලකා හරමින් සිදුකරන්නේ දෙමළ ජනයා බෙදුම්වාදය වෙතම තල්ලු කිරීමය.

සිංහල, දෙමළ, මුස්ලිම් අපේ පංතියේ ජනතාවගේ වුවමනාවේ පැත්තෙන් කල්පනා කරන විට ජාතික ගැටලුව විසඳීම සඳහා ජනතාවගේ අරගලයේ ප්‍රවේශය විය යුත්තේ, නිර්ධන පංතියේ පැත්තෙන් ප්‍රශ්නයට විසඳුම් සෙවීමය. ධනපති පංතියේ හා අධිරාජ්‍යවාදයේ විසඳුමට විකල්ප නිර්ධන පංතියේ විසඳුම පදනම් වනුයේ, සමානාත්මතා පදනම මත අයිතීන් දීමත්, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමත් මතය. අත්තනෝමතික මධ්‍යගතකරණය හෝ අත්තනෝමතික විමධ්‍යගතකරණය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතකරණය නිර්ධන පංති විසඳුමේ මූලධර්මය වේ. ජනතාව බෙදීම වෙන්කිරීම හා හුදකලා කිරීම වෙනුවට ජනතාව එකතු කිරීම හා සමගි කිරීම එහි අරමුණ වේ. මේ යුගයේදී එවැනි අරමුණු මත පිහිටා කටයුතු කිරීමට ධනවාදය අසමත්ය. එබැවින් ජාතික ප්‍රශ්නය සැබෑ ලෙසම විසඳිය හැක්කේ, සමාජවාදයට පමණි. ඒ සඳහා අවශ්‍ය වන්නේ, සිංහල, දෙමළ, මුස්ලිම් නිර්ධන පංතියේ පංති සමගියත් ධනවාදයට එරෙහි අරගලය සහ සමාජ විප්ලවයක්ය. ඒ අනුව ජාතික ප්‍රශ්නයට සැබෑ විසඳුම ඇත්තේ, බලය බෙදීම හෙවත් 'ඩිවොලූෂන්' තුළ නොව සමාජ විප්ලවය හෙවත් 'රිවොලූෂන්' තුළය. එබැවින් ධනපති පංතියේ 'ඩිවොලූෂන්'වලට එරෙහිව නිර්ධන පංතියේ සටන් පාඨය විය යුත්තේ 'රිවොලූෂන්ය'. ඒ අනුව අපේ රටේ ජනතාව විශේෂයෙන්ම දෙමළ ජනතාව ධනපති පංතියේ 'ඩිවොලූෂන්' වෙනුවට නිර්ධන පංතියේ 'රිවොලූෂන්' තෝරාග න්නා දින අධිරාජ්‍යවාදයේ පරාජයත් ධනවාදයේ පරාජය, ජාතිවාදයේ පරාජය සනිටුහන් වීමත් ජනතාවගේ ජයග්‍රහණය ජාතික සමගියේ ජයග්‍රහණය සමාජවාදයේ ජයග්‍රහණය ආරම්භවීමත් සිදුවනු ඇත. අපගේ වගකීම ඒ වෙනුවෙන් කටයුතු කිරීමය.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## දිනාගත යුතුව ඇති නිදහස

මෙම පෙබරවාරි 04 දාට යෙදී ඇති ''64 වන නිදහස් දින උත්සවය'' සැමරීම සඳහා රාජපක්ෂ ආණ්ඩුව ලහි ලහියේ සූදානම් වෙමින් සිටී. එහෙත් ජීවත්වීම සඳහා ජීවිතය සමඟ පොරබදන සාමාන්‍ය ජනතාවට ඊට සහභාගි වීමට තබා ඒ ගැන සිතීමටවත් වෙලාවක් නැත; නිදහසක් නැත. එසේ වුවද සුපුරුදු ලෙස පෙබරවාරි 4දාට 'නිදහස් දිනය' වෙනුවෙන් රාජ්‍ය උත්සවයක් පවත්වන පාලකයින්, තානාපතිවරුන් ඇතුළු ප්‍රභූන් පිරිවරාගෙන, හමුදා ආචාර පෙළපාලි මැද 'දිනාගත් නිදහස රැකගැනීම' ගැන, 'නිදහසේ අසිරිය' ගැන සඳහන් කරමින් උඩඟු ලීලාවෙන් නිදහස් දින කථාවක්ද පවත්වනු ඇත. මෙවර මෙම ඊනියා නිදහස් දින සැමරුම සඳහා රාජපක්ෂ පාලනය අනුරාධපුර දිස්ත්‍රික්කය තෝරාගෙන තිබෙන අතර ඊට සමගාමීව මහජන මුදල් කෝටි ගණනක් වැයකොට දැයට කිරුළ ප්‍රදර්ශනයද පවත්වමින් තිබේ.

ආණ්ඩුවේ නිදහස් දින කානිවල් දෙස බලා දෑස් නිලංකාර කර නොගෙනම සැබෑ ලෙසම ශ්‍රී ලංකාවේ ජනතාවට නිදහස ලැබී තිබේද යන කරුණ පිළිබඳවත්, සැබෑ නිදහස යනු කුමක්ද හා එය දිනාග න්නේ කෙසේද යන්න පිළිබඳවත් ගැඹුරින් සිතා බැලීම අත්‍යවශ්‍යය.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් 1815 සිට සෘජු යටත් විජිතයක් ලෙස පවත්වාගෙන ගිය ලංකාවට 'නිදහස' දෙනු ලැබූයේ 1948 පෙබ.04දාය. සැබෑ ලෙසම බ්‍රිතාන්‍යයන් ලංකාවේ ජනතාව පිළිබඳව ඇතිකරගත් 'පතල මහා කරුණාවකින් යුතුව' අපේ රටට නිදහස දුන්නා නොව යටත්විජිතවාදය තව දුරටත් ගෙනයාමට නොහැකි තත්වයක් ලෝක දේශපාලනය තුළ මතුවූ විට, යටත්විජිත තුළ අරගල මතුවී සැබෑ ලෙසම නිදහස දිනාගැනීමට ජනතාව සටන් කරන විට, තම යටත් විජිතය වෙනත් ලෙසකින් රැකගැනීම සඳහා වූ උපක්‍රමයක් ලෙස, එනම් නව නව යටත්විජිත උපක්‍රමයක් ලෙස ලංකාවට නිදහස ලබා දුන්නේය. සෘජු බ්‍රිතාන්‍ය පාලනය වෙනුවට බ්‍රිතාන්‍යයන්ගේ පාලනය තුළ බිහිවූ අධිරාජ්‍ය ගැති තමන්ගේ සේවකයන් වූ ලාංකේය ධනපතින්ට බලය ලබාදීම සිදුකරන ලදී. ලංකාවේ පාලකයන් සමරන්නේ එම අවස්ථාවය.

සැබෑ ලෙසම අපේ රට සමාජ ආර්ථික දේශපාලන අර්ථයෙන් නිදහස් නැත. මේ වන විටත් ලංකාවේ ආර්ථික ගමන්මග තීරණය කරනුයේ මූල්‍ය අරමුදල වැනි අධිරාජ්‍යවාදී ආයතන හා අධිරාජ්‍යවාදී රටවල්ය. ජාතික ප්‍රශ්නයට 'විසඳුම' බලය බෙදීම ලෙස තීරණය කරන්නේ අධිරාජ්‍යවාදීන්ය; ඉන්දියාවය. ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තීරණය කරන්නේ ලෝක බැංකුවය. ලංකාවේ ඉදිකිරීම් පවතින්නේ, විදේශ සමාගම් අතේය. ලංකාවේ වටිනා ඉඩම් අත්පත්කර ගනිමින් සිටින්නේ, විදේශ සමාගම්ය. මෙවැනි උදාහරණ රැසකින්ම පෙන්වන්නේ, ලංකාව රටක් ලෙස සැබෑ ලෙසම ස්වාධීන හෝ නිදහස් නැති බවය.

එසේම රට තුළ ජනතාවද නිදහස් නැත. උතුරේ ජනතාව මත තවමත් අර්ධ මිලිටරි බලහත්කාරයක් පවතී. මාධ්‍යවේදීන්ට සිය කාර්යය සඳහා නිදහස නැත. වෘත්තීය සමිතිවලට තම අයිතීන් සඳහා සටන් වැදීමේ නිදහස නැත. ශිෂ්‍යයන්ට, නිදහසේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය, තරුණයින්ට රැකියාවක් කිරීමේ අයිතිය, ජනයාට තම අයිතීන් සඳහා සටන් වැදීමේ අයිතිය නැත. එය සත්‍ය නොවන බවත් මේ සියලු දෙනාටම නිදහස ඇති බවත් පාලකයන් කෑමොර දී පවසනු ඇත. එහෙත් සත්‍යය නම් මේ සියලු දෙනා සඳහා පවතින්නේ, කප්පාදුකරන ලද සීමාකරන ලද ව්‍යාජ හා කුහක නිදහසක් බවය.

අධිරාජ්‍යවාදී ලෝකයක් තුළ නව ලිබරල්වාදය යටතේ පසුගාමී ධනපති රටවල්වලට ඉන් 'නිදහස්' විය නොහැක. එබැවින් එකී රටවල ජනතාවටද නිදහසක් නැත. ධනවාදයේ iෘෂමාන හා අදෘෂ්‍යමාන දහසක් බැම්වලින් ඔවුන් බැඳ තිබේ. දහසක් පීඩාවන් ඔවුන් මත පටවා තිබේ. එකී අර්ථයෙන් ගත්කල අප වැනි රටවල තිබෙන බව කියන රටේ නිදහසත් ජනතාවගේ නිදහසත් මිත්‍යාවකි. සැබෑනිදහස දිනාගත යුතු දෙයක්ව පවතී.

මානව වර්ගයා සතු ඉහළම සම්පත වන්නේ නිදහසයි. මානව ඉතිහාසය පුරාම නිදහස අභිමිකරනු ලැබ ජනතාවෝ නිදහස වෙනුවෙන් අරගල කළහ. දිවි පිදූහ. වහල් බවින් නිදහස්වීමට වහලුන් සිදුකළ අරගලවල සිට නූතන ධනවාදය දක්වාම නිදහස් අරගල පැතිර පවතී. මිනිසුන් නිදහසට කොතරම් ඇලුම් කරන්නේද යන්න ඉන් පැහැදිලි වේ. එහෙත් මිනිසා නිදහස වෙනුවෙන් සටන් කිරීමට නම් පළමුව ඔහු තමා නිදහස් නොමැති බව වටහා ගත යුතුය. දෙවනුව නිදහස වටිනා දෙයක් බව තේරුම් ගත යුතුය. තමන් නිදහස් ජනතාවක් නොවන බව මිනිසුන් නොදැන සිටින විටද, නැති නිදහසක් ගැන පුරසාරම් දොඩන විට හා ප්‍රීති උත්සව පවත්වන විටද ජනතාවට රැවටීමට ලක්වේ. එවිට සැබෑ නිදහස දිනා ගැනීමට නොහැකි වේ. අනෙක් අතට මිනිසා සිය පීඩනයන්ට පුරුදුවූ විට සමහර වහලුන් සිය යදම්වලට ඇලුම් කළා සේ තම පීඩාවන් තුළ ජීවත්වීමට කැමැති වූ විටද නිදහස දිනාගැනීමට නොහැකි වේ.

දැන් අවශ්‍යව ඇත්තේ බොරු නිදහසක් පිළිබඳව කෙරෙන මිත්‍යාවන්ගෙන් මිදී සංදර්ශනවලට නොරැවටී වහල්භාවය කැමැත්තෙන් තෝරාගැනීම අතහැර සැබෑ නිදහස වෙනුවෙන් සටන් කිරීමය. අරගල කිරීමය. මේ යුගයේදී එකී අරගලය අධිරාජ්‍යවාදයට එරෙහිව මෙන්ම දේශීය ධනපති පාලකයන්ට එරෙහි එකක්ද විය යුතුය. පාලකයින් විසින් බොරු නිදහස සමරන මේ දිනවලදීම සැබෑ නිදහස සඳහා අරගල කිරීමට සිංහල දෙමළ මුස්ලිම් සියලු ජනයා අධිෂ්ඨාන කරගන්නේනම් රටටත් ජනතාවටත් සැබෑ නිදහස උදා වීම වැඩි ඈතක නොවන්නේය.

## මානව නිදහස තහවුරු වන්නේ සමාජවාදී සමාජයක් තුළ පමණයි

### ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



බලය බෙදීම ජාතික ප්‍රශ්නයට සැබෑ විසඳුම නොවන බවත් වර්තමානයේ ධනපති පාලනයට ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ලබාදිය නොහැකි බවත් අවධාරණය කළ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මූලික ගැටලු විසඳාග ැනීමේ අරගලය තුළින් යම් ජයග්‍රහණ ලබාගත හැකි වුවත් එම ජයග්‍රහණ ස්ථිර ජයග්‍රහණ බවට පත්කරගැනීමට නම් සමානාත්මතාවය සහිත ආර්ථික හා දේශපාලන අයිතිවාසිකම් තහවුරු කෙරෙන මානව නිදහසක් ඇත්ත අර්ථයෙන් ක්‍රියාත්මක කළ හැකි සමාජවාදී සමාජයක් අවශ්‍ය බව ප්‍රකාශ කළේය.

ඔහු මේ බව කියා සිටියේ, ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පසුගිය 22වැනි දින පැවති මාධ්‍ය හමුවකදීය.

''ජාතික ප්‍රශ්නය පිළිබඳ සාකච්ඡාව යළිත් ඇතිවී තිබෙනවා. ආණ්ඩුව කරමින් ඉන්නේ, ප්‍රශ්නය තව තවත් ව්‍යාකූල සහ සංකීර්ණ කිරීමයි. දෙමළ ජනතාවගේ මූලික අයිතිවාසිකම් ලබාදෙනවා වෙනුවට ඉන්දීය බලපෑම මත විවිධ විසඳුම් ගෙනඒමට උත්සාහ කරනවා. නමුත් මේ කිසිම උත්තරයක් උතුරේ දෙමළ ජනතාවගේ සැබෑ ප්‍රශ්නවලට විසඳුම් නොවේ. ආණ්ඩුව ඉන්දියාවේ පදයට නටනවා විතරයි. ඒ වගේම ප්‍රශ්නය මග හැර යෑමට විවිධ උත්සාහයන් දරනවා.

ඉන්දීය විදේශ ඇමතිවරයා ලංකාවේදී පුවත්පත් සාකච්ඡාවක් කර 13 ව්‍යවස්ථා සංශෝධනය ඉක්මව වූ බලය බෙදීමකට ජනාධිපතිවරයා එකඟ වූ බව ප්‍රකාශ කළා. අපිට ප්‍රශ්නයක් මතුවෙනවා, ලංකා ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රකාශක ක්‍රිෂ්ණා ඇමතිවරයාද කියලා. මේක බරපතළ තත්වයක්. රටේ අභ්‍යන්තර ප්‍රශ්නවලට ඇඟිලි ගැසීමක්. ඉන්දීය විදේශ ඇමතිවරයා කරුණු දක්වූ පසු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිවරයා සෙනෙට් සභාවක් ගැන හෙළිකළා. සෙනෙට් සභාවේ සංයුතිය මොකක්ද කියන කිසිම නිවැරදි තොරතුරු ඒ තුළ තිබුණේ නැහැ. අපි කියන්නේ මේ එකක්වත් දෙමළ ජනතාවගේ ප්‍රශ්නයට ඇත්ත උත්තරේ නෙවෙයි කියලා. ආණ්ඩුවේ විවිධ පාර්ශව විවිධ කතා කියමින් ප්‍රශ්නය සංකීර්ණ තත්වයකට ගේනවා.

ජාතික ප්‍රශ්නයට උත්තරය සූදානම් කර අවසන් බව පසුගිය ජනාධිපතිවරණය සහ මහා මැතිවරණයේදී ආණ්ඩුව ප්‍රකාශ කළා. ශක්තිමත් ආණ්ඩුවක් පිහිටුවීමෙන් පසුව එය ක්‍රියාත්මක කරන

15 වැනි පිටුවට

## ජ.වි.පෙ. නායක - ස්වීඩන් වාමාංශික පක්ෂය අතර හමුවක්



පසුගිය 6-9 දිනවල පැවති ස්වීඩනයේ වාමාංශික පක්ෂයේ 39 වන පක්ෂ සම්මේලනය සඳහා එම පක්ෂයේ ආරාධනයකට අනුව ජනතා විමුක්ති පෙරමුණේ නායක, විදේශ කටයුතු පිළිබඳ ලේකම් සෝමවංශ අමරසිංහ සහෝදරයා සහභාගි විය.

මෙය ජවිපෙ නායකයෙකු ස්වීඩනයේ වාමාංශික පක්ෂයේ සමුළුවකට සම්බන්ධ වූ පළමු අවස්ථාව වූ අතර ලංකාවේ වාමාංශික පක්ෂයක් වශයෙන් එම අවස්ථාව ලැබී තිබුණේ, ජ.වි.පෙ.ට පමණක් වීම විශේෂත්වයකි. සෝමවංශ අමරසිංහ සහෝදරයා ජනවාරි 7,8 යන දිනයන් දෙකෙහි දී එම සම්මේලනයේ උත්සව අවස්ථාවට සහභාගි වූ අතර සමුළුව ඇමතීමටද ඔහුට අවස්ථාව හිමිවිය. සමුළුවෙන් අනතුරුව ස්වීඩනයේ වාමාංශික පක්ෂයේ නායකයින් රැසක් හමුවීමට සෝමවංශ අමරසිංහ සහෝදරයා අවස්ථාව උදාකරගත්තේය. රටවල් රැසක වාමාංශික පක්ෂ නියෝජිතයෝ ආරාධිතයින් ලෙස මෙම සමුළුවට සහභාගි වී සිටියහ.

## මැතිවරණ සංශෝධන සමග විධායක ජනාධිපති ධූරයත් අහෝසි විය යුතුයි!

### අනුර දිසානායක සහෝදරයා



මනාප ඡන්ද ක්‍රමය කෙරෙහි ජනතාව තුළ තිබෙන පොදු විරෝධයට මුවාවී පළාත්පාලන මැතිවරණ නීති සංශෝධනය කිරීමේ පනතක් සම්මත කරගැනීමට ආණ්ඩුව උත්සාහ දරන බවත් වර්තමාන දේශපාලන සංස්කෘතියේ අන්ත පරිහානිය පනත් සම්මත කිරීමෙන් වැළැක්විය නොහැකි බවත් මැතිවරණ පනත් සම්මත කිරීමට අදාල ඕනෑම සංශෝධනයක් සමග විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ කොන්දේසියට බැඳී තිබිය යුතු බවත් ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක අනුර දිසානායක සහෝදරයා කියා සිටියේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ, පසුගිය 08වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර සහෝදරයා, ''අවම හෝ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු නොකර විධායක ජනාධිපති ධූරයට සහ අන්ත පරිහානික දේශපාලන සංස්කෘතියට තවදුරටත් පාර කපන පළාත් පාලන මැතිවරණ සංශෝධන පනතට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරනවා. එය පරාජය කිරීමට කළහැකි සියලු ක්‍රියාමාර්ග ගන්නවා'' යැයි අවධාරණය කළේය.

## නිදහස් අධ්‍යාපනය රකින බවට ප්‍රතිපත්තිමය ස්ථාවරයක් ඕනෑ!

### ජ.වි.පෙ. ආණ්ඩුවට අභියෝග කරයි

ජනාධිපතිවරයා පෞද්ගලික විශ්වවිද්‍යාල පනත ඉක්මනින් නොගෙනෙන බව පවසා තිබෙන නමුත් අවශ්‍ය වන්නේ, එය කල්පසුකිරීමෙන් යළි ගෙන ඒම නොව පෞද්ගලික විශ්වවිද්‍යාල ඇතුළු නිදහස් අධ්‍යාපනය අහෝසි කිරීමේ ක්‍රියාමාර්ග නොග න්නා බවට ප්‍රතිපත්තිමය ස්ථාවරයකට යාම යැයි පසුගිය 13වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී දේශපාලන මණ්ඩල සභික අනුර දිසානායක සහෝදරයා ආණ්ඩුවෙන් ප්‍රශ්න කර සිටියේය.

''එය පසෙක තබා මාළඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය උපාධිය පිළිගන්නා බව පසුගිය අගෝස්තු මස උසස් අධ්‍යාපන ඇමතිවරයා නිකුත් කළ ගැසට් නිවේදනයකින් තහවුරු කර තිබෙනවා. ශිෂ්‍ය අරගල නිදහස් අධ්‍යාපනය රැකගැනීමේ මූලික අරමුණෙන් බැහැරව වෙනත් පාර්ශවීය කරුණු වෙත යොමු කිරීමේ උත්සාහයක් ආණ්ඩුවට තිබෙන බව පැහැදිලියි. නමුත් ශිෂ්‍යන් ආණ්ඩුවේ අවශ්‍යතාවයන් අනුව එම පාර්ශවීය කරුණුවලට විරුද්ධව අරගල කිරීම වෙනුවට මූලික ප්‍රශ්නය සමඟ බැඳී පවතින බරපතළ තත්වය තේරුම් ගනිමින් කටයුතු කරන ලෙස අපි ශිෂ්‍ය ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනවා.

විශ්වවිද්‍යාල ශිෂ්‍යන්ගේ ප්‍රශ්න මේ ආකාරයෙන් වර්ධනයවීමට ආණ්ඩුව ඉඩදී ක්‍රමානුකූලව රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය බිඳවට්ටමින් තිබෙනවා. එයට සමාන්තරව පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවා ප්‍රමිතියෙන් යුත් උපාධි පිරිනැමීමට කටයුතු කරමින් සිටිනවා. මේ තත්වය අපේ රටේ විශේෂයි. මුදලාලිලා කීපදෙනෙකුගේ අවශ්‍යතාවයට අනුව මුළු විශ්වවිද්‍යාල පද්ධතියම හැසිරවීමේ මණ්ඩලයක් යෝජිත විශ්වවිද්‍යාල පනතින් පිහිටුවීමට නියමිතයි. එම මණ්ඩලයේ සාමාජිකයින් 11යි. ඉන් 09ක්

02වැනි පිටුවට

## සපිරි පාසැල් නිදහස් අධ්‍යාපනය විනාශ කිරීමේ ව්‍යාපෘතියක්

### ජනතා විමුක්ති පෙරමුණ

දේශපාලකයින්ගේ අවශ්‍යතාවය මත ආණ්ඩුව සපිරි පාසැල් නම් කරමින් පාසැල් අධ්‍යාපනය අවුල් ජාලාවක් බවට පත් කර ඇති බවත් මේ ක්‍රියාත්මක කිරීමේදී බරපතළ ව්‍යාකූල තත්වයන් ඇතිවී පාසැල් අධ්‍යාපනය බිඳවැටෙන තත්වයට පත්වී ඇති බවත් ජ.වි.පෙ. පාර්ලිමේන්තු කණ්ඩායම් නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

ඔහු මේ බව කියා සිටියේ, පසුගිය 29වැනි දින පැලවත්ත ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදීය.

''සපිරි පාසැල හා ඒ අවට පෝෂිත පාසැල් 3-5 අතර ගණනක් ඇතුළත් වෙනවා. පෝෂිත පාසැල් ප්‍රාථමික අධ්‍යාපනයට සීමා වෙනවා. සපිරි පාසල ද්විතීයික ආධ්‍යාපනයට සීමාවෙනවා. මුලින්ම සපිරි පාසැල් 1000ක් තෝරාගත් බව ආණ්ඩුව කියනවා. අපි ප්‍රශ්න කරන්නේ මේ තොරාගත් නිර්ණායකය කුමක්ද? ජන ඝනත්වය, භූගෝලීය පිහිටීම, ජන වර්ගවල විසිරීම, මේ ආදී කිසිවක් සැලකිල්ලට ගෙන නැහැ. දේශපාලකයින්ගේ අවශ්‍යතාවය මත සපිරි පාසැල් ගොඩනගලා. එයින් අවුල් ජාලාවක් බවට පාසැල් අධ්‍යාපනය පත් කරලා. පහුගිය දිනවල මේ ව්‍යාපෘතියට විරුද්ධව පෙළපාලි වර්ග දෙකක් පැවැත්වුණා. එකක් සපිරි පාසැල් එපා යනුවෙන්. අනෙක සපිරි පාසැල් ඕනෑ යනුවෙන්.

02 වැනි පිටුවට

කොළඹ 10, පංචිකාවත්ත පාරේ අංක 198/19 හි පදිංචි එම්. ටිල්වින් සිල්වා වන මා විසින් අංක 70 මිෂන් පාර, පිටකෝට්ටේ පිහිටි ආර්. සී. ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්හි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.